# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

පහළොස්වන කලාපය – 2025 දෙසැම්බර්

ISSN 1800-1459
eISSN 2673-1177

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
## පහළොස්වන කලාපය - 2025 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

පහළොස්වන  කලාපය 2025 දෙසැම්බර්

ISSN 1800-1459

eISSN 2673-1177

ප්‍රථම මුද්‍රණය: 2025 දෙසැම්බර්

**ප්‍රධාන සංස්කාරක** : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. ඒ. ආර්. පී. මධුවන්ති

**<u>සියලු ම විමසීම්</u>**

සංස්කාරක

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තැ.පෙ. 02

බෙලිහුල්ඔය

දුරකථන/ෆැක්ස් - 045 22 80013

විද්‍යුත් තැපෑල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම : යූ. ඒ. පී. කේ. රූපසිංහ

සම්බන්ධීකරණය සහ සංස්කරණ සහයක : කේ. එස්. තිෂානි

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බෙලිහුල්ඔය

## සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
# පහළොස්වන කලාපය - 2025 දෙසැම්බර්


**ප්‍රධාන සංස්කාරක** : ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය ආර්. ඒ. ආර්. පී. මධුවන්ති

**සංස්කාරක මණ්ඩලය**

මහාචාර්ය මනෝජ් ආරියරත්න

ආචාර්ය ජී. කේ. චම්පා එස්. ද සිල්වා

ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය ඩබ්ලිව්. එම්. සෙව්වන්දි

කථිකාචාර්ය ජේ. ඒ. එම්. හංසනී

සිංහල භාෂා සංස්කාරක : තේජා නානායක්කාර

ඉමාෂා ධර්මසේන

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : කථිකාචාර්ය ජේ. ඒ. එම්. හංසනී

## සංස්කාරක සටහන

සමස්ත ශ්‍රී ලාංකේය ශාස්ත්‍රලෝලීන්ගේ ශාස්ත්‍රීය දැනුම සහ ඥාන ගවේෂණය සන්තර්පණය කිරීමෙහි අරමුණින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි පහළොස්වන කලාපය විද්වත් ඔබ සැම වෙත සමර්පණය කිරීමට ලැබීම ඉමහත් ගෞරවයක් ලෙස සලකමි. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශනය කරනු ලබන මෙම ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී, මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා යන දැනුම් ක්ෂේත්‍ර ද්විත්වය ම සංතෘප්ත කරනු ලබන, ගුණාත්මක බවින් යුතු විමර්ශිත සඟරාවකි.

වසර කිහිපයක ඇවෑමෙන් යළිදු වතාවක් මෙම ශාස්ත්‍රීය සංග්‍රහය විද්වත් ඔබ සැමට පිරිනැමීමෙහි ලා වූ ගමන් මග, සැබැවින් ම සුවපහසු කාර්යයක් නොවූ බව මෙහි ලා සිහිපත් කළ යුතු ම ය. එකිනෙකට වෙනස් වූ විෂය ක්ෂේත්‍රයන් රැසක් නියෝජනය කරමින්, පරිපූර්ණ විමර්ශනයකින් පසු ඔබ අතට පත්වන මෙම සඟරාව, දුෂ්කර පරිශ්‍රමයක අග්‍රගණ්‍ය ප්‍රතිඵලයකි.

සිංහල භාෂාවෙන් පර්යේෂණ පත්‍රිකාවක් සම්පාදනය කිරීම වූ කලී පහසු කටයුත්තක් නොවේ. එහෙයින් ප්‍රථම ව, ස්වකීය පර්යේෂණ පත්‍රිකා අප වෙත යොමු කරමින් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයේ පහළොස්වන කලාපය යථාර්ථයක් කිරීමට සහය දුන් හිතෛෂී ඥාන ගවේෂක විද්‍යාර්ථීන්හට මාගේ හදපිරි ස්තුතිය පිරිනමන්නෙමි.

එමෙන් ම, මෙම සඟරාව සම්පාදනයෙහි ලා අවැසි සියලු මූලික ප්‍රතිපාදන සපයාදුන්, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරන්දර මහාචාර්ය සුනිල් ශාන්ත මැතිතුමන් මෙහි ලා විශේෂයෙන් සිහිපත් කොට සිටිමි. එමෙන් ම, අප විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ දැනුම බෙදාහැරීමේ මධ්‍යස්ථානයේ වත්මන් අධ්‍යක්ෂක, මහාචාර්ය ඒ. පී. එන්. උදයකුමාර මැතිතුමන්ට ද, හිටපු අධ්‍යක්ෂක මහාචාර්ය රංගන ශාලික මැතිතුමන්ට ද මෙහි ලා විශේෂ ස්තුතියක් පුද කළ යුතු ම ය.

ශාස්ත්‍රීය සඟරාවේ සම්බන්ධීකරණ කටයුතු අනලස් ව සිදුකරමින් සහය වූ ශෂිකා මහත්මිය ද, පරිගණක පිටු සැකසුම සහ නිර්මාණකරණයෙන් දායකත්වය සැපයූ යූ. ඒ. පී. කේ. රූපසිංහ මහත්මිය ද ඔවුනොවුන්ගේ නොමසුරු දායකත්වයන් උදෙසා මෙහි දී අගය කළ යුතු ම ය.

සඟරාවේ අන්තර්ගත ඉංග්‍රීසි බසින් රචිත සාරසංක්ෂේප මනා ලෙස සංස්කරණය කර දෙමින් සිය වටිනා කාලය නොමසුරු ව ඒ වෙනුවෙන් වැය කළ, අප විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ, භාෂා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය මධූකා හංසනී මහත්මිය ද මෙහි ලා ගෞරවයෙන් සිහිපත් කර සිටිමි. එසේ ම මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා සෝදුපත් පරීක්ෂාවෙන් දායකත්වය සැපයූ සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ, භාෂා අධ්‍යයනාංශයේ තේජා නානායක්කාර මහත්මියට ද ඉමාෂා ධර්මසේන මෙනවියට ද අපගේ ප්‍රශංසාව හිමි වෙයි.

සක්‍රීය විද්වත් සඟරාවක් ලෙසින් ශාස්ත්‍රලෝලී ඔබ වෙත පිදෙන්නා වූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලාංකේය ඥාන ගවේෂක පරපුරක නව දැනුම උත්පාදනයෙහි ලා උපස්තම්භක වන බව අපගේ විශ්වාසය යි.

**ආර් ඒ ආර් පී මධුවන්ති**
**ප්‍රධාන සංස්කාරක**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය**

# ලිපි සම්පාදකයෝ


**වෙලම්පැලේ රතනසාර හිමි**
සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

**කේ. එච්. පී. ටී. දිල්ශානි[1] සහ ප්‍රදීප් උළුවඩුගේ[2]**
ස්වාධීන පර්යේෂක, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[1]
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[2]

**ආර්. කේ. එම්. ට්‍රිලීෂියා ඉන්ද්‍රාණි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**නිල්මිණි දයානන්ද**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**ජේ. එම්. මධුෂානි[1] සහ ජී. සී. එල්. පතිරණ[2]**
ස්වාධීන පර්යේෂක, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[1]
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[2]

# පටුන


| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| 1. | ආනාපානසති භාවනා ක්‍රමවේදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්<br>**වෙලම්පැලේ රතනසාර හිමි** | 1-5 |
| 2. | පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝගඃ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්<br>**කේ. එච්. පී. ටී. දිල්ශානි සහ ප්‍රදීප් උළුවඩුගේ** | 6-21 |
| 3. | අනුරාධපුර රාජ්‍ය අවධියේ මෙරට ආර්ථිකය හා බැඳි නෛතික විධිවිධාන සහ ඒවායේ තිරසාර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්<br>**ආර්. කේ. එම්. ප්‍රිලීෂියා ඉන්ද්‍රාණි** | 22-29 |
| 4. | බුත්සරණේ වාක්‍ය විචාරාත්මක ලක්ෂණ<br>**නිල්මිණි දයානන්ද** | 30-38 |
| 5. | ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයෙහි වීදි මට්ටමේ නිලබලකරුවන්ගේ පරිපාලන ශක්‍යතාව හා අභිමතානුසාරී බලය : බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්<br>**ජේ. එම්. මධුෂානි සහ ජී. සී. එල්. පතිරණ** | 39-59 |

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පහළොස්වන කලාපය 2025 දෙසැම්බර්
පිටු 1-5
ISSN 1800-1459 eISSN 2386-2041
© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ආනාපානසති භාවනා ක්‍රමවේදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## (An Investigative Study on the method of Ānāpānasati Meditation)

වෙලම්පැලේ රතනසාර
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය
wrthero.wr1996@gmail.com

## Abstract

*Ānāpānasati* meditation is a meditative system that teaches one to maintain awareness of the breath. It is one of the ten recollections (*anussati*) in tranquility meditation (*samatha*) in the *Visuddhimagga*. The practice of breath meditation dates back to the pre-Buddhist era. However, the Buddha has taught how to develop breath meditation from tranquility (*samatha*) to spiritual insight (*vipassanā*), ultimately leading to the realisation of *Nibbāna*. Therefore, the inhalation and exhalation meditation holds a special place among other meditative practices. This meditation is remarkable for its potential to develop five kinds of higher knowledge (*pañca abhiññā*), eight types of attainments (*aṭṭhasamāpatti*). It has also gained the attention of psychotherapists as a method for treating mental stress, which is widespread in the modern world. Not only is this meditation unique in its effects, but it is also distinctive in the methods of its cultivation. The aim of this article is to study the methods of *Ānāpānasati* meditation as presented in the Suttas. The primary discourses that teach *Ānāpānasati* meditation are examined in this study.

**Key words**: *Ānāpānasati, Discourses, Insight, Meditation, Tranquility.*

## සාරසංක්ෂේපය

ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලිය දෙස අවධානය යොමු කිරීමෙන් සිහිය පිහිටුවා ගැනීමට ආනාපානසති භාවනාව මග පෙන්වයි. සමථ භාවනාවේ විසුද්ධි මාර්ගයේ සඳහන් සමසතළිස් කර්මස්ථානයන්ගේ දස අනුස්සති අංශය මෙම ආනාපානසතිය නියෝජනය කෙරේ. ආශ්වාස-ප්‍රශ්වාසය කෙරෙහි අවධානය යොමු කරමින් භාවනා වැඩීමේ ඉතිහාසය ප්‍රාග් බෞද්ධ යුගය දක්වා දිවෙන අතර බුදුරදුන් ආනාපානසති ක්‍රමවේදය මගින් සමථය හා විපස්සනා යන ක්‍රමවේද ද්විත්වය ම වර්ධනය කරන ආකාරය පැහැදිලි කර තිබේ. ආනාපානසතිය විපස්සනා ක්‍රමවේදයෙන් වර්ධනය කර නිර්වාණ සාක්ෂාත්කරණය සිදු කර ගත හැකි ය. එබැවින් ආනාපානසති භාවනාව අනෙකුත් භාවනා ක්‍රමවේද අතර සුවිශේෂ වේ. ආනාපානසතිය සමථ භාවනාවක් ලෙස වැඩීමෙන් සමථ භාවනාවෙන් උපදවා ගනු ලබන පඤ්චාභිඥා හා අෂ්ට සමාපත්ති උපදවා ගත හැකි අතර නූතනයේ මනෝචිකිත්සකයින් මෙම භාවනා ක්‍රමවේදය ආතතිය දුරු කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් ද භාවිත කෙරේ. මෙම භාවනාව මගින් ලද හැකි ප්‍රතිඵල පමණක් නොව එය වර්ධනය කිරීමේ ක්‍රමවේදය ද එයට ම ආවේණික වූවකි. මේ අනුව මෙම පර්යේෂණ ලිපියේ අරමුණ වන්නේ ආනාපානසති භාවනා ක්‍රමවේදය පාලි ත්‍රිපිටකාගත සූත්‍රානුසාරයෙන් අධ්‍යයනය කිරීම යි. එබැවින් මෙහි දී ආනාපානසතිය පිළිබඳ සඳහන් වන මූලික සූත්‍ර දේශනා විමර්ශනය කෙරේ.

**කේන්ද්‍රීය වචනඃ** *ආනාපානසති, භාවනාව, විපස්සනා, සමථ, සූත්‍ර.*

## හැඳින්වීම

භාවනාව යන්නෙහි සැබෑ තේරුම සිත වැඩීම හා පඤ්ච නීවරණයන් බැහැර කරමින් ඒකාග්‍රතාව ඇති කිරීම, ස්මෘතිය, විවේචන ශක්තිය, ශ්‍රද්ධාව, ශාන්තිය ආදී උසස් ගුණයන් දියුණු කර සියල්ල තතු පරිද්දෙන් උතුම් ප්‍රඥාව ලබා දී පරම සත්‍යය හෙවත් නිර්වාණය අරමුණු කර ඇති බව භාවනාව ලෙස අර්ථ දැක්වීම සාධාරණ වේ (රාහුල, 1989:99). අනිත්‍යාදිය මෙනෙහි කිරීමත්, රාග ද්වේෂාදිය මර්දනය කරන සිතිවිලි සිතීමත් භාවනාව යන්නෙන් ගම්‍ය වන අදහස යි (බුද්ධදත්ත, 1960:370). ඒ අනුව, යම් අරමුණක් නිරන්තර ප්‍රගුණ කිරීම (*ආසේවිතාය*), වැඩීම (*භාවිතාය*), බහුල වශයෙන් වැඩීම (*බහුලීකතාය*) භාවනාව වශයෙන් හැඳින්විය හැකිය. මේ අනුව භාවනාවේ කර්තව්‍ය වන්නේ බාහිරින් සිතට පැමිණෙන, සිත අපිරිසිදු කරන ආශ්‍රව ධර්මයන් ප්‍රහාණය කිරීම යි. ආශ්‍රව ප්‍රහාණය පිළිබඳ ප්‍රාමාණික අදහසක් *මජ්ඣිම නිකාය සබ්බාසව* සූත්‍රයෙහි ඇතුළත් වේ.

1. *දස්සනා පහාතබ්බා* (අවබෝධයෙන් ආසව දුරු කිරීම)
2. *සංවරා පහාතබ්බා* (ඉදුරන් සංවර කිරීමෙන් ආසව දුරු කිරීම)

3. *පටිසේවනා පහාතබ්බා* (පරිභෝජනයෙන් ආසව දුරු කිරීම)
4. *අධිවාසනා පහාතබ්බා* (ඉවසීමෙන් ආසව දුරු කිරීම)
5. *පරිවජ්ජනා පහාතබ්බා* (නුසුදුසු පුද්ගලයන් හා ස්ථාන ආදියෙන් වැළකීම මගින් ආසව දුරු කිරීම)
6. *විනෝදනා පහාතබ්බා* (කෙලෙස් සිතුවිලිවල ආදීනව දැක ආසව දුරු කිරීම)
7. *භාවනා පහාතබ්බා* (භාවනා ක්‍රමවේද මගින් ආසව දුරු කිරීම) (*මජ්ඣිම නිකාය* I, 2006:18-28)

මෙම ක්‍රමවේදයන්ට අනුව පැහැදිලි වන්නේ සියලු ආශ්‍රව දුරු කර ගැනීමට මෙම ක්‍රමවේද හත උපයෝගී වන බව යි (*මජ්ඣිම නිකාය* I, 2005:20). මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ සියලු ක්ලේශයන් දුරු කිරීමේ ශක්තියෙන් භාවනාව තොර වන බව හා භාවනාවෙන් දුරු කළ හැකි නිශ්චිත ක්ලේශ ප්‍රමාණයක් පවත්නා බව යි.

## පර්යේෂණ ගැටලුව

සිත දියුණු කිරීම සඳහා විවිධ අධ්‍යයනයන් සිදු කිරීම නූතනයේ පෙරඅපර දෙදිග තුළ ම විශේෂ අවධානයකින් සිදු වේ. තාක්‍ෂණික දියුණුව සමග පුද්ගල මනස ක්‍රියාත්මක වන ආකාරයට අනුව එය පුද්ගලයාට හානිදායක විය හැකි බැවින් සිත දියුණු කිරීමේ ක්‍රමවේද භාවිත කිරීමට සිදු වී ඇත. සිහියෙන් හුස්ම ආශ්වාස ප්‍රශ්වාස කිරීම මානසික ඒකාග්‍රතාව ඇති කිරීමට උපකාරී වන අතර එය බුදුදහමේ ආනාපානසතිය ලෙස ද දැක්වේ. තව ද භාවනා නිමිත්ත නිරන්තරයෙන් ආශ්‍රය කිරීමට පවත්නා ශක්‍යතාව ද ඉතා ඉහළ මට්ටමක පවතී. මේ අනුව ආනාපානසතිය වැඩීමේ නිවැරදි ක්‍රමවේදය මුල්බුදුසමයේ පැහැදිලි කෙරෙන ආකාරය කෙසේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණ

ආනාපානසති භාවනාවට අනුව සිත වර්ධනය කිරීමට මුල්බුදුසමයේ භාවිත ක්‍රමවේදය පිළිබඳ නිවැරදි ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ යි. එමගින් නූතන භාවිත සිත දියුණු කිරීමේ ක්‍රමවේද අතර ආනාපානසති හෙවත් සිහියෙන් ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ ක්‍රමවේදයෙහි ඇති භාවිතාත්මක අගය සමාජගත කිරීම වක්‍ර අරමුණකි.

## පර්යේෂණයේ වැදගත්කම

ආනාපානසති භාවනාව පිළිබඳ සිදු කළ විවරණ හා කෘති සුලභ වන නමුත් ඒවායේ මුල්බුදුසමයේ ආවේණිකත්වය අවධාරණය මැනවින් සිදු නො වේ. එබැවින් මුල්බුදුසමයාගත ක්‍රමවේද අධ්‍යයනය කිරීම නූතන යුගයේ පවත්නා අවශ්‍යතාවකි. එම අවශ්‍යතාව පූරණය කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කම වේ. එහි දී මෙම පර්යේෂණ ලිපිය මගින් සූත්‍ර පිටකයේ සූත්‍රවල ආනාපානසතිය සම්බන්ධයෙන් දක්වා ඇති විවරණය කෙරෙහි අවධානය යොමු වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මූලික වූවකි. එහි දී සංධාර විශ්ලේෂණ න්‍යාය යොදා ගනිමින් විෂයානුබද්ධ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය කෙරිණ.

## භාවනා ප්‍රභේද හා සමථ භාවනාව

*යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ ඡින්නෝපි රුක්ඛෝ පුනරෙව රූහති*

*ඒවම්පි තණ්හානුසයේ අනූහතේ නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං* (ධම්මපදපාළි, 2006:108)

යන ධම්මපදයේ තණ්හාවග්ග ගාථාවේ පැහැදිලි කිරීමට අනුව, සත්වයන් කෙලෙස් දුරු නො කළ නිසා සසර සැරි සරයි. කෙලෙස් දුරු කර ගැනීම උදෙසා භාවිත භාවනා ප්‍රධාන වශයෙන් ප්‍රභේද දෙකකින් යුතු වේ. ඒ ලෞකික අරමුණු මුදුන් පමුණුවා ගැනීමට භාවිත කළ හැකි ක්‍රමය වන සමථ භාවනා හා බුදුරදුන් යථාර්ථය පසක් කරමින් ක්ලේශ ප්‍රහාණය සඳහා හඳුන්වා දුන් විදර්ශනා භාවනාව යනුවෙනි. මෙම භාවනා ප්‍රභේදයන්ගේ වෙනස කෙලෙස් ප්‍රහීණ වන අයුරු විමසීමෙන් අවබෝධ කරගත හැකි වේ. එම කෙලෙස් ප්‍රහීණ වන ක්‍රම ත්‍රිත්වයක් බුදුදහමේ දැක් වේ.

- *තදංගපහාණ* - කුසල් වැඩීමේ දී අවස්ථානුකූල ව මොහොතකට කෙලෙස් යටපත් වීම
- *වික්ඛම්භනපහාණ* - ධ්‍යානයෙන් කෙලෙස් මැඩගෙන සිටීම
- *සමුච්ඡේදපහාණ* - මාර්ග ඵලාවබෝධය මගින් සහමුලින් කෙලෙස් දුරු කිරීම (ගල්මංගොඩ, 2006:55)

මෙම ක්‍රම ත්‍රිත්වයෙන්, සමථ භාවනාව මගින් සිදු කරනුයේ විෂ්කම්භන ප්‍රහාණය යි. තෙවැනි සමුච්ඡේද ප්‍රහාණය සිදු කිරීමට සමත් වනුයේ විදර්ශනා (විපස්සනා) භාවනා ක්‍රමය මගින් පමණි. සමථ භාවනාව බුද්ධ කාලයට පෙර සිට භාවිත වුවත් මේ විදර්ශනා භාවනාව බුදුදහමට අනන්‍ය වූවකි. සමථ භාවනාව, සමාධි භාවනාව සහ චිත්ත භාවනාව ලෙස ද හඳුන්වා ඇත. මෙහි කාර්යය නම් සිත එක් අරමුණක පිහිටුවීම යි. නිවන් මග අවුරන නීවරණ මථනය, සමථයෙන් සිදු කෙරේ. එම නීවරණ ධර්ම පහත පරිදි පිළිවෙළින් දැක්විය හැකි ය.

- *කාමච්ඡන්ද* (කම් සැපෙහි කැමැත්ත - *lustful Desires*)
- *ව්‍යාපාද* (තරහව - *Ill-will, hatred or anger*)
- *ථීන-මිද්ධ* (අලස බව හා නිදිබර ගතිය- *Torpor and languor*)
- *උද්දච්ච කුක්කුච්ච* (සිතෙහි නොසන්සුන්කම හා කළ වරද ගැන පසුතැවීම - *Restlessness and worry*)
- *විචිකිච්ඡා* (සැකය - *Sceptical Doubts*) (*මජ්ඣිම නිකාය* I, 2006:630. Rahula, 1959:74)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමථය, බුද්ධ කාලයට පෙර පටන් පැවති භාවනා ක්‍රමයකි. සත්‍යය හෙවත් නිර්වාණයත් සමග සමථ භාවනාවේ සම්බන්ධයක් ද නැත. නමුදු හුදු බෞද්ධ භාවනා ක්‍රමයක් නොවේයැයි බැහැර කිරීමක් ද සිදු නොකර එයින් සුවසේ විසීම (*දිට්ඨධම්ම සුඛවිහාර*), සැනසිල්ලේ විසීම (*සන්තවිහාර*) යන ගුණ මිස ඊට වැඩි දෙයක් ලැබිය නොහැකි නිසා පරම තත්ත්වය වූ නිවන අවබෝධයට විපස්සනා භාවනා ක්‍රමය බුදුදහම හඳුන්වා දෙන විශිෂ්ට ක්‍රමවේදය යි (රාහුල, 1989:100). සමථ භාවනාව සමසතළිස් කර්මස්ථානයන්ට කළ වර්ගීකරණයක් බුද්ධඝෝෂ හිමියන් ත්‍රිපිටකයට අටුවාවක් ලෙස කළ විශුද්ධි මාර්ගයේ දැක්වේ. එහි දස අනුස්සති කොටස යටතේ ආනාපානසතිය දක්වා තිබේ.

**ආනාපානසතිය**

*එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සෝකපරිද්දවානං සමතික්කමාය, දුක්ඛ දෝමනස්සානං අත්ථංගමාය, ඤාණස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරෝ සතිපට්ඨානා* (*දීඝ නිකාය* II, 2006:436, *මජ්ඣිම නිකාය* I, 2006:136) මෙලෙස භාවනාව පිළිබඳ සිදුකෙරෙන විග්‍රහයට අනුව, සතර සතිපට්ඨාන ධර්ම සත්වයාගේ විසුද්ධිය කායික මානසික දුක් දොම්නස් නිවාරණය පිණිස හේතුවන එක ම ධර්මය සතර සතිපට්ඨානය යි. *දීඝ නිකාය මහාසතිපට්ඨාන* හා *මජ්ඣිම නිකාය සතිපට්ඨාන* සූත්‍රවලට අනුව සිහිය වැඩීමේ ක්‍රම සතරකි.

- කායානුපස්සනා (*කායේ කායානුපස්සී විහරති ආතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලෝකෙ අභිජ්ඣාදොමනස්සං*)
- වේදනානුපස්සනා (*වේදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලෝකෙ අභිජ්ඣාදොමනස්සං*)
- චිත්තානුපස්සනා (*චිත්තේ චිත්තනුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලෝකෙ අභිජ්ඣාදොමනස්සං*)
- ධම්මානුපස්සනා (*ධම්මේසු ධම්මානුපස්සී විහරති ආතාපි සම්පජානො සතිමා විනෙය්‍ය ලෝකෙ අභිජ්ඣාදොමනස්සං*)

යනුවෙනි. මෙහි කායානුපස්සනා භාවනා ක්‍රමවේද අතර ප්‍රකට භාවනා ක්‍රමවේදය වන්නේ ආනාපානසතිය යි (*මජ්ඣිම නිකාය* I, 2006:136). කය මුල් කොට ඇති භාවනා ක්‍රමවේද අතර ආනාපානසතිය (Nyāṇatiloka, 1952:43) හෙවත් ආශ්වාස ප්‍රශ්වාස මුල් කොට පවතින මෙම භාවනාවට විශේෂත්වයක් හිමි වන අතර කය මුල් කොට පවත්නා භාවනා අතර ජනප්‍රිය හා ප්‍රායෝගික භාවනාවක් ලෙස ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ සිහිය පිහිටුවන ආනාපානසතිය පෙන්වා දී තිබේ. (රාහුල, 1989:100). ආන + ආපාන යන පද එකතුවෙන් ආනාපාන යන්න බිහි වී ඇත (සුමංගල, 1965:128). සති යන පාලි වචනයෙන් හැඟවන්නේ සිහිය පිළිබඳව යි. එනම් යෝනිසෝමනසිකාරය හෙවත් සිහි කල්පනාව යි. ඒ අනුව අනාපානසතිය යන්නෙන් ආශ්වාස, ප්‍රශ්වාසයන් පිළිබඳ පවත්නා සිහිය යන්න අර්ථ ගැන්වේ (සුමංගල, 1965:129).

ආශ්වාස ප්‍රශ්වාසයට අවධානය දෙමින් සිත යම් අරමුණක වැඩීමෙන් ඉන්ද්‍රිය ඥානය ඉක්මවා ගිය අතීන්ද්‍රිය ඥාන (ධ්‍යාන, සමාපත්ති, අභිඥා) ලැබිය හැකි බව බුද්ධ කාලයට පෙර සිටි ශ්‍රමණ සම්ප්‍රදායේ ප්‍රවීණයෝ ප්‍රතිඵල සහිත ව පසක් කර සිට ඇත. එපමණක් නොව, සිදුහත් බෝධිසත්වයන් ද ඉපිද කෙටි කලක් තුළ කිඹුල්වත් නුවර පැවති වප් මඟුල් දිනයේ දී ආනාපානසතිය වඩා ප්‍රථම ධ්‍යානයට සම වැද සිටි බව සඳහන් වේ (ආනන්දමෛත්‍රිය, 2005:18). එසේ ම ආනාපාන සතිය වැඩීමෙන් ලැබෙන ප්‍රතිඵල සේ දැක්වෙන පඤ්ච අභිඥා හා අෂ්ට සමාපත්ති ලාභීන් බුදුරදුන් ලොව පහළ වීමට පෙර සිටි බව ආලාර කාලාම, උද්දකරාම පුත්ත, අසිත තාපස වැනි ආචාර්යවරුන් ගැන සඳහන් තොරතුරු මගින් සනාථ වේ. ආනාපානසති භාවනාව බුදුදහම පහළ වීමට පෙර සිට යෝග දර්ශනයේ පවා බහුල ව භාවිත කර ඇත (පඤ්ඤාකිත්ති, 2005:18). බටහිර මනෝවිද්‍යාඥයන් ආතතිය දුරු කිරීමේ ක්‍රමවේදයක් ලෙස ද ආශ්වාස ප්‍රශ්වාස ක්‍රමය භාවිත කර යි. කෙසේ වුවත් වර්තමානය වන විට ලෝකයේ භාවනාව පිළිබඳ උනන්දු වන පුද්ගලයන් ආනාපානසතිය විවිධ ක්‍රම ඔස්සේ අධ්‍යයනය කිරීම, වැඩීම දක්නට ලැබේ. ආශ්වාස ප්‍රශ්වාස ගණනය කිරීම ඉන් එක් ක්‍රමයක් ලෙස පෙන්වා දිය හැක. මෙලොව ජීවිතයේ ඇතිවන ගැටලු, ප්‍රශ්න හා අසහන බොහෝමයක් විසඳා ගනිමින් ලෞකික අරමුණු මුදුන් පමුණුවා ගැනීමට ද හැකි වේ (ගල්මංගොඩ, 2006:77). ආනාපානසතිය නිවැරදි ව වැඩීම මගින් පඤ්ච අභිඥා, ඉද්ධිවිධ ඥානය, දිබ්බ සෝත ඥානය, පරචිත්ත විජානන ඥානය, පුබ්බේ නිවාසානුස්සති හා දිබ්බචක්ඛු ඥානය අභිඥාවන් උපදවා ගත හැකි බව දැක් වේ. තව ද අෂ්ට සමාපත්ති එනම්, ප්‍රථම ධ්‍යාන, ද්‍විතිය ධ්‍යාන, තතිය ධ්‍යාන හා චතුත්ථ ධ්‍යාන යන රූප ධ්‍යාන හතර හා ආකාසානඤ්චායතනය, විඤ්ඤානඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤානාසඤ්ඤායතනය යන අරූප සමාපත්ති හතර යන ලෞකික වූ අභිඥා හා ධ්‍යාන සමාපත්ති උපදවා ගත හැකි බව දැක්වේ (රාහුල, 1989:99).

බුදුරදුන් පූර්වාරාමයෙහි රැස් වූ භික්ෂූන් වහන්සේලාට නොයෙකුත් භාවනා ක්‍රමවේද පිළිබඳ දේශනා කරමින් එම ක්‍රමවේද අතර ආනාපානසතිය බහුල ව වැඩීම මහත්ඵල මහානිසංස ගෙන දෙන්නක් බව දේශනා කර ඇත. එසේ ම ආනාපානසතිය වැඩීමෙන් සතර සතිපට්ඨානය පූරණය වී එම සතිපට්ඨාන ධර්ම බහුල ව වැඩීමෙන් සත්ත බොජ්ඣංග ධර්ම පූරණය වන බවත් එමගින් විජ්ජා විමුත්තිය පූරණය වන බවත් *මජ්ඣිම නිකාය ආනාපානසති* සූත්‍රයේ පැහැදිලි කර තිබේ. (*මජ්ඣිම නිකාය* III, 2006:228). මෙම සූත්‍රයේ ද උක්ත ක්‍රමවේදය අන්තර්ගත වන අතර *මජ්ඣිම නිකාය කායගතාසති* සූත්‍රයේ ද කායගතාසති ක්‍රමවේදයේ මූලික පියවර වශයෙන් දැක්වෙන්නේ මෙම ආනාපානසති ක්‍රමවේදය යි (*මජ්ඣිම නිකාය* III, 2006:238). තව ද ආනන්ද හිමියන් රෝගාතුර ව සිටි ගිරිමානන්ද හිමියන්ට බුදුරදුන්ගේ නියමයෙන් දස සඤ්ඤා දේශනා කිරීමේ දී එක් සඤ්ඤාවක් ලෙස ආනාපානසතිය දේශනා කර තිබේ (*අංගුත්තර නිකාය* VI, 2005:18). එසේ ම සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට අයත්වන සප්ත බොජ්ඣංග ධර්ම ආනාපානසතිය වැඩීමෙන් වර්ධනය වන බවත්


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(*සංයුත්ත නිකාය* VI, 2005:18), බහුල ව වැඩීමෙන් (*බහුලීකතා*) මහත්ඵල මහානිසංස ලැබෙන බවත් දේශනා කර තිබේ (*සංයුත්ත නිකාය* V.II, 2005:90). නිවැරදි ව වඩන ලද ආනාපානසතිය මගින් ලබන සමාධිය බොහෝ කලක් පවතින බව ද දේශනාවේ සඳහන් වේ (*පාරාජිකාපාළි*, 2005:156). විශුද්ධි මාර්ගයේ දැක්වෙන රාග, ද්වේෂ, මෝහ, සද්ධා, බුද්ධි, විතක්ක යන සයාකාර චරිත වර්ගීකරණයට අනුව මෝහ හා විතක්ක චරිතයන්ට සුදුසු යැයි දක්වන භාවනා කමටහන වන්නේ ද ආනාපානසතිය යි (*විස්තරාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ගය*, 2011:157).

**නිවැරදි ඉරියව් සහ ක්‍රමවේදය**

භාවනා ප්‍රගුණ කිරීමේ දී හිඳීම (නිසීදන), සිටීම (ඨාන), සක්මන (චඞ්කමන), සැතපීම (සයන), (*ඛුද්දකනිකාය* VI, 2005:47) යන ඉරියව් යොදා ගැනීමට හැක. ආනාපානසති භාවනාවේ දී අරමුණ ලෙස තබාගන්නා ආශ්වාසය හා ප්‍රශ්වාසය ස්වභාවික ව ශරීරය ආශ්‍රය කර පවතින්නක් වන අතර එහි පවතින ස්වරූපය අනුව මෙයට වඩාත් හිඳීමේ ඉරියව් ව ගැළපෙන බව බොහෝ සූත්‍ර ධර්මයන් තුළ දක්වා තිබේ.

එම ඉගැන්වීමට අනුව භාවනා වැඩීමට සුදුසු ලෙස, *ඉධ භික්ඛවේ, භික්ඛු අරඤ්ඤගතෝ වා රුක්ඛමූලගතෝ වා සුඤ්ඤාගාරගතෝ වා නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා...* (ආරණ්‍ය, වෘක්ෂමූල සේනාසනයකට එළඹෙන භාවනානුයෝගියා පලක් බැඳ, කය ඇද නැති ව මනාව පිහිටුවාගෙන, අරමුණෙහි සිහිය එළවා හිඳියි ද...)

*සෝ සතෝව අස්සසති සතෝ පස්සසති* (සිහි ඇතිව ම ආශ්වාස කර යි. සිහි ඇතිව ම ප්‍රශ්වාස කර යි.)

1. *දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති. දීඝං වා පස්සසන්තෝ දීඝං පස්සසාමීති පජානාති* (දීර්ඝ කොට ආශ්වාස කරන්නේ දීර්ඝ කොට ආශ්වාස කරමි'යි දනි යි. දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ දීර්ඝ කොට ප්‍රශ්වාස කරමි'යි දනි යි.)
2. *රස්සං වා අස්සසන්තෝ රස්සං අස්සසාමීති පජානාති. රස්සං වා පස්සසන්තෝ රස්සං පස්සසාමීති පජානාති.* (කෙටි ව ආශ්වාස කරන විට කෙටි ව ආශ්වාස කරමි'යි දනි යි. කෙටි ව ප්‍රශ්වාස කරන විට කෙටි ව ප්‍රශ්වාස කරමි'යි දනි යි.)
3. *සබ්බකායපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති. සබ්බකාය පටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති.* (සියලු ආශ්වාස කය දැන ආශ්වාස කරමි'යි හික්මෙයි. සියලු ආශ්වාස කය දැන ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
4. *පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති.* (කාය සංස්කාරය හෙවත් ආශ්වාසය සංසිඳුවන්නෙමි, ආශ්වාස කරමි'යි හික්මෙයි. කාය සංස්කාරය හෙවත් ආශ්වාසය සංසිඳුවන්නෙමි, ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
5. *පීතිපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති. පීතිපටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති.* (ප්‍රීතිය විඳිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. ප්‍රීතිය විඳිමින් ප්‍රාශ්වාස කරමි'යි හික්මෙයි.)
6. *සුඛපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති. සුඛපටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති.* (සුවය විඳිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. සුවය විඳිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
7. *චිත්තසංඛාරපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තසංඛාරපටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති.* (චිත්ත සංඛාරය විඳිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. චිත්ත සංඛාරය විඳිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
8. *පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති. පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති.* (චිත්ත සංඛාරය සංසිඳුවමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. චිත්ත සංඛාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
9. *චිත්තපටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති. චිත්තපටිසංවේදී පස්සසිස්සාමීති සික්ඛති.* (සිත විඳිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. සිත විඳිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
10. *අභිප්පමෝදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. අභිප්පමෝදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.* (සිත ප්‍රමෝද කරමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. සිත ප්‍රමෝද කරමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
11. *සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.* (සිත සමාදාන කරමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. සිත සමාදාන කරමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
12. *විමෝචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති. විමෝචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති.* (සිත මුදවමින් (විමුඤ්චන කරමින්) ආශ්වාස කරමි'යි හික්මෙයි. සිත මුදවමින් (විමුඤ්චන කරමින්) ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
13. *අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.* (අනිත්‍ය නුවණින් දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. අනිත්‍ය නුවණින් දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
14. *විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.* (විරාගය නුවණින් දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. විරාගය නුවණින් දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
15. *නිරෝධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. නිරෝධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.* (නිරෝධය නුවණින් දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. නිරෝධය නුවණින් දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි.)
16. *පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති. පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති.* (පටිනිස්සජ්ජනය නුවණින් දකිමින් ආශ්වාස කරමි'යි හික්මෙයි. පටිනිස්සජ්ජනය නුවණින් දකිමින් ප්‍රශ්වාස කරමි'යි හික්මෙයි. (*මජ්ඣිම නිකාය* II, 2005:228-231)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉහත තොරතුරු ගිරිමානන්ද සූත්‍රය ආශ්‍රය කර ගනිමින් දක්වන ලදි (*අංගුත්තරනිකාය* VI, 2005:200-203). කෙසේ වුව ද වත්මන් සමාජය තුළ ආනාපානසතිය භාවනා නාමයෙන් අතිශයින් ප්‍රකට ව පවතී. එනමුදු එය වැඩීම පිළිබඳ වූ නිසියාකාර ක්‍රමවේද පිළිබඳ නිවැරදි අවබෝධයක් පුද්ගලයෝ සතු ද යන්න ප්‍රශ්නාර්ථයකි. එසේ වීමට හේතුව ලෙස දැක්විය හැකි වන්නේ පුද්ගල අරමුණු සඵල කර ගැනීම උදෙසා පමණක් මෙය භාවිත කිරීමට යොමු වීම යි. නිදසුනක් ලෙස, ආනාපානසතිය නාමය යොදාගනිමින් ගණිත ක්‍රමයක් අනුව සිත වැඩීමට පාසල් දරුවන් යොමු කරවීම දැක්විය හැකි ය. ඔවුන් තුළ ඒ සඳහා ඇල්මක් ඇති කිරීමට එය වැඩීමේ ප්‍රතිඵල ලෙස දක්වා ඇත්තේ මතක ශක්තිය වර්ධනය වනවා යන්න යි. මෙය සැබෑ කරුණක් විය හැකි ය. නමුදු එලෙස භාවිත කිරීමට උනන්දු කරවීමෙන් ලෞකික හා ලෝකෝත්තර වශයෙන් ලැබිය හැකි ප්‍රතිඵල නෙලා ගැනීමට කිසිවකුත් උත්සාහ නොගෙන සිටීමේ තත්වයක් වත්මනෙහි උද්ගත ව ඇත. තව ද භාවනා මධ්‍යස්ථාන ආශ්‍රයෙන් ද ආනාපානසතිය පුහුණු කරවීමට නොයෙක් ආකාරයේ ක්‍රමවේද අනුගමනය කිරීමක් සිදු වේ. එම ක්‍රමවේදවල ස්වභාවය බුද්ධභාෂිත මගින් දැක්වෙන ආනාපානසතිය හා සාපේක්ෂ වන්නේ ද යන්න විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණකි.

## නිගමනය

ඉහත විමර්ශන තොරතුරුවලට අනුව ආනාපානසතිය, චිත්ත ඒකාග්‍රතාව වර්ධනය කරනු ලබන සමථ භාවනා කොටසට අයත් වුවකි. ආනාපානසතිය, විදර්ශනා භාවනාව දක්වා ආශ්වාස ප්‍රශ්වාස අරමුණ අනිත්‍ය, විරාගය, නිරෝධා දී වශයෙන් ද අවසන පටිනිස්සග්ගානුපස්සී (කෙලෙසුන්ගෙන් මිදීම නැවත නැවත දකිමින්) ලෙස බහුල ව වැඩීමෙන් ආශ්‍රවයන් ක්ෂය කර නිර්වාණාවබෝධය සිදු කර ගත හැකිය. එහි දී සිදුවන්නේ ආශ්වාස ප්‍රශ්වාස අරමුණ ත්‍රිලක්ෂණයට නගා බවුන් වැඩීම යි. අරමුණ ඒකාකාරී ලෙසින් නොපවතින නිසා එය සිදු කිරීම අපහසු කටයුත්තක් ද නොවේ. බුදුරදුන් අවබෝධය ලැබීමට ආනාපානසතිය යොදාගත් බව සඳහන් වේ. නමුත් වත්මනෙහි ආනාපානසතිය බුදුරදුන් පෙන්වා දුන් අරමුණු සඳහා ගමන් කිරීමට නොව තම ලෞකික සිතුම් පැතුම් ඉටු කර ගැනීමට භාවිත කරන බව පෙනී යන කරුණක් වේ. එමෙන් ම බෞද්ධ භාවනා මධ්‍යස්ථාන මගින් ආනාපානසතිය ලෙස උනන්දු කරවන භාවනා ක්‍රමවේදය බුදුරදුන් දැක්වූ මෙම ක්‍රමවේදය හා කෙතරම් ගැළපේද'යි යන්න තවදුරටත් විමර්ශනය කළ යුතු වේ.

## පරිශීලිත මූලාශ්‍රය

### ප්‍රාථමික මූලාශ්‍ර


අංගුත්තර නිකාය VI. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ධම්මපදපාළි. (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීඝ නිකාය II. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පාරාජිකාපාළි. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය I. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය III. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විස්තරාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ගය. (2011) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සංයුත්ත නිකාය V. (2005). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.


### ද්විතීයික මූලාශ්‍ර


ආනන්ද මෛත්‍රිය හිමි. බී. (2005). *සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය*. කොළඹ 10: සමයවර්ධන.

පඤ්ඤාකිත්ති හිමි, එච්. (2001). *බෞද්ධ දර්ශනය හා ෂඩ් දර්ශන තුලනාත්මක අධ්‍යයනයක්*. කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල හිමි, ඩබ්. (1989). *බුදුන් වදාළ ධර්මය*. කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම,

ගල්මංගොඩ, එස්. (2006). *බෞද්ධ භාවනා ක්‍රම සහ මනෝචිකිත්සාව*. දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

Rahula, W. (1959). *What the Buddha Taught*. London: The Gordon Fraser Gallery Ltd.


### ශබ්දකෝෂ


බුද්ධදත්ත හිමි, පී. (1960). පාලි සිංහල ආකාරාදිය. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

සුමංගල හිමි, එම්. (1965). පාලි සිංහල ශබ්ද කෝෂය. කතෘ ප්‍රකාශන.

Nyanatiloka, B. (1952). *Buddhist Dictionary*. Kandy: Buddhist Publication Society.



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පහළොස්වන කලාපය 2025 දෙසැම්බර්
පිටු 6-21
ISSN 1800-1459 eISSN 2386-2041
© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝගඃ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

# (The Challenges Faced by Sri Lankan Tourism Industry in the Context of Post-Covid 19: With Special Reference to *Ella* Divisional Secretariat Division)

කේ. එච්. පී. ටී. දිල්ශානි[1] සහ ප්‍රදීප් උළුවඩුගේ[2]

[12]සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
**tharushapathirana97@gmail.com**
**pradeep@ssl.sab.ac.lk**

## Abstract

The tourism industry contributes significantly to the national economy of Sri Lanka. Moreover, since ancient times, Sri Lanka has been a tourist destination offering great experiences with its natural beauty and cultural heritage. However, in the context of covid 19, Sri Lanka's tourism industry has been severely affected and continued to face many challenges. Therefore, this study aimed to identify the challenges faced by Sri Lankan tourism industry in the context of post-covid 19. The study was conducted based on the mixed method approach. Primary data were collected through semi- structured questionnaires and interviews. Secondary data were collected from books, research reports, official reports, journal articles, newspapers and websites The sample size consisted of 110 respondents. Statistical Package for Social Sciences (SPSS) was used to analyse the quantitative data and thematic analysis and context analysis were used to analyse the qualitative data. The study has found that micro, small and medium scale businesses have been particularly affected due to the current collapse of the tourism industry. The study provided a number of strategic solutions to protect and promote the challenged tourism industry. Developing infrastructure in tourist attractions, improving the quality of services, conducting training and development programmes for the personnel involved in the tourism sector are some of them. The conclusion of the research was that, the tourism industry in many countries has recovered and reached an advanced level in the post-Covid 19 era. However, such advancement cannot be witnessed in Sri Lankan tourism industry. Therefore, Sri Lanka's tourism industry, which is challenged, should be promoted and for that, the coordination between the public sector and the private sector is essential.

**Keywords:** Ella, National Economy, Post-Covid 19, Tourist Attraction, Tourism Industry

## සාරසංක්ෂේපය

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයයි. අතීතයේ සිට ම ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යය සහ සංස්කෘතික උරුමයන් සමඟ විශිෂ්ට අත්දැකීම් ලබා දෙන සංචාරක ගමනාන්තයකි. නමුත්, කොවිඩ් 19 සන්දර්භය තුළ, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රබල ලෙස අභියෝගයට ලක් වූ අතර, පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළත් අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී. එබැවින්, මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වනුයේ පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීමයි. මෙම අධ්‍යයනය "මිශ්‍ර ක්‍රමවේදය" මත පදනම් ව විය. ප්‍රාථමික දත්ත ව්‍යුහගත ප්‍රශ්නාවලියක් සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරන ලදී. ද්විතීයික දත්ත පොත්, පර්යේෂණ වාර්තා, නිල වාර්තා, සඟරා ලිපි, පුවත්පත්, වෙබ් අඩවි ආදියෙන් එකතු කරන ලදී. නියැදි ප්‍රමාණය ප්‍රතිචාර දැක්වූවන් 110 කින් සමන්විත විය. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා SPSS මෘදුකාංගය භාවිත කරන ලද අතර, ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා තේමා විශ්ලේෂණය සහ සන්දර්භ විශ්ලේෂණය භාවිත කරන ලදී. වර්තමානය වන විට, සංචාරක කර්මාන්තය බිඳ වැටීම හේතුවෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශේෂයෙන් පීඩාවට පත්ව ඇති බව අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම විය. තවද, අභියෝගයට ලක් වූ සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අධ්‍යයනයෙන් උපාය මාර්ගික විසඳුම් රැසක් ලබා දී ඇත. සංචාරක ආකර්ෂණීය ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා පුහුණු හා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම ඉන් කිහිපයකි. පර්යේෂණයේ අවසාන නිගමනය වූයේ, පශ්චාත් කොවිඩ් 19 (Covid

19) සන්දර්භය තුළ බොහෝ රටවල සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් වී ඇත. නමුත්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ එවැනි ප්‍රවර්ධනයක් දැකිය නොහැක. එබැවින් අභියෝගයට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතු අතර, ඒ සඳහා රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය අතර සම්බන්ධීකරණය නිතැතින් ම අත්‍යවශ්‍ය වනු ඇත.

**කේන්ද්‍රීය වචනඃ** ඇල්ල, ජාතික ආර්ථිකය, පශ්චාත් කොවිඩ් 19, සංචාරක ආකර්ෂණය, සංචාරක කර්මාන්තය

## හැඳින්වීම

සංචාරක කර්මාන්තය යනු ලොව පවත්නා විශාලතම කර්මාන්ත අතරින් එකක් වන අතර, විභවතාව අතින් ලොව පවත්නා විශාලතම කර්මාන්තය යි (මල්කාන්ති, 2020). මෙය වැඩි ම ආදායමක් උපයන කර්මාන්තයක් වන අතර, බොහෝ රටවල මූල්‍ය කේන්ද්‍රය ලෙස සැලකේ. එබැවින් ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින කවර රටක වුව ද, සංචාරක කර්මාන්තය තම ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගනු ලබන්නේ, එමගින් රටකට ලබාගත හැකි ප්‍රතිලාභයන් පිළිබඳ ව සැලකිල්ලට ගනිමිනි. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකය සංචාරක කර්මාන්තය මත රඳා පවතී (විජේසුන්දර, 2020). ඒ අනුව, ආර්ථිකය, කර්මාන්ත, සංස්කෘතිය, ජනතාව, සමාජය හා පරිසරය වැනි රටක විවිධ අංශවලට සංචාරක කර්මාන්තය බොහෝ ප්‍රතිලාභ ලබා දෙනු ඇත. තවද, මෙය සෘජු හා වක්‍ර දේශීය රැකියා උත්පාදනය කරමින් සෘජු විදේශ ආයෝජන සඳහා අවස්ථා නිර්මාණය කර යි. එමනිසා සංචාරක කර්මාන්තය මිලියන ගණනක ජීවනාලිය වේ. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සංචාරක කර්මාන්තය සිය ආර්ථිකයට එක් කර ගැනීමට පෙළඹීමක් දක්නට ඇති අතර, ඒ සඳහා හේතු සාධක වී ඇත්තේ සංචාරක කර්මාන්තය හා බද්ධ වී ඇති ප්‍රතිලාභ පැකේජය යි. ඒ අතරින් ලෝකයේ විශාල සංචාරක ආකර්ෂණයක් දිනාගෙන ඇති, සංචාරක කර්මාන්තය මත රඳා පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව සුවිශේෂ වන්නේ ය. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇති දූපතකි. එහි භූගෝලීය පිහිටීම නිසා සංචාරක ගමනාන්තයක් ලෙස හඳුන්වනු ලබයි. ශ්‍රී ලංකාව අතීතයේ සිට ම ප්‍රධාන සංචාරක ගමනාන්තයක් වූ අතර, ප්‍රේෂණ සහ රෙදිපිළි හා ඇඟලුම්වලින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ අපනයන උපයන තුන්වන විශාලතම ස්ථානය හිමි කර ගන්නේ සංචාරක කර්මාන්තය යි (මල්කාන්ති, 2020: 23). ඒ අනුව, සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවට උපාය මාර්ගික වශයෙන් වැදගත් කර්මාන්තයක් වන අතර, ජාතික ආර්ථිකය සඳහා විශාලතම අපනයන ආදායමක් ලෙස දායක වේ.

මෙලෙස ජාතික මෙන් ම ජාත්‍යන්තර ආර්ථිකය සඳහා විශාලතම අපනයන ආදායමක් සපයන කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය හඳුනාගත හැකි වේ. කෙසේ නමුත්, අනපේක්ෂිත කෝවිඩ් 19 හෙවත් කොරෝනා වසංගතය 2019 නොවැම්බර් මාසයේ චීනයේ වුහාන් නගරයෙන් ආරම්භ වී, 2020 මාර්තු වන විට ලොව පුරා ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත විය. මෙම වසංගතය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ සෑම රටක ම සියලු ම අංශ කෙරෙහි දැඩි සෘණාත්මක බලපෑමක් ඇති කළේ ය. එහිදී සංචාරක කර්මාන්තය කෝවිඩ් 19 වසංගතයෙන් වඩාත් ම පීඩාවට පත් වූ එක් අංශයක් වන අතර, එය සෑම රටක ම ආර්ථිකයට, ජීවනෝපායන්ට, පොදු සේවා හා අවස්ථා කෙරෙහි බලපායි. ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ කොරෝනා වෛරසය පාලනය කිරීම සඳහා ජනතාව හුදෙකලා කරමින් නිවෙස්වලට සීමා කිරීම බොහෝ රටවල් විසින් පියවර ගැනිණ. ඊට අමතර ව, ගුවන් තොටුපළ වසා දැමීම, ගුවන් ගමන් සීමා කිරීම, වෛරස ව්‍යාප්තිය වැඩි රටවලට ගුවන් ගමන් අවලංගු කිරීම යනාදිය නිසා රටවල් අතර ගමනාගමනය සීමා විය. ඒ අනුව, තාක්ෂණයෙන් හා විද්‍යාවෙන් ඉදිරියට යමින් විශ්ව ගම්මානයක් බවට පත් ව තිබූ ලෝකය වෛරසයේ ප්‍රබල බලපෑමට නතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය වශයෙන් විශාල අභියෝගයකට ලක් වූ කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය හැඳින්විය හැකි අතර, ගෝලීය වශයෙන් වෛරසය ව්‍යාප්ත වීම හා එය පාලනය කිරීම සඳහා යොදාගනු ලැබූ විවිධ පියවර හේතුවෙන් ලොව පුරා සංචාරක කර්මාන්තය බිඳ වැටුණි.

පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විශාල අභියෝගයකට ලක් ව ඇති ආකාරයක් හඳුනාගත හැකි ය. එමෙන් ම ලෝකයේ බොහෝ රටවල් සිය රටෙහි සංචාරක කර්මාන්තය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනාගෙන එම ස්ථාන ආකර්ෂණීය සංචාරක ගමනාන්ත ලෙස දියුණු කිරීමට දැඩි පරිශ්‍රමයක් දරනු ඇත. ඒ අනුව, ඇල්ල නගරය ශ්‍රී ලංකාවේ එසේ ආකර්ෂණීය වූ සංචාරක ගමනාන්තක් ලෙස හඳුනාගත හැකි ය. එම නගරය ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙමින් පවතින සංචාරක පුරවරයක් ලෙස හැඳින්විය හැකි අතර, එයට ප්‍රධානතම හේතුව වනුයේ ඇල්ල ප්‍රදේශය ආශ්‍රිත ව පවතින සෞන්දර්යාත්මක පරිසරය හා පාරිසරික දර්ශනීය ස්ථානයන් ය. නමුත්, පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය සැලකිය යුතු මට්ටමකින් බිඳ වැටී ඇති අතර, එම ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් අභියෝග රැසකට මුහුණ දෙමින් සිටිති. ඒ අනුව, පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග ඇසුරින් සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මූලික කරගෙන ඇත. අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග සාකච්ඡා කිරීම යි. එහි දී, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය අභියෝගයට ලක්වීමට බලපෑ හේතු සාධක මොනවාද? සහ බිඳ වැටීමට ලක් ව ඇති සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි කෙටි කාලීන හා දිගු කාලීන උපායමාර්ගයන් මොනවාද? යන්න පිළිබඳ ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනය තුළ සාකච්ඡා කරනු ලබයි.

## සාහිත්‍ය විමර්ශනය

Samarathunga (2020) “Post-Covid 19 Challenges and Way Forword for Sri Lanka Tourism” නැමැති අධ්‍යයනය මගින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කොවිඩ් 19 බලපෑම තක්සේරු කිරීමට හා සංචාරක ප්‍රතිසාධක ක්‍රියාවලිය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇත. ඔහු විසින් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට ඇති බලපෑම ඇගයීම සඳහා වැදගත් අංශ තුනක් අධ්‍යයනය තුළ සලකා බලා ඇත. මූලාශ්‍ර වෙළඳ පොළ මත බලපෑම, සංචාරක සම්පත් කෙරෙහි බලපෑම, සංචාරක තහනම, ගුවන් ගමන් අත්හිටුවීම හා ඇඳිරි නීති රෙගුලාසි යනාදිය එම ත්‍රිත්වය යි. ඔහු ඒවා නම් කර ඇත්තේ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට කොවිඩ් 19 අභියෝග ලෙස යි. තවද, ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා කෙටි කාලීන උපාය මාර්ග ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යයනයේ පරමාර්ථය වී ඇත්තේ පශ්චාත් කොවිඩ් 19 අභියෝග හා අවස්ථා පිළිබඳ සංචාරක පාර්ශවයන්ට පැහැදිලි කිරීම යි.

Arachchi සහ Gnanapala (2020) “Impact of COVID 19 and the Future of Tourism Employments in Sri Lanka: A Route to Recovery and Resilience” නැමැති අධ්‍යයන ලිපියේ මූලික පරමාර්ථය වන්නේ, ශ්‍රී ලංකාවේ සංචාරක හා සත්කාරක ක්ෂේත්‍රයේ සේවකයින්ට කොවිඩ් වසංගතයේ බලපෑම හඳුනා ගැනීම හා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සේවකයින් මුහුණ දෙන අනාගත අභියෝග හඳුනා ගැනීම යි. ගෝලීය හා දේශීය සන්දර්භය තුළ සංචාරක කර්මාන්තයේ බිඳ වැටීම, සංචාරක හා සංචාරක අංශයේ රැකියා බිඳවැටීම, රටේ සංචාරක රැකියා ආරක්ෂා කිරීම සඳහා ඔරොත්තු දීමේ උපාය මාර්ග මෙම අධ්‍යයනයේ දී විවේචනාත්මක ව ඇගයීමට ලක්කර ඇත. පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ තිරසාර සංචාරක සංවර්ධනය සහතික කිරීම සඳහා බලධාරීන් විසින් කෙටි කාලීන, මධ්‍යම කාලීන හා දිගු කාලීන ඔරොත්තු දෙන උපායමාර්ග ඵලදායි ලෙස භාවිත කළ යුතු බව මෙම අධ්‍යයනය තුළ අවධානය කර ඇත. තවද, කොවිඩ් 19 බලපෑම හේතුවෙන් බුද්ධිමත් නිෂ්පාදන පද්ධති, ස්වයංක්‍රීය පද්ධති හා රොබෝ තාක්ෂණය ආදිය සැපයීම සඳහා සමාගම් පෙරට සාපේක්ෂ ව පෙළඹී ඇති බවත්, ඒ හරහා කර්මාන්තයේ රැකියා අවස්ථා සඳහා විශාල අභියෝගයක් නිර්මාණය කර ඇති බවත්, මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරගෙන ඇත. අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත හා සම්මුඛ පරීක්ෂණ විශ්ලේෂණය මත පදනම් ව සංචාරක රැකියා පිළිබඳ ප්‍රතිසාධනය හා ඔරොත්තු දීමේ උපායමාර්ග හා අනාගතයේ දී ඔවුන් මුහුණ දෙන අභියෝග හඳුනාගන්නා ලදී.

Thushanga සහ Piyadasa (2021) “The Effect of Covid Pandemic to the Tourism Industry” නැමැති අධ්‍යයනය සිදු කර ඇත. මෙම අධ්‍යයනය මගින් කොවිඩ් 19 වසංගතයේ බලපෑම මෙන් ම පශ්චාත් යුද සමය තුළ සංචාරක කර්මාන්තය පිළිබඳ අවධානය යොමු කර ඇත. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ පසුබෑමක් සිදුව ඇති බව අධ්‍යයනය මගින් පෙන්වා දෙයි. මෙම අධ්‍යයනය ද්විතීයික දත්ත මත පදනම් ව සිදු කර ඇත.

Yadav සහ Qureshi (2021) දී “Impacts of Covid-19 on Indian Travel and Tourism Industry” නමැති අධ්‍යයන ලිපියේ ප්‍රමුඛතම අරමුණ වනුයේ, කොරෝනා වෛරසය පැතිරීම ඉන්දියාවේ සංචාරක හා සංචාරක කර්මාන්තයට කොතරම් දුරට බලපා තිබේ ද යන්න තක්සේරු කිරීම යි. ජාත්‍යන්තර සංචාරක පැමිණීම් හා ගෝලීය සංචාරක ලැබීම් පිළිබඳ දත්ත වර්ග කිරීමට, දේශීය සංචාරක පැමිණීම් හා දේශීය අමුත්තන්ගේ වියදම් පිළිබඳ දත්ත වර්ග කිරීමට, දළ දේශීය නිෂ්පාදිතයට හා රැකියා සඳහා සංචාරක හා සංචාරක කර්මාන්තයේ සමස්ත දායකත්වය පිළිබඳ දත්ත වර්ග කිරීම, සංචාරක හා සංචාරක කර්මාන්තය ලොවපුරා ඉන්දියාවේ විවිධ ශ්‍රේණිගත කිරීම් වර්ග කිරීමට, සංචාරක හා සංචාරක කර්මාන්තයේ නියැලී සිටින සමාගම්වල දත්ත විශ්ලේෂණයට අනුව කොවිඩ් 19 වෛරසය ඉන්දීය සංචාරක හා සංචාරක කර්මාන්තයට කොතරම් බලපෑම් කර තිබේද යන්න සොයා බැලීම අනු අරමුණු අතර වේ. මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත භාවිත කර ඇත.

Hoque (et.al) (2020) “The Effect of Coronavirus (COVID-19) in the Tourism Industry in China” නැමැති පර්යේෂණයේ අරමුණ වන්නේ, චීනයේ සංචාරක කර්මාන්තයට කොරෝනා වෛරසය ඇති වීමේ බලපෑම මැන බැලීම යි. පර්යේෂණය මගින් චීනයේ පැතිර යන කොරෝනා වෛරසය ලොව පුරා සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව පෙන්වා දී ඇත. චීනයේ සීඝ්‍රයෙන් පැතිර ගිය කොරෝනා වෛරසය චීනයේ සාමාන්‍ය ජන ජීවිතය නවතා දමා ඇති බවත් එය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් එරට සංචාරක කර්මාන්තයට සිදු කර ඇති බලපෑම පිළිබඳ ව සාකච්ඡා කර තිබේ. මේ තත්ත්වය චීනයේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදු කර ඇති බවත් වෛරසය උග්‍රවීමෙන් චීනයේ සංචාරක කර්මාන්තයට දිගු කාලීන බලපෑමක් ඇති කරනු ඇතැයි දක්වනු ලබයි. මෙම වසංගතය හේතුවෙන් බොහෝ දේශීය හා ජාත්‍යන්තර ගුවන් සමාගම්වලට චීනයෙන් හා චීනයට පැමිණෙන ඔවුන්ගේ ගුවන් ගමන් අවලංගු කිරීමට සිදු වී ඇති බවත් හෝටල්, ගුවන් සේවා මෙන් ම මුහුදු මාර්ග ද නතර වූ බවත් සඳහන් වේ. මේ නිසා සංචාරක කර්මාන්තය පෙර නොවූ විරූ තර්ජනවලට මුහුණ දී සිටින බව අවධාරණය කර තිබේ.

කොවිඩ් 19 සන්දර්භය සහ පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ හා විදේශීය සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව සිදු කර ඇති විවිධ අධ්‍යයනයන් දැකිය හැකි ය. නමුත්, ශ්‍රී ලංකාවේ විශාල සංචාරක ආකර්ෂණයක් පවතින ඇල්ල ප්‍රදේශය පදනම් කර ගනිමින් එවැනි අධ්‍යනයක් සිදු කර නොමැත. පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ලංකාව මුහුණ දෙමින් සිටින අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය සැලකිය යුතු මට්ටමකින් බිඳ වැටී ඇති අතර, එම ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් අභියෝග රැසකට මුහුණ දෙමින් සිටිති. එම නිසා පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ඇති වූ ව්‍යවසනයන් හා අනෙකුත් අර්බුදකාරී තත්ත්වයන් සමඟ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංචාරක ක්ෂේත්‍රය හා එහි නියුතු පිරිස් මුහුණ දෙන විවිධ අභියෝගයන් මෙන් ම එම ප්‍රදේශ තුළ සංචාරක කර්මාන්තය ආරක්ෂා කර ප්‍රවර්ධනය කරමින් නැවත ගොඩනඟන්නේ කෙසේද? යන්න අධ්‍යයනය කිරීම


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කෙරේ. එමනිසා මෙම අධ්‍යයනය පර්යේෂණයට ලක් කළ යුතු ම ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගත හැකිය.

## පර්යේෂණ ගැටලුව

සංචාරක කර්මාන්තය ලෝකයේ විශාලතම කර්මාන්තවලින් එකක් වන අතර, වේගයෙන් ම වර්ධනය වන ආර්ථික අංශයකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ආර්ථිකය රඳා පවතින එක් සුවිශේෂ කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය දැක්විය හැකි ය. මෙසේ රාජ්‍යයන් සංචාරක කර්මාන්තය මත දැඩි ලෙස රඳා පවතින්නේ සංචාරකයින් රටට පැමිණීම හරහා වැඩි ආදායමක් උපදවන බැවිනි. එනිසා මෙය ප්‍රවර්ධනය කිරීම සඳහා ලොව පුරා බොහෝ රටවල් විවිධ ආකාරයේ පියවර ගෙන ඇති අතර, විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ලබයි. නමුත්, 2020 වසරේ ලොවපුරා ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වයෙන් මුලු ලෝකය ම පීඩා විඳ ඇති අතර, ඒ හරහා ගෝලීය මෙන් ම දේශීය වශයෙන් සංචාරක කර්මාන්තය ප්‍රබල ලෙස බලපෑමට ලක්විය. පසුගිය වසර කිහිපය තුළ ඇති වූ කොරෝනා වසංගතයේ සහ 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය ඇතුළු අර්බුද මාලාවන් හමුවේ රටේ දේශසීමා වසා දැමීම, ඇඳිරි නීතිය පැනවීම හරහා සංචාරක සීමාවන් පැනවීම යනාදිය නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පහත වැටුණි. මෙම අර්බුදකාරී වාතාවරණයන් හමුවේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට මෙන් ම එම කර්මාන්තයේ නියැලෙන පිරිස්හට විශාල අභියෝගයන්ට මුහුණදීමට සිදුවිය. මෙහි බලපෑම කෙටිකාලීන මෙන් ම දිගුකාලීන වශයෙන් ජාතික ආර්ථිකයට සෘණාත්මක බලපෑමක් ඇති කර තිබේ. නමුත්, පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ බොහෝ රටවල සංචාරක කර්මාන්තය වර්තමානය වන විට ප්‍රවර්ධනය කරගෙන පැවතුන ද, ශ්‍රී ලංකාව ගත් කළ එහි ප්‍රවර්ධනයක් දැකගත නොහැකි ය. මන්ද, පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ මුහුණ දීමට සිදු වී ඇති විශාල අර්බුදකාරී වාතාවරණයන් නිසාවෙනි. වර්තමානය වන විට ආර්ථික අර්බුදය, රුසියානු යුක්රේන ගැටුම, දේශපාලන කැලැඹීම් යනාදී සියලු වාතාවරණයන් හරහා රටේ සංචාරක කර්මාන්තය බිඳ වැටී ඇති අතර, ලංකාව දරුණුතම විදේශ විනිමය අර්බුදයකට මුහුණ දෙමින් සිටින ආකාරයක් හඳුනාගත හැකි ය. එබැවින් කොවිඩ් සන්දර්භය මෙන් ම පශ්චාත් කොවිඩ් සන්දර්භය නිසාවෙන් සංචාරක කර්මාන්තය දැඩි ලෙස පීඩාවට පත් වූ අංශයක් වන අතර, මෙම කර්මාන්තයේ නියුතු යැපෙන දහස් ගණන් ජීවිත හා ජීවනෝපායන් විශාල අභියෝගයකට ලක් ව ඇති ආකාරය හඳුනා ගත හැකි ය. ඒ අනුව, මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ගැටලුව වනුයේ, පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝගයන් මොනවාද? යන්න විමර්ශනයට ලක් කිරීම යි.

## පර්යේෂණ ප්‍රශ්න

- පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය බිඳ වැටීමට බලපෑ හේතු මොනවාද?
- බිඳ වැටුණු සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි උපාය මාර්ගික විසඳුම් මොනවාද?

## පර්යේෂණ අරමුණු

- පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දී ඇති විවිධ අභියෝගයන් හඳුනා ගැනීම.
- සංචාරක කර්මාන්තය බිඳවැටීම සඳහා බලපෑ ඇති හේතු සාධක හඳුනාගැනීම.
- බිඳවැටීමට ලක් වූ සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි කෙටි කාලීන හා දිගු කාලීන උපාය මාර්ගික විසඳුම් ගවේෂණය කිරීම.

## පර්යේෂණයේ වැදගත්කම

සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ අත්‍යවශ්‍ය අංශයක් වන අතර, ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් සපයන ලද සහයක සේවා විශාල ප්‍රමාණයකින් යුතු වේ. මන්ද, සංචාරක කර්මාන්තය රටේ ආර්ථික අංශයට පමණක් නොව රටක විවිධ අංශවලට බොහෝ ප්‍රතිලාභ ලබාදෙන කර්මාන්තයකි. මෙලෙස රටක් සංවර්ධනය කිරීමේ වැදගත් අංගයක් ලෙස සංචාරක කර්මාන්තය සඳහන් කළ හැකි අතර, යම් යම් අර්බුදයක් හෝ ව්‍යසනකාරී තත්ත්වක් හමුවේ එය ආරක්ෂා නොකර ප්‍රවර්ධනය කිරීමක් සිදු නොකිරීම හරහා සංචාරක කර්මාන්තය විශාල අභියෝගයකට ලක් වන අතර, රටේ ජීවන රටාවට, සමාජයට, සංස්කෘතියට අහිතකර ලෙස බලපානු ලබයි. සංචාරක කර්මාන්තය විදේශ විනිමය ඉපයීම් මගින් රාජ්‍ය අංශයේ ආදායම් උත්පාදනය කරන නිසා විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් පෞද්ගලික, දේශීය හා ජාතික ආදායම සැලකිය යුතු ප්‍රමාණයකින් උපයා ගත හැකිය. මේ හරහා නව රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් නිර්මාණය කරනු ලැබේ. 2020 සිට ලංකාව මුහුණ දුන් විවිධ ව්‍යසනකාරී තත්ත්වයන් හා අර්බුදයන් හමුවේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විශාල අභියෝගයන්ට මෙන් ම ගැටලු රාශියකට ලක් ව ඇති ආකාරයක් හඳුනාගත හැකි ය. මානව සම්පත් හා ප්‍රාග්ධන සම්පත් ඇතුළු සම්පත් අහිමි වීම, සංචාරක තහනම් කිරීම්, ගුවන් ගමන් අත්හිටුවීම හා ඇඳිරි නීතිය පැනවීම් යනාදී රෙගුලාසිවල බලපෑම කොවිඩ් සන්දර්භය තුළ සිදු වූ අතර, වර්තමාන පශ්චාත් කොවිඩ් තත්ත්වය තුළ ලංකාවේ විදේශ විනිමය සැලකිය යුතු ලෙස පහත වැටීම, දේශපාලන කැළඹීම් යනාදී අර්බුදයන් හරහා සංචාරක කර්මාන්තය මහත් අභියෝගයට ලක් ව ඇති ඇති ආකාරය හඳුනාගත හැකිය. ඒ අනුව, පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග පිළිබඳ අධ්‍යයනයක් යන තේමාව ඔස්සේ සිදු කරනු ලබන අධ්‍යයනය ප්‍රායෝගික වශයෙන් ඉතා වැදගත් වූ අධ්‍යයනයක් වන්නේය.

- පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝගයන් ප්‍රායෝගික ව හඳුනාගැනීමට හැකි වීම.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- සංචාරක කර්මාන්තයට ඇති වන අහිතකර බලපෑම් මඟහරවා ගැනීම සඳහා විසඳුම් හා පිළියම් අදාළ පාර්ශ්වයන්ට ප්‍රයෝජනවත් වන පරිදි ඔවුන්ගේ ම අදහස් හා යෝජනා රැගෙන ගොඩනැගීමට හැකි වීම.
- නෛතිකමය ක්ෂේත්‍රය තුළ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීමේ දී අභියෝගයට මුහුණ දුන් පාර්ශ්වයන්ගේ අදහස් හා යෝජනා සලකා බැලීමට හැකි වීම.
- සංචාරක කර්මාන්තයට බලපාන අනාගත අර්බුදය හා වෙනත් ව්‍යසනකාරී තත්ත්වයන් පිළිබඳ අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීම හරහා ඔවුන්ට එම අභියෝගයන්ට ශක්තිමත් ව මුහුණ දීම සඳහා පන්නරයක් වීම.
- ඇල්ල ප්‍රදේශයේ එම අභියෝගයන්ට සත්‍ය වශයෙන් ම මුහුණ දෙන පිරිස් හඳුනා ගත හැකි වන අතර, ඒ සඳහා ඔවුන්ට ප්‍රායෝගික විසඳුම් හා පිළියම් එම ප්‍රදේශයේ ඒ හා සම්බන්ධ අදාළ බලධාරීන් තුළින් ලබා දීමට හැකි වීම.

පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝගය (ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) ආශ්‍රයෙන් අධ්‍යයනයක් සිදු කර නොමැති අතර, මීට පසුව මේ පිළිබඳ ව සිදු කරනු ලබන අධ්‍යයනයන් සඳහා මෙම අධ්‍යයනය ඉතා වැදගත් වේ. මන්ද, එමඟින් ඇල්ල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියුතු පිරිස් වර්තමානයේ දී ඔවුන් මුහුණදෙන විවිධ අභියෝග හා ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරීමට කැමැත්තක් දක්වන අධ්‍යයනකරුවන්ට හා අනෙකුත් විවිධ පාර්ශවයන්ට දැනුවත් භාවයක් ලබා ගැනීමට හැකි වීම, ඇල්ල ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තයට අලුතින් පිවිසීමට බලාපොරොත්තු වන පාර්ශවයන්ට වත්මන් වාතාවරණය පිළිබඳ දත්ත හා තොරතුරු ලබා ගැනීමට පහසුවීම, විෂයානුබද්ධ න්‍යායාත්මක පදනමක් සහිත ව සමාජීය විද්‍යා පර්යේෂණ ක්‍රම උපයෝගී කර ගනිමින් මෙම සමීක්ෂණය සිදු කර තිබීම ඒ අතර වේ. ඒ අනුව, මෙම අධ්‍යයනය අධ්‍යාපනික වශයෙන් ඉතාමත් වැදගත් වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය "මිශ්‍ර ක්‍රමවේදය" මත පදනම් ව සිදුකළ අතර, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර ඔස්සේ රැස් කරන ලදී. ප්‍රාථමික දත්ත ව්‍යුහගත ප්‍රශ්නාවලියක් සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරන ලදී. ඇල්ල ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ විවිධ වෘත්තීන්හි නිරත ප්‍රවාහන පහසුකම් සපයන්නන්, නවාතැන් පහසුකම් සපයන්නන්, සංචාරක මඟපෙන්වන්නන්, ආහාර සපයන්නන්, කුඩා ව්‍යාපාරිකයන්, මහා පරිමාණ ව්‍යාපාරිකයන්, හෝටල් හිමියන්, හෝටල් සේවකයන්, සංචාරක කර්මාන්තය මත රඳා පවතින වෙනත් කර්මාන්තකරුවන් හා වෙනත් පිරිස් යනාදී වශයෙන් එක් කාණ්ඩයකට 10 දෙනා බැගින් ප්‍රශ්නාවලී 100 ක් ඔස්සේ පොකුරු නියැදුම් ක්‍රමය හරහා දත්ත ලබා ගැණින. අරමුණු සහගත නියැදි ක්‍රමය ඔස්සේ ඌව පළාත් සංචාරක අමාත්‍යාංශයේ එක් නිලධාරිවරයෙක්, ඇල්ල සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ එක් නිලධාරිවරයෙක්, සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආචාර්යවරුන් දෙදෙනෙක්, එම ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාරිකයින් දෙදෙනෙක්, සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව ඍජු රැකියාවල නිරත පුද්ගලයින් දෙදෙනෙක්, සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව වක්‍ර රැකියාවල නිරත පුද්ගලයින් දෙදෙනෙක් වශයෙන් පුද්ගලයන් 10ක් සම්මුඛ සාකච්ඡාවට භාජනය කරමින් දත්ත ලබා ගන්නා ලදී. ඒ අනුව මුළු නියැදි සංඛ්‍යාව 110ක් වේ. ද්විතීයික දත්ත පොත්, පර්යේෂණ වාර්තා, නිල වාර්තා, සඟරා ලිපි, පුවත්පත් වෙබ් අඩවි ආදියෙන් එකතු කරන ලදී. රැස්කළ ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය (Thematic Analysis) සහ සන්දර්භ විශ්ලේෂණය (Context Analysis) යොදාගනිමින් විශ්ලේෂණය සිදු කළ අතර, ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා SPSS මෘදුකාංගය භාවිත කරන ලදී.

## දත්ත විශ්ලේෂණය

සංචාරක කර්මාන්තය ලෝකයේ විශාලතම කර්මාන්තවලින් එකක් වන අතර, රටකට හා එහි පුරවැසියන්ට බොහෝ ප්‍රතිලාභ ඇති කිරීමට ඉහල විභවයක් ඇත. ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින කවර රටක වුවද, සංචාරක කර්මාන්තය තම ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කරගනු ලබන්නේ එමගින් රටකට ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳ සැලකිල්ලට ගනිමිනි. එහි දී ශ්‍රී ලංකාව, සංචාරක කර්මාන්තය මත රඳා පවතින ලෝකයේ විශාල සංචාරක ආකර්ෂණයක් දිනාගත් රටකි. නමුත් වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය බිඳ වැටී ඇති අතර, අභියෝග රැසකට මුහුණ දෙමින් සිටියි. එම අභියෝගයන් තේමා කිහිපයක් යටතේ විශ්ලේෂණය කළ හැකි ය.

## ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය අභියෝගයට ලක්වීමට බලපෑ හේතු

මෙම අධ්‍යයනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය අභියෝගයට ලක්වීමට බලපෑ හේතු පිළිබඳ ව විමර්ශනයට ලක්කර ඇත. ඒ අනුව, මෙම අධ්‍යයනයට අදාළ දත්ත රැස් කිරීමේ දී මෑත කාලීන ව සංචාරක කර්මාන්ත අභියෝගයට ලක්වීමට බලපෑ හේතු රැසක් පිළිබඳ ව සාකච්ඡාවට ලක් වුනි.

- 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය
- කොවිඩ් 19 වසංගතය
- රුසියානු යුක්‍රේන ගැටුම
- දේශපාලන අස්ථාවරභාවය
- ආර්ථික අර්බුදය

ඉහත සඳහන් ආකාරයට මෑතකාලීන සිදුවීම් අතුරින් 2019 පාස්කු ඉරිදා ප්‍රහාරය මෙම කර්මාන්තයේ බිඳ වැටීමේ ආරම්භය සනිටුහන් විය. ප්‍රමුඛ පෙළේ හෝටල් ඇතුළු ක්‍රිස්තියානි පල්ලි කිහිපයක 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයත් සමඟ සංචාරකයින්ගේ පැමිණීම පෙර වසරට සාපේක්ෂ ව 21% කින් පහත වැටී ඇති බව


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දක්වයි. එම කාලවකවානුව තුළ විදේශීය රටවල් ශ්‍රී ලංකාව වෙත ගමන් කිරීමෙන් වළකින ලෙසට අනතුරු අඟවමින් සංචාරක උපදෙස් පවා නිකුත් කර තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, රට තුළ සිටි සංචාරකයින් රටින් පිට ව ගිය අතර, පහුගිය වසරට සාපේක්ෂ ව මැයි මාසයේ දී නව පැමිණීම් 70% හා ජුනි මාසයේ දී 60% කින් පහත වැටිණි. පසුව, 2019 අවසානය වන විට ආදායම යළිත් වරක් ඇමරිකානු ඩොලර් බිලියන 3.5 ක් දක්වා වර්ධනය වීමත් සමඟ සංචාරක කර්මාන්තය යළිත් පිබිදුණි (ජයවීර, 2022).

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් බිඳ වැටුණු සංචාරක කර්මාන්තය කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා තවදුරටත් අඩපණ විය. කොවිඩ් 19 වසංගතය 2019 නොවැම්බර් මාසයේ චීනයේ වූහාන් නගරයේ හුබෙයි පළාතෙන් ආරම්භ වී 2020 මාර්තු වනවිට ලොවපුරා ව්‍යාප්ත විය. මෙය ජාතික හා ජාත්‍යන්තර සංචාරක අංශය ඇතුළු ලෝකයේ සෑම රටක ම සියලු අංශ කෙරෙහි දැඩි ඍණාත්මක බලපෑමක් ඇති කළේය. කොවිඩ් 19 ලොවපුරා ව්‍යාප්ත වීමත් සමඟ එය වැළැක්වීම සඳහා බොහෝ රටවල් දේශසීමා වසා දැමීය. අඛණ්ඩ ව ඇඳිරි නීතිය පැනවීම්, ගමන් සීමා කිරීම්, ගුවන් ගමන් අත්හිටුවීම් වැනි වසංගතය පාලනය කිරීමේ මෙහෙයුම් ඇරඹීය. ඒ හරහා රටවල් අතර සංචරණය සීමා විය. මෙලෙස සංචාරකයින්ගේ සංචරණය සීමා වීම නිසා සංචාරක කර්මාන්තයේ ක්‍රියාකාරිත්වයට බෙහෙවින් බලපෑවේය. ශ්‍රී ලංකාවේ 2020 මාර්තු මැද සිට සංචාරක පැමිණීම් අත්හිටුවන ලද අතර, දිවයින පුරා ඇඳිරි නීතිය පනවන ලදී. මෙලෙස ලෝකයේ බොහෝ රටවල් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සංචාරක තහනම් පැණවීම හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ සෑම රටක ම සංචාරක කර්මාන්තය සැලකිය යුතු ලෙස අභියෝගයට ලක් වීමට හේතු විය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට එල්ල වූ තෙවන ප්‍රහාරය වූයේ යුක්‍රේන හා රුසියානු යුද්ධය යි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංඛ්‍යා ලේඛනවලට අනුව (2020) ලංකාවේ ඉහළ ම ජාත්‍යන්තර සංචාරක උත්පාදන වෙළෙඳපොළවල් 10 අතරින් රුසියානු සමූහාණ්ඩුව තෙවන ස්ථානයටත්, යුක්‍රේනය අටවන ස්ථානයටත් පත් ව තිබේ (SLTDA, 2020). ඒ අනුව, ශ්‍රී ලංකාවට රුසියාවෙන් හා යුක්‍රේනයෙන් සංචාරකයන් විශාල වශයෙන් පැමිණ තිබේ. නමුත් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස රුසියානු සංචාරකයන්ගේ මෙන් ම යුක්‍රේන සංචාරකයන්ගේ පැමිණීමේ ප්‍රමාණය පහත වැටුණු අතර, මෙම යුද්ධය ප්‍රධාන වශයෙන් යුරෝපීය රටවලට ද බලපෑම් සිදු කළේය.

සංචාරක පැමිණීම් 2021 වසරේ අග කාල පරිච්ඡේදයේ සිට වේගයෙන් ඉහළ ගිය අතර, 2021 වසරේ මාර්තු මාසයේ දී එහි උපරිමය කරා ළඟා වුණි. ගෝලීය කොවිඩ් 19 සඳහා එන්නත් කිරීමේ අනුපාතය ඉහළ යාම, ගුවන් සම්බන්ධතා වර්ධනය වීම සහ ප්‍රධාන සංචාරක ප්‍රභවයන් විසින් නිකුත් කරන ලද සංචාරක සීමා ඉවත් කර ගැනීම යනාදිය මෙලෙස සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. නමුත් ආර්ථික අර්බුදය, සමාජ ආතතීන් ඉහළ යාම, රට තුළ සංචාරය කිරීමට ඉන්ධන ප්‍රමාණවත් පරිදි නොතිබීම හා එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන සංචාරක ප්‍රභව විසින් නිකුත් කරන ලද ඍණාත්මක ප්‍රචාරණ සහ ශ්‍රී ලංකාවේ සංචාරය තහනම් කරමින් සිදුකළ සංචාරක උපදේශන මගින් එම වර්ධන ප්‍රවණතාවයට බාධා සිදු වුණි (Central Bank Report, 2022). මෙම තත්ත්වය සංචාරක ක්ෂේත්‍රය තුළ නිරත ව්‍යාපාරකයෙක් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී තවදුරටත් තහවුරු විය.

> "සංචාරක කර්මාන්තය යනු මෙරට විදේශ විනිමය ඉපයීමේ ඉහළින් ම සිටින ප්‍රධානතම කර්මාන්තය. 2019 වසරේ එල්ල වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු කඩා වැටීමට ලක් වූ මෙරට සංචාරක කර්මාන්තය කොරෝනා වසංගතය හරහා තවදුරටත් පසුබෑමට ලක් වුණා. පසුව ශ්‍රී ලංකාවට තම ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දීමට සිදු වුණා. සංචාරකයින්ට අවශ්‍ය මූලික පහසුකම් පවා මෙම ආර්ථික අර්බුදය හේතුවෙන් අහිමිවුණා. ඉන්ධන හිඟය, විදුලි කප්පාදුව ඒ අතර වෙනවා. ඒ හේතුව නිසා පැමිණ සිටින සංචාරකයින් සේම සංචාරක ක්ෂේත්‍රයේ නිරත බොහෝ පිරිස්හට විශාල අභියෝග රැසකට මුහුණදීමට සිදු වුණා..."

ආචාර්යවරයකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී අනාවරණය වුයේ;

> "ආර්ථික අර්බුදය නිසා සංචාරක කර්මාන්තය විශාල වශයෙන් බිඳ වැටුණා. විශේෂ හේතුව තමයි ඉන්ධන ප්‍රශ්නය. ඒ වගේම ලංකාව තුළ පැවතී ප්‍රචණ්ඩකාරි වාතාවරණය, අරගල හා හර්තාල ව්‍යාපාර වැනි දේවල් හරහා ජාත්‍යන්තර සංචාරකයින්ට ලංකාව පිළිබඳ ඍණාත්මක ප්‍රතිරූපයක් ඇති වුණා. ලංකාව සංචාරය කිරීමට සුදුසු රටක් නොවෙයි. ප්‍රවාහනය සම්පූර්ණයෙන් ම බිඳ වැටුණා. හිටපු ගමන් වාහන නවත්වනවා. කෝච්චි නවත්වනවා. වෙළඳ ව්‍යාපාර වැහුවා. එකින් එක බඩු මිල ඉහළ ගියා. තවමත් බේකරි ආහාරවල මිල ඉතා ම වැඩියි. ආහාරවල මිල අසාධාරණ ලෙස වැඩිවුණා. ගොඩාක් වෙලාවට සංචාරකයින්ට ගුණාත්මක සේවාවක් ලබා දෙන්නේ නෑ...."

මෙලෙස ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ප්‍රමාණවත් පරිදි නොතිබීම, සංචාරක ආදායම කප්පාදුව, ආහාර ද්‍රව්‍ය හා ඉන්ධන වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිළ ඉහළ යාම හා ආනයන සීමා කිරීම හේතුවෙන් විශාල අර්බුදයන්ට මුහුණ දීමට සිදුවිය. ආර්ථික අර්බුදය, රට තුළ උද්ගතව තිබූ ප්‍රචණ්ඩත්වය, අරගල, විරෝධතා සහ හදිසි අවස්ථා පැනවීම් සමඟ සංචාරක කර්මාන්තයට විශාල අභියෝග රැසකට මුහුණ දීම සිදුවිය. තවද, සංචාරක කර්මාන්තය අභියෝගයට ලක්වීමට දේශපාලන අස්ථාවරභාවය ද හේතු විය. මෙලෙස රට තුළ පැවති දේශපාලන අර්බුදය හේතුවෙන් ගුවන් ගමන් අධික ප්‍රමාණයක් අත්හිටවා තිබූ අතර, ලංකාව තුළ පැවති දේශපාලන හා ආර්ථික අර්බුදය හේතුවෙන් මෙරටට පැමිණීමට සැලසුම් කරන සංචාරකයින් කනස්සල්ලට පත්වන අතර, ඔවුන් තුළ ශ්‍රී ලංකාව පිළිබද ඍණාත්මක


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ආකල්ප හටගැනීම ඇති කර යි. ආචාර්යවරයකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී අනාවරණය වුයේ;

"පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය සමඟ අප රට තුළ විශාල දේශපාලන අර්බුදයක් මතු වුණා. එම ප්‍රශ්න නිසා රටේ මිනිසුන් පාරට බැස්සා. උද්ඝෝෂණ කළා. අරගල කළා. ඒවා වර්ධනය වී වාහන, ගෙවල් ගිනි තැබීම්, මිනිසුන්ට පහරදීම්, ඝාතනය කිරීම් වගේ සිද්ධීන් සිදු වුණා. එම ප්‍රචණ්ඩකාරී සිදුවීම් මාධ්‍යයට ගිහින් ජාත්‍යන්තරය තුළ යන්නේ වෙනස් ම පැතිකඩවලින්. එමනිසා විදේශීය සංචාරකයින් ලංකාවට පැමිණීමට අකමැති වෙනවා. සංචාරකයින් සංචාරය කිරීමට රටකට යන්නේ නිදහස් ව, සතුටින් සිටීමට. ඉතින් මේ වගේ අවස්ථාවක ඔවුන් කොහොමවත් කැමති වෙන්නේ නැහැ ප්‍රචණ්ඩකාරී ස්ථානයකට පැමිණ අවදානමක් ගන්න. මෙවැනි තත්ත්වයන් හමුවේ ඔවුන් ලංකාවට පැමිණෙන්නේ නැත..."

මෙරට සංචාරක කර්මාන්තය අභියෝගයට ලක්වීමට බලපෑ තවත් එක් සාධකයක් ලෙස, කෝවිඩ් 19 සන්දර්භයෙන් පසු රටේ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය විසින් නිසි කාර්යක්ෂම පියවර අනුගමනය නොකිරීම ද දැකගත හැකි ය. මෙම තත්ත්වය ආචාර්යවරයකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී තවදුරටත් තහවුරු විය.

"රට තුළ උද්ගත වී තිබූ ප්‍රශ්න හමුවේ රජයට බොරු පොරොන්දු ලබා දී සංචාරකයින් මෙරටට ගෙන්න ගන්න බෑ. සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජය විසින් ගත් ක්‍රියාමාර්ග තිබුණා. නමුත් ලොකු බලපෑමක් කරන්න පුළුවන් තරමට ඒවා සාර්ථක වුණේ නැහැ. රජය විසින් ගත් උත්සාහයන්වල පසුබෑම් තිබුණා. සමහර අවස්ථාවල රජයට නිසි ආකාරයෙන් පාලනය කර ගන්න බැරි වුණා..."

මෙම සාධකවලට අමතර ව, චීනය විසින් විදේශ රටවල් වෙත සංචරණය කිරීම තහනම් කිරීමද සංචාරක පැමිණීම යථා තත්ත්වයට පත්වීමට අහිතකර ලෙස බලපෑ හේතු සාධකයකි (Central Bank Report, 2022). මන්ද, චීනය ශ්‍රී ලංකාවේ ඉහළ ම ජාත්‍යන්තර සංචාරක උත්පාදන වෙළඳපොළකි. මෙවැනි හේතු සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රබල ලෙස අභියෝගයට ලක් විය. නමුත්, සමාජ ආතතීන් සමනය වීමත් සමඟ ඇතැම් රටවල් විසින් ශ්‍රී ලංකාවේ සංචාරය තහනම් කරමින් සිදුකළ සංචාරක උපදේශන ලිහිල් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට සංචාරක පැමිණීම් ක්‍රමානුකූල ව වර්ධනය වී එම ප්‍රවණතාවය 2023 වර්ෂය දක්වා අඛණ්ඩ ව පවතින ආකාරයක් හඳුනාගත හැකි ය.

වගුව 01: ශ්‍රී ලංකාවට 2022 සිට 2023 අප්‍රේල් දක්වා සංචාරකයින්ගේ පැමිණීම.


| මාසය | 2022 | 2023 | වෙනස්වීම 2023/2022 (%) |
|---|---|---|---|
| ජනවාරි | 82327 | 102545 | 24.5 |
| පෙබරවාරි | 96507 | 107639 | 11.5 |
| මාර්තු | 106500 | 125495 | 17.8 |
| අප්‍රේල් | 62980 | 105498 | 67.5 |
| මැයි | 30207 | | |
| ජුනි | 32856 | | |
| ජූලි | 47293 | | |
| අගෝස්තු | 37760 | | |
| සැප්තැම්බර් | 29802 | | |
| ඔක්තෝම්බර් | 42026 | | |
| නොවැම්බර් | 59759 | | |
| දෙසැම්බර් | 91961 | | |
| එකතුව | 719,978 | 441,177 | |

(මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2023)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඒ අනුව, පර්යේෂණ නියැදිය තුළ පහත ප්‍රස්ථාරයට (ප්‍රස්ථාරය 01) අනුව, වර්තමානය වන විට ඇල්ල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය පිළිබඳ අවධානය යොමු කරන විට සමස්තයෙන් 44%ක් සංචාරකයින්ගේ වර්ධනය සාමාන්‍ය බවත්, 26%ක ප්‍රමාණයක් හොඳයි යන්න ද, 18%ක ප්‍රමාණයක් සංචාරක වර්ධනය දුර්වල බවත්, 9%ක් ඉතා දුර්වල බවත්, 3%ක් ඉතා හොඳ බවත් දක්වයි. ඒ අනුව ලැබූ ප්‍රතිචාරයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඇල්ල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය සාමාන්‍ය මට්ටමක පවතින බව දක්වයි.

ප්‍රස්ථාරය 01: වර්තමානය වන විට ඇල්ල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය




(මූලාශ්‍රය: නියැදි සමීක්‍ෂණය, 2023)


**පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග හඳුනාගැනීම**

එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් සංචාරක කර්මාන්තය පෞද්ගලික හෝ ව්‍යාපාරික/වෘත්තීමය අරමුණු සඳහා මිනිසුන් තම සුපුරුදු වටපිටාවෙන් පිටත රටවල් හෝ ස්ථානවලට සංක්‍රමණය වන සමාජ, සංස්කෘතික හා ආර්ථික සංසිද්ධියක් ලෙස නිර්වචනය කර ඇත. ඊට අමතර ව, සංචාරක කර්මාන්තය ආර්ථික වර්ධනයට, සේවා නියුක්තියට, ප්‍රාදේශීය සංවර්ධනයට හා කලාපීය ආදායම් විෂමතා අවම කිරීමට ද දායක වේ (Central Bank Report, 2021). මෙය සෘජු හා වක්‍ර දේශීය රැකියා උත්පාදනය කරමින් සෘජු විදේශ ආයෝජන සඳහා අවස්ථා නිර්මාණය කරයි. එනිසා සංචාරක කර්මාන්තය මිලියන ගණනක ජීවනාලියකි.

සමීක්ෂණය ඔස්සේ ලබාගත් දත්තවලට අනුව, ඇල්ල ප්‍රදේශයේ අහඹු ලෙස තෝරගත් සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් අතුරින් 80%ක ප්‍රතිශතයක් සංචාරක ක්ෂේත්‍රයට අදාළ වූ රැකියාවක් පමණක් සිදුකල අතර, ඉතුරු 20%ක පිරිස සංචාරක ක්ෂේත්‍රයට අමතර ව වෙනත් රැකියාවන්වල නිරත වී සිටිති. ඒ අනුව පැහැදිලි වනුයේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් එනම්, 80%ක පිරිසකගේ එක ම ජීවනෝපාය බවට පත්ව තිබුණේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත වූ සෘජු හෝ වක්‍ර රැකියාවක් බව යි. නමුත්, ඉහත සඳහන් හේතු සාධක නිසාවෙන් සංචාරක කර්මාන්තය බිඳ වැටීම නිසා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මෙන් ම සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් විශාල අභියෝග රැසකට මුහුණ දී සිටියි. ඒ අනුව, සිදු කරනු ලැබූ සමීක්‍ෂණයෙන් ලබාගත් දත්ත අනුව, සංචාරක කර්මාන්තය බිඳ වැටීම නිසා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංචාරක කර්මාන්තයේ නියුතු පිරිස් මුහුණ දෙන අභියෝගයන් මොනවාද? යන්න පහත ප්‍රස්ථාරය (ප්‍රස්ථාරය 02) ඔස්සේ නිරූපණය කර තිබේ.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රස්ථාරය 02: සංචාරක කර්මාන්තය බිඳ වැටීම නිසා සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් මුහුණ දුන් අභියෝග




(මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023)

ඒ අතුරින් ප්‍රධාන ම අභියෝගය වූයේ ඔවුන්ගේ රැකියා අවස්ථා අහිමි වීම යි. රැකියා උත්පාදනය සඳහා සංචාරක කර්මාන්තය ඍජුව ම දායක වන අතර, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබයි. මෙය ඍජු හා වක්‍ර දේශීය රැකියා උත්පාදනය කරමින් ඍජු විදේශ ආයෝජන සඳහා අවස්ථා නිර්මාණය කර යි. නමුත් සංචාරක කර්මාන්තය බිඳ වැටීම නිසා බොහෝ පිරිසකට රැකියාවන් අහිමි විය.

සමීක්ෂණයේ දී ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, කොවිඩ් 19 බලපෑම හමුවේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් අතුරින් රැකියා අහිමි වූවන් 86%ක් වන අතර, සිය රැකියාව අහිමි වීම හේතුවෙන් වෙනත් රැකියාවක නියැලී සිටී පිරිස 54%කි. ඔවුන් බහුතරයක් කුලී වැඩ සහ ගොවිතැන් කටයුතුවල නිරත වූ බව පැවසී ය. තවදුරටත් ව්‍යාපාර වසා දැමීම, රැකියා අවස්ථා අහිමි වීම යනාදිය හේතුවෙන් සංචාරක කර්මාන්තය මත යැපෙන පවුල් අතිශය පීඩාවට පත් ව තිබෙන්නේ සිය ව්‍යාපාර සඳහා ලබාගත් ණය මුදල් ගෙවා ගැනීමට, සේවකයින්ගේ වැටුප් ගෙවීමට මෙන් ම දේපලවලට අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් නොලැබීම නිසා ය. වර්තමානය වන විට ඔවුන් දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණපෑමට සිදුව ඇත. මෙවැනි පසුබිමක් තුළ ලබාගත් ණය මුදල් සඳහා ණය සහන කාලයක් ලබා දුන්න ද, වර්තමානය වන විට ඔවුන් තවදුරටත් ණයවලට හිරවී සිටින බව පැවැසිණ. ඉඩම්, හෝටල්, ආපනශාලා, වාහන සඳහා මූල්‍යමය ආයතනවලින් ලබා ගත් ණය මුදල් ගෙවා ගැනීමට නොහැකි ව ඔවුන් දුෂ්කරතාවයට පත් ව සිටී.

විදේශ විනිමය අර්බුදය හරහා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාම, ගෑස්, ඉන්ධන වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟය සමඟ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විශාල අභියෝගයකට ලක් ව තිබුණි. පනවා තිබූ ආනයන සීමා කිරීම් මෙන් ම සැපයුම් දාමයට බාධා කිරීම්,


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


භාණ්ඩ සැපයුම අඩුවීම, පාරිභෝගික ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් ඉහළ යාමත් සමග රට තුළ උද්ධමනය ඇති විය. මෙම අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංචාරක සන්නාමයට විශාල හානියක් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරටට පැමිණීමට අපේක්ෂාවෙන් සිටි සංචාරකයින් ඔවුන්ගේ සංචාර කල් දැමීම මෙන් ම අවලංගු කිරීම් සිදු විය. තවද, ආහාර වර්ග හා පිරිනමන මිල පරාසය වැඩි වීම හේතුවෙන් දේශීය සංචාරකයින්ගේ අඩුවීමක් දැක ගත හැක. ආපනශාලා හිමියන්ට අනුව, වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන් දේශීය සංචාරකයින් වෙනුවෙන් කෑමවල මිල අඩු කිරීමට උත්සාහ කළ ද එය ද සාර්ථක වී නොමැත. එමනිසා ඔවුන් විශාල පීඩාවන්ට ලක් වී සිටි යි.

තවද, වර්තමානය වන විට පුහුණු සේවකයින් නොමැති වීම සංචාරක කර්මාන්තය මුහුණ දෙන තවත් අභියෝගයක් වී ඇත. පුහුණු සංචාරක හා ආගන්තුක සත්කාර සේවකයින් කෙටිකාලීන ව කර්මාන්තවලින් ඉවත් ව වඩාත් ස්ථාවර කර්මාන්තවලට සම්බන්ධ වී ඇත. බොහෝමයක් විදෙස් රටවල් කරා ගොස් තිබේ. එමනිසා හෝටල් පවත්වාගෙන යාම මෙන් ම තමන්ගේ සේවකයින් නඩත්තු කිරීමේ අභියෝගය ද හෝටල් හිමියන් සතු ව පවතිව බව පැවසී ය. ව්‍යාපාරිකයෙක් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබුවේ;

> "සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා පුහුණු සේවකයින් අවශ්‍යයි. පසුගිය කොරෝනා වසංගත සමයේ පළපුරුදු සංචාරක සේවකයින් රට අතහැර ගියා. ඒ අය ඉතා ම හොඳ අත්දැකීම් තිබෙන සේවකයින්. සංචාරකයින් පැමිනෙන්නේ හොඳ සේවාවක් අපේක්ෂාවෙන්. එම සංචාරකයින් වෙනුවෙන් ගුණාත්මක සේවාවක් ලබාදීමට අපට පුහුණු සේවකයින් අවශ්‍ය වෙනවා. වර්තමානය වන විට එසේ පළපුරුදු, පුහුණු සේවකයින් ගොඩක් අඩු යි. ඒ නිසා එය මෙම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තුළ පවතින විශාල අභියෝගයක් බවට පත්වෙලා තියෙනවා..."

යටිතල පහසුකම් සංවර්ධනය වී නොතිබීම ද වර්තමානය වන විට සංචාරක කර්මාන්තය තුළ දැකගත හැකි ප්‍රමුඛ අභියෝගයක් බවට පත් ව තිබේ. යම් රටකට හෝ යම් ප්‍රදේශයකට සංචාරක කර්මාන්තය හඳුන්වාදීමේ දී හා එය පවත්වාගෙන යාමේ දී අනිවාර්යෙන් ම දියුණු කළ යුතු පහසුකම් ප්‍රමාණයක් තිබේ. ඒ අතරින්, මාර්ග පද්ධතිය, අපද්‍රව්‍ය කළමනාකරණය, සන්නිවේදන පහසුකම්, පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, විදුලි බලය ප්‍රධාන ලෙස කැපී පෙනේ. ශ්‍රී ලංකාව සුවිශාල සංචාරක ආකර්ෂණයක් දිනාගෙන ඇති රටක් වන අතර, එහි එක් සුවිශේෂ ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ඇල්ල ප්‍රදේශය දැක්විය හැකි ය. ඇල්ල ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණීය ස්ථාන රැසක් පවතී. රාවණා ඇල්ල, පුංචි ශ්‍රී පාදය, ආරුක්කු නමයේ පාලම, ඇල්ල ප්‍රපාතය ඉන් කිහිපයකි. මෙසේ සංචාරක ආකර්ෂණීය ස්ථාන රැසක් පවතින මෙම ප්‍රදේශය තුළ යටිතල පහසුකම් තවමත් ප්‍රමාණවත් පරිදි සංවර්ධනය වී නොමැති බව දැකගත හැක. එබැවින් මෙම ස්ථානවලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇත. වර්තමානය වන විට ඇල්ල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් සඳහා ඇති පහසුකම් ප්‍රමාණවත් වේද? යන ප්‍රශ්නයට ප්‍රතිචාර ලබා දුන් පිරිස අතුරින් ඉහළ ම ප්‍රතිශතය වන 64%ක ප්‍රමාණයක් ඇල්ල ප්‍රදේශයේ පවතින පහසුකම් දුර්වල බව දක්වයි. 20%ක ප්‍රමාණයක් පහසුකම් සාමාන්‍යයයි යන්නත්, 10%ක ප්‍රමාණයක් ඉතා දුර්වල බවත්, 6%ක් පවතින පහසුකම් හොඳ බව දක්වයි.

ප්‍රස්ථාරය 03: ඇල්ල ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් සඳහා ඇති පහසුකම්




(මූලාශ්‍රය :නියැදි සමීක්ෂණය ,2023)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සමීක්ෂණය හරහා ලබාගත් දත්ත අනුව, ඇල්ල නගරය වර්තමානය වන විට සංචාරක පුරවරයක් බවට පත්ව ඇති නමුත් සංචාරකයින්ට හා ප්‍රදේශවාසීන්ට හිතකර ආකාරයට ප්‍රදේශය ආශ්‍රිත ව පහසුකම් වර්ධනය වී නොමැත. එමනිසා විවිධ ගැටලුවලට සංචාරකයින් හා ප්‍රදේශවාසීන් මුහුණපාන අතර, අවශ්‍ය පහසුකම් විධිමත් ආකාරයට සැලසුම් නොවී ක්‍රියාත්මක වීම හේතුවෙන් නගරය ආශ්‍රිත ව පවතින ගැටලු උග්‍ර වී තිබේ. ඒ අතර සංචාරක නවාතැන්, හෝටල්, ආපන ශාලා මගින් තම අපද්‍රව්‍ය අවිධිමත් ආකාරයට කානු පද්ධතිය තුළට බැහැර කිරීම, ඇල්ල නගරය ආශ්‍රිත ව මලාපවහන පද්ධතියක් නොමැති වීම, දර්ශනීය ස්ථාන නැරඹීමට යන අතුරු මාර්ග අබලන් වී තිබීම ඉන් කිහිපයකි.

ඡායාරූපය 01: අබලන් හා කැළෑවෙන් වැසුණු අතුරු මාර්ගයන්





(මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023)

 © 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රවාහන පහසුකම් සපයන්නා සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාන්හි දී අනාවරණය වුයේ;

> "මෙම ප්‍රදේශය තුළ ආරුක්කු නමයේ පාලම, පුංචි ශ්‍රී පාදය, ඇල්ල ප්‍රපාතය, රාවණා ඇල්ල වැනි සංචාරක ආකර්ෂණීය ස්ථාන රැසක් පවතින අතර, එම ස්ථාන නැරඹීම සඳහා දේශීය විදේශීය සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණෙනවා. නමුත් යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි මෙම ස්ථානවල නැහැ. මෙම ප්‍රදේශය තුළ පානීය ජලය, විදුලිය වැනි මූලික පහසුකම් පවා සපුරා නැහැ. පොදු වැසිකිළි, කැසිකිළි පහසුකම් නැහැ. නගරයේ තිබෙන ඇළ මාර්ගය අපිරිසිදුයි. හෝටල්වලින්, ආපනශාලාවලින් අසූචි පවා එම ඇල මාර්ගයට බැහැර කරනවා. වැහි කාලයට මුළු නගරය ම ගඳ ගහනවා. ඒ වගේ ම තමයි දර්ශනීය ස්ථාන නැරඹීමට යන අතුරු මාර්ගයන් අබලන් වෙලා තියෙන්නේ. ඒ වගේ ම පැමිණෙන සංචාරකයින්ට ඇතැම් ස්ථාන නැරඹීමට යන්න ඕනි කැලේ මැදින් මොකද පාර දෙපැත්තෙ තණකොළවලින් වැහිලා. ඒ වගේ ම මාර්ග අබලන් වීම නිසා වාහනවලට ද විශාල අලාභ හානි සිදු වෙනවා...."

අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා පරිසරය දූෂණය වීම මෙම ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය මුහුණ දෙන තවත් එක් අභියෝගයකි. ප්‍රදේශයක හෝ ස්ථානයක ගැවසෙන සංචාරකයින් ප්‍රමාණය ඉහළ යාමත් සමඟ ඔවුන් ඉවත දමන අපද්‍රව්‍ය නිසාවෙන් පරිසරයට හානි පැමිණේ. එමෙන් ම සංචාරකයින් හට සේවා සපයන ව්‍යාපාර නිසි පරිදි අපද්‍රව්‍ය බැහැර නොකිරීමෙන් ද දැඩි පරිසර හානියක් සිදු වේ. විශේෂයෙන් හෝටල් හා ආපන ශාලා ආශ්‍රිත ව මෙවැනි හානි වැඩි වශයෙන් දැකගත හැක. මෙම තත්ත්වය ප්‍රවාහන පහසුකම් සපයන්නා සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී තවදුරටත් තහවුරු විය.

> "මෙම ප්‍රදේශයට දෙස් විදෙස් විශාල සංචාරකයින් ප්‍රමාණයක් පැමිණෙනවා. ඔවුන් ගනු ලබන ආහාර පාන, වෙනත් අපද්‍රව්‍ය තැන තැන දමා යනවා. ප්ලාස්ටික්, පොලිතින් වැනි දේවල් ඒ අතර වෙනවා. මෙලෙස අපද්‍රව්‍ය පරිසරයට දැමීම නිසා පරිසරය දූෂණය වෙනවා. ඒ වගේ ම ඉවතලන අපද්‍රව්‍ය සතුන් ආහාරයට ගෙන සතුන්ට ලෙඩ රෝග වැලඳෙනවා. සතුන් මිය යනවා...."

නියැදි සමීක්ෂණයේ ප්‍රතිචාරවලට අනුව, සංචාරක කර්මාන්තය බිඳ වැටීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මෙන් ම සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් මුහුණ දුන් අභියෝගයන් මෙලෙස හඳුනාගත හැක. එහිදී පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ පෞද්ගලික වශයෙන් ඔවුන් මුහුණ දුන් අභියෝගයන් ජයගත හැකි වී තිබේද? යන ප්‍රශ්නයට ප්‍රතිචාර ලබා දුන් පිරිස අතුරින් 64%ක ප්‍රමාණයක් එම අභියෝගයන් ජයගත හැකි වී නොමැති බව දක්වයි. 23%ක ප්‍රමාණයක් තරමක් දුරට එම අභියෝගයන් ජය ගත හැකි වී තිබෙන බවත්, 13%ක ප්‍රමාණයක් එම අභියෝගයන් ජයගත හැකි වී තිබේ යන්නත් දක්වයි.

### සංචාරක ගමනාන්තයක් වෙත සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා තල්ලු කිරීමේ හා ඇද ගැනීමේ න්‍යායේ භාවිතය (Push & Pull Theory)

සංචාරක අභිප්‍රේරණය යනු මානසික ක්‍රියාවලියක් වන අතර, එමගින් යම් පුද්ගලයකු යම් සංචරණයකට සම්බන්ධ වීමට පෙළඹවීමක් ඇති කරනු ලබයි (විජේසුන්දර, 2020). යමෙකුට සංචරණ අභිප්‍රේරණයක් ඇති වූ කල්හි ඔහු හෝ ඇය බොහෝ විට සංචරණයක නිරත වේ. 1977 දී එක්සත් ජනපද ශාස්ත්‍රඥයකු වන ඩෑන් සංචාරක අභිප්‍රේරණය පිළිබඳ ඇද ගැනීමේ හා තල්ලු කිරීමේ න්‍යාය ඉදිරිපත් කර ඇත. යමෙකු යම් සංචාරණ කටයුත්තක නිරත වීමේ දී ඔහුගේ හෝ ඇයගේ එම සංචාරණයට අදාළ තීරණ ගැනීමේ දී මෙම සාධක දෙක ම අදාළ තීරණය කෙරෙහි බලපානු ලබයි. මෙහි දී තල්ලු කිරීමේ සාධක යනු අදාළ පුද්ගලයාගේ අභ්‍යන්තර මානසික චින්තනය මත හටගන්නා සාධක සමුදායක් වන අතර, ඇදගැනීමේ සාධක යනු බාහිර පරිසරයේ බලපෑම මත හටගන්නා සාධක වේ (විජේසුන්දර, 2020).

### තල්ලු කිරීමේ සාධක (Push Factors)

තල්ලු කිරීමේ සාධකය යනු සමාජ මනෝවිද්‍යාත්මක චේතනාවන් හරහා ගමන් කිරීමට ඇති ආශාවන් වන අතර, මිනිසුන් ගමන් කිරීමට පොළඹවන සාධක වේ. තවද, සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාකාරකම් සෙවීමට නැඹුරු වන අභ්‍යන්තර චේතනාවන් ලෙස ද සැලකිය හැක. ඒ අනුව, මෙම සාධකයේ සරල අදහස වන්නේ මිනිසුන් ගමන් කරන්නේ හෝ ඔවුන්ට ගමන් කිරීමට අවශ්‍යය වන්නේ ඔවුන්ගේ අභ්‍යන්තර බලවේග විසින් තල්ලු කර ඇති බැවිනි. තල්ලු සාධක බොහොමයක් අස්පර්ශ වේ. යමෙකුගේ සංචරණයේ දී ඒ සංචරණයට අදාළ තීන්දු තීරණ ගැනීමේ දී ඔහුගේ හෝ ඇයගේ සමාජ මානසික චින්තනය මත හටගන්නා යම් යම් අවශ්‍යතා සපුරාලීමට ඔහු හෝ ඇය උත්සාහ දරනු ලබයි. මෙම සාධක නිසැකව ම අදාළ තීන්දු තීරණ ගැනීම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරනු ලබයි. සංචාරය කිරීමේ තල්ලු කිරීමේ සාධක ලෙස,

- ස්වයං ගවේෂණය හා ඇගයීම
- ලෞකික පරිසරයකින් ගැලවීම
- සැහැල්ලු වීම / විවේකය
- සෞඛ්‍ය හා ශාරීරික යෝග්‍යතා
- පවුල් සමඟ ඇති අන්තර් සබඳතා ගොඩනගා ගැනීම
- සමාජ අන්තර් ක්‍රියා සඳහා පහසුකම් සැලසීම
- ඥාති සබඳතා වැඩි දියුණු කිරීම
- නව්‍යතාවය
- සංස්කෘතික අත්දැකීම්
- දැනුම
- කීර්තිය


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## ඇදගැනීමේ සාධක (Pull Factors)

ඇද ගැනීමේ සාධක යනු නිශ්චිත දේවල් හෝ ඕනෑම ගමනාන්තයක් වෙත තනි තනි ව ඇද ගන්නා හෝ ආකර්ෂණය කරන සියලු ම බාහිර සාධක වේ. මෙය හඳුනාගත් අවශ්‍යතා හා ආශාවන් සපුරාලීම සඳහා පුද්ගලයෙකු ගමන් කරන ස්ථානයට බලපාන බාහිර සාධක ලෙස ද හැඳින්විය හැක. ගමනාන්තය තෝරාගැනීමේ දී ගමනාන්තයක බාහිර ලක්ෂණ වෙත ආකර්ෂණය වන අතර, ඒවා ඇදීමේ සාධක වෙයි. එය ආකර්ෂණීය ස්ථාන, දේශගුණය, පහසුකම්, වැඩසටහන් හා ක්‍රියාකාරකම්, උත්සව, විනෝදාස්වාදය, සාප්පු සවාරි, රාත්‍රී සාද හා වැඩසටහන්, පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක් වීම, සුදුසු ඉඩකඩ, ආරක්ෂාව, ඔරොත්තු දෙන සංචාරක කලාපයක් වීම, ගමනාන්තය තුල පවතින ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම්, ඓතිහාසික වැදගත්කම්, විවිධත්වයක් තිබීම, සාම්ප්‍රදායික ආහාර, එළිමහන් ක්‍රීඩා, ත්‍රාසජනක ක්‍රියා, ස්වභාවික සම්පත්, ප්‍රචාරය කිරීමට දරන උත්සාහයන් යනා දී සාධක සංචාරකයන් ඇද ගැනීමේ සාධක අතර වේ.

සංචාරක ගමනාන්තයක් යනු යම් සංචාරකයෙකු හෝ සංචාරකයින් කණ්ඩායමක් විසින් සිය නිවාඩුව ගත කිරීමට හෝ නිවාඩු කාලය තුළ නැරඹීමට තෝරාගනු ලබන ස්ථානයක් හෝ ප්‍රදේශයක් වේ. ඒ අනුව, ඇල්ල ශ්‍රී ලංකාවේ පවතින සුප්‍රසිද්ධ වූ විශාල සංචාරක ආකර්ශනයක් ලබා ගත් සංචාරක ගමනාන්තයකි. සංචාරය සඳහා ගමනාන්තයක් තෝරා ගැනීමේ දී සංචාරකයින් අභිප්‍රේරණය කරන හේතු සාධක දෙකක් ඉහතින් සාකච්ඡා කර ඇත. ඒ අනුව, බිඳ වැටීමට ලක් ව ඇති ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙන් ම ඇල්ල සංචාරක ගමනාන්තය වෙත තවදුරටත් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා මෙම සාධක ද්විත්වයේ භාවිතය සුවිශේෂ වේ. ඇල්ල නගරයට පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රධාන අරමුණ වන්නේ, ඇල්ල ප්‍රදේශයේ පවතින ස්වභාවික සෞන්දර්යාත්මක ස්ථාන හා බැඳී අත්දැකීම් ලබා ගැනීමයි. එබැවින් ඇල්ල ආශ්‍රිත ව පවතින සංචාරක කර්මාන්තයේ පදනම වී තිබෙන්නේ ස්වාභාවික පරිසරය හා ඒ ආශ්‍රිත වූ දර්ශනීය ස්ථානයන් ය. ස්වභාවිකව පරිසරය හා බැඳි අත්දැකීම් මගින් සංචාරකයින්ගේ විනෝදාස්වාදය ඉහළ නැංවීම, සංචාරක ප්‍රජාවගේ පහසුව ඉහළ නැංවීමට අවශ්‍යය පහසුකම් හා නගරය ආශ්‍රිත ව යටිතල පහසුකම් ඉහළ නැංවීම මගින් නගරය තුළ සුවපහසු පරිසරයක් ඇති කර ගැනීම හරහා සංචාරකයින් විශාල ප්‍රමාණයක් ඇද ගැනීමේ හැකියාවක් ලැබේ. ඉහත සඳහන් ආකාරයට ඇද ගැනීමේ සාධක අතර ගමනාන්තය සතු ව පවතින පහසුකම් ප්‍රමුඛ වේ. එහි දී යටිතල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් හා මූලික පහසුකම් ප්‍රමුඛ වේ. ඊට අමතර ව මූල්‍ය පහසුකම්, වාහන නැවතීමේ පහසුකම්, ඇවිදින මංතීරු, දර්ශනීය නැරඹුම් මන්දිර, මහා මාර්ග සංවර්ධනය, අතුරු මාර්ග සංවර්ධනය, සෞඛ්‍යය පහසුකම් ඒ අතර වේ. නමුත්, ඇල්ල නගරය යනු සංචාරක කර්මාන්තය සමග නැගී එන ප්‍රදේශයක් වුව ද, පැමිණෙන සංචාරක ප්‍රජාව සඳහා අවශ්‍ය පහසුකම් විධිමත් ලෙස නොමැති ගමනාන්තයකි. එනිසා සංචාරක ගමනාන්තය තුළ මෙම සියලු ම පහසුකම් සපුරාලීම හරහා සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇද ගැනීමේ හැකියාව පවතී. මෙලෙස බලන කළ පෙනීයන්නේ සංචාරකයින්ට අවශ්‍ය මූලික පහසුකම් පවා මෙම ප්‍රදේශය තුළ නොමැති බවය. නමුත් තවමත් එහි සංචාරකයින් වැඩි වශයෙන් ආකර්ශනය වී සිටීයි. තවදුරටත් මෙම ප්‍රදේශයට සංචාරකයන් වර්ධනය කර කරගැනීමට මෙන් ම තවදුරටත් ඔවුන් ව ආකර්ෂණය කර ගැනීම සඳහා ඇදගැනීමේ සාධක මෙම ප්‍රදේශය තුළ සංවර්ධනය කළ යුතු යි. පහසුකම්වලට අමතර ව, ගුණාත්මක සේවාවක් ලබාදීම, විනෝදාස්වාදය, ත්‍රාසය සපයන විවිධ ක්‍රියාකාරකම් සහ වැඩසටහන් පැවැත්වීම, ආරක්ෂාකාරී, ග්‍රාමීය අත්දැකීම් ලබාදෙන, දේශීය සහ සාම්ප්‍රදායිකව හඳුන්වාදෙන සංචාරකයින් අපේක්ෂා කරන මට්ටමටත් වඩා ඔවුන් ව තෘප්තිමත් කළ හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම මෙහිදී කළ යුතු වේ.

### බිඳ වැටීමට ලක්ව ඇති සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි උපායමාර්ග විසඳුම්

- **සංචාරක ආකර්ෂණීය ස්ථානවල පහසුකම් සංවර්ධනය කිරීම**

නිසි ලෙස නඩත්තු කළ පොදු වැසිකිළි, පිරිසිදු ජලය, අන්තර්ජාල හා අනෙකුත් සංනිවේදන සේවාවන් නගරවල හා සංචාරක කේන්ද්‍රස්ථානවල පැවතිය යුතු අතර, විධිමත් සැලසුම්කරණයක් යටතේ සිදුවිය යුතුය. නමුත්, ඉහත සඳහන් කළ ආකාරයට ඇල්ල නගරය තුළ හා එහි සංචාරක ආකර්ෂණීය ස්ථානවල එවැනි පහසුකම් නොමැත. අවිධිමත් කැලිකසල කලමනාකරණය, කාණු පද්ධතියේ පවතින දුර්වලතා, විධිමත් අපජල හා මලාපවහන පද්ධතියක් නොමැති වීම, සනීපාරක්ෂක පහසුකම්, මහා මාර්ග හා අතුරු මාර්ග සංවර්ධනය, සෞඛ්‍යය පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති බැවින් ඇල්ල නගරය සංවර්ධනය කළ යුතුය. කුළුබඩු වෙළඳසැල් හිමියකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී මෙම තත්ත්වය තවදුරටත් තහවුරු විය.

"නාගරික ප්‍රදේශවල වැසිකිළි පහසුකම් තියෙන්න ඕනි. ඇල්ල මෙතරම් විශාල සංචාරක ආකර්ෂණයක් ලබාගෙන තියෙන සංචාරක ගමනාන්තයක් වුණත් ඒ තුළ පොදු වැසිකිලි පද්ධතියක් පවා නොමැති වීම කණගාටුවට කරුණක්. සනීපාරක්ෂක පහසුකම්, යටිතල පහසුකම් අනිවාර්යෙන් ම මෙම ප්‍රදේශය තුළ සංවර්ධනය කරන්න ඕන. මොකද රටට පැමිණෙන සංචාරකයින් ඔවුන්ගේ මව් රටට ගියාම ඔවුන් විසින් සංචාරක ගමනාන්තය පිළිබඳ ලබා දෙන හොඳ ප්‍රතිචාර අනුව තවදුරටත් සංචාරකයින් වැඩි කරගන්න පුළුවන්..."

- **සංචාරක සේවාවන් හා එම සේවාවන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම**

විදේශීය සංචාරකයින්ගෙන් අනිසි ලෙස සිදු කරනු ලබන ඉපයීම් නවතා දැමිය යුතු යි. මන්ද, සංචාරකයින් ඔවුන්ගේ සංචාරය අතරතුර බොහෝ ගැටලු සඳහා දොස් පවරන බව අනාවරණය විය. දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතිකරණයට අනුකූල ව සියලු ම සේවා සපයන්නන්ගේ තත්ත්වය හා මට්ටම ද වැඩි දියුණු කළ යුතු යි. ඌව පළාත් සංචාරක


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


අමාත්‍යාංශයේ නිලධාරියකු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී මෙය තවදුරටත් තහවුරු විය.

> "තනි තනි වශයෙන් පුද්ගලයින්ගේ ආකල්ප සංවර්ධනය වෙන්න ඕනි. තමන් ම විනයක් හදාගෙන තමන් ම ආගන්තුක සත්කාර කරලා, පැමිණෙන සංචාරකයන් සූරගෙන කන්නෙ නැතිව ඔවුන්ට හොඳ ගුණාත්මක සේවාවක් ලබා දෙන්න ඕන. ඒ හරහා තමන්ට ම හොඳ ආදායමක් ලබාගන්න පුළුවන්. දැන් අපේ රටේ මිනිසුන් රුපියල් 500 වැඩේ 1000න් කරන්න යන්නේ. සංචාරකයන් සූරගෙන කනවා. එසේ නොකළ යුතු යි…."

දත්ත දායකයින් දැක් වූ අදහස්වලට අනුව, ඇල්ල ප්‍රදේශයට සංචාරකයන්යින් රැගෙන එන ඇතැම් සංචාරක මගපෙන්වන්නන්, සංචාරක ප්‍රවාහන පහසුකම් සපයන්නන් යනාදීන් විසින් අසාධාරණ ලෙස ව්‍යාපාරවලින් කොමිස් ගැනීම් සිදු කරයි. තවද, ඇතැම් ව්‍යාපාරිකයින් පවසන්නේ කොමිස් ලබා නොදීම හේතුවෙන් සිය ව්‍යාපාරය කරා පැමිණෙන සංචාරකයන් ආපසු හරවා යවන අයුරු දැක ඇති බවයි. ඔවුන් ප්‍රකාශ කරන්නේ මෙලෙස කොමිස් ගැනීම් සම්බන්ධයෙන් කිසිදු නීතියක් නොමැති බවයි. එමනිසා මෙම අසාධාරණ තත්ත්වයන් වළකාලිය යුතු යි. එමෙන් ම රජය විසින් ද ලංකාවේ දී අනවශ්‍ය ලෙස විදේශීය සංචාරකයින්ගේ මුදල් ගැනීම් සිදු කරයි. උදාහරණයක් ලෙස, ඇල්ල ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණීය ස්ථානයක් වන ඇල්ල ප්‍රපාතය හෙවත් ඇල්ල රොක් නැරඹීමට වර්තමානය වන විට ටිකට් පතක් මිලදී ගැනීමට සිදුවී ඇත. එලෙස සිදු කරනු ලබන අනවශ්‍ය මුදල් ලබා ගැනීම්වලින් වැළැකී සිටිය යුතු යි.

- **සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා රජයේ සක්‍රිය මැදිහත්ව වීම අත්‍යවශ්‍ය වේ**

ප්‍රස්ථාරය 04: සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම




(මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2023)

නියැදි සමීක්ෂණය ඔස්සේ ලබා ගත් දත්තවලට අනුව, ඇල්ල ප්‍රදේශයේ බිඳ වැටීමට ලක් වූ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම පිළිබඳ ව සෑහීමකට පත් වේද? යන ප්‍රශ්නයට ප්‍රතිචාර ලබා දුන් පිරිස අතුරින් ඉහළ ම ප්‍රතිශතය වන 79%ක ප්‍රමාණයක් රජයේ මැදිහත්වීම සෑහීමකට පත් නොවේ යන්න දක්වයි. 20%ක ප්‍රමාණයක් තරමක් සෑහීමකට පත් වේ යන්නත් 1% ප්‍රමාණයක් සෑහීමකට පත් වේ යන්න දක්වයි. ඒ අනුව පැහැදිලි වන්නේ, ඇල්ල ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම ඉතා අවම මට්ටමක පවතින බවයි. ඒ අනුව, සංචාරකයින් වර්ධනය කරගැනීම සඳහා සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්විය යුතු අතර, සංචාරක අවශ්‍යතාවන් හඳුනාගෙන ඊට ගැළපෙන ලෙස සංචාරක ප්‍රවර්ධන කටයුතු රජය විසින් කළ යුතුය. එමෙන් ම සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස්හට කෙටිකාලීන හෝ පුහුණු හා සංවර්ධන වැඩසටහන් පැවැත්විය යුතු අතර, ඔවුන් ව සවිබල ගැන්වීමට රජය අනුග්‍රහය දැක්විය යුතුයි. රජයේ සක්‍රිය මැදිහත්වීම් මගින් හිතකර සහන හා සහන පැකේජ ලබාදිය යුතුයි. බදු බර අඩු කිරීම, කර්මාන්ත යළි ගොඩනැගීමට හිතකර ප්‍රතිපත්ති සහ උපාය මාර්ග, සංචාරක සේවක සහන පැකේජයන් ආදී පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුයි. ජාතික මෙන්ම ප්‍රාදේශීය සභා මට්ටමින් රජයේ මැදිහත්වීම ඇතිව නිසි වෙළඳපල ප්‍රවේශ උපාය මාර්ග දියත් කිරීමට කටයුතු කළ යුතු යි.

- **ඇල්ල නගරය විධිමත් නගර සංවර්ධන සැලැස්මක් යටතේ ගොඩනැගීම**

ඇල්ල නගරය සංචාරක කර්මාන්තය මගින් දියුණු වීම මත එම නගරය ආශ්‍රිත ව පවතින හෝටල් හා සංචාරක ලැගුම්හල් ප්‍රමාණය අදවන විට ඉහළ ගොස් පවතී. මෙම ඉදිකිරීම් කටයුතු විධිමත් ව නියාමනය නොවීම හේතුවෙන් ඇල්ල නගරය තුළ දර්ශනීය


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ස්ථාන ආවරණය වීම හා නගරය ආශ්‍රිත ව පවතින අනවසර, නොගැලපෙන ඉදිකිරීම් හේතුවෙන් නගරයේ තදාසන්න පරිසරයක් නිර්මාණය වී ඇත. අක්‍රමවත් නගර වින්‍යාසය හේතුවෙන් වාහන නවාතැන්පලක් නොමැතිවීම නිසා අවිධිමත් ලෙස රථවාහන නවතා තැබීම, වීදි රේඛා උල්ලංඝනය කර ගොඩනැගිලි ඉදිකිරීම, නගරය තුළ ඇවිදින මංතීරු නොමැතිවීම, විධිමත් විදුලි ආලෝක පද්ධතියක් නොමැති වීම යන ගැටලුකාරී තත්ත්ව රාශියක් මෙම නගරය තුළ දැකගත හැක. එබැවින් විධිමත් ලෙස ඇල්ල නගරය සැලසුම් කර වැඩි සංචාරක ආකර්ශනයක් ලබාගත හැක.

- **සංචාරකයින් ආකර්ෂණය කළ හැකි දේශීය විභවතා තුළින් ක්‍රියාකාරකම් හා වැඩසටහන් නිර්මාණය කිරීම**

බොහෝ සංචාරකයින් ශරීරයට හිතකර, මානසික සුවය සලසන, ගුණත්වයෙන් ඉහළ කෑමබීම කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වයි. වසංගතයෙන් පසු ග්‍රාමීය වශයෙන් සංචාරකයින් මානසික සුවතාවට දක්වන අවධානය ඉහළ ගොස් ඇත. එබැවින් ඒ පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්වීමට කටයුතු කළ යුතු යි.

## නිගමනය

පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝගයන් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මූලික කරගෙන විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනය ඔස්සේ සිදු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය අභියෝගයට ලක්වීමට බලපෑ හේතු සාධක, පශ්චාත් කොවිඩ් සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග, බිඳ වැටීමට ලක්ව ඇති සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි උපායමාර්ගික විසඳුම් පිළිබඳ මෙම අධ්‍යයනය තුළ විශ්ලේෂණය කරන ලදී. එහිදී දත්ත දායකයින් ලෙස ඇල්ල ප්‍රදේශයේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත පිරිස් යොදාගනු ලැබීය. ඒ අනුව, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මූලික කරගෙන පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග අධ්‍යයනය කිරීම මගින් අනාවරණය වූයේ, වර්තමානය වන විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර විශේෂයෙන් ම අවධානයට ලක්ව තිබෙන බවයි. තවද, එම ප්‍රදේශය තුළ වර්තමානය වන විට සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත ව පුහුණු සේවකයින් නොමැති වීම සංචාරක කර්මාන්තය මුහුණ දෙන ප්‍රමුඛත ම අභියෝගයක් වී ඇති බවද අනාවරණය වුණි. මෙම අධ්‍යයනය ඔස්සේ අවසාන වශයෙන් එළඹිය හැකි නිගමනය වනුයේ, පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රබල ලෙස අභියෝගයට ලක්ව ඇති බවයි. එම අභියෝගයන් ජය ගැනීම සඳහා මෙන්ම සංචාරක කර්මාන්තය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ මැදිහත්වීම ඉතා අවම මට්ටමක පවතී. නමුත්, සංචාරක කර්මාන්තයෙහි ප්‍රවර්ධනය රජයට පමණක් හුදකලාව සිදු කළ නොහැකි අතර, ඒ සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය මෙන් ම සමස්ත ප්‍රජාවේ ම සම්බන්ධීකරණයක් අවශ්‍ය බව පැහැදිලිය. සමීක්ෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ඇල්ල ප්‍රදේශය මෙන් ම සමස්ත ශ්‍රී ලංකාවේ ම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත යුතු උපාය මාර්ගික විසඳුම් රැසක් පිළිබඳ ව සාකච්ඡාවට ලක් වුණි. මෙම උපායමාර්ගික විසඳුම් නිසි ලෙස මෙම ප්‍රදේශය තුළ මෙන් ම සමස්ත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නැංවීම මගින් නිසැකව ම සංචාරක කර්මාන්තයේ අභියෝගයන් ජය ගත හැකි වනවා සේම, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ හැකියාව පවතී යන්න නිගමනය කළ හැක. පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් සිදු කරනු ලබන මෙම අධ්‍යයනය තුළින් වර්තමානය සඳහා වූ පර්යේෂණ දිශානතීන්ද හඳුනාගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


Arachchi, R. S. S. W., & Gnanapala, W. K. A. C. (2020). Impact of COVID-19 and the Future of Tourism Employments in Sri Lanka: A Route to Recovery and Resilience.

Central Bank of Sri Lanka. (2021). *Central Bank Report.* Retrieved from https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-reports/annual-report-2021

Central Bank of Sri Lanka. (2022). *Central Bank Report.* Retrieved from https://www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-reports/annual-report-2022

Hoque, A., Shikha, F. A., Hasanat, M. W., Arif, I., & Hamid, A. B. A. (2020). The effect of Coronavirus (COVID-19) in the Tourism Industry in China. Asian Journal of Multidisciplinary Studies, *3*(1), 52-58.

Samarathunga, W. (2020). Post-COVID19 Challenges and Way Forward for Sri Lanka Tourism . *SSRN.*

SLTDA. (2020). *Sri Lanka Tourism Development Autority, Annual Statistical Report.* Retrieved from https://sltda.gov.lk/en/annual-statistical-report

Thushanga, Y. Thilani., and Ranjana, U. K. Piyadasa. (2021). "The Effect of COVID 19



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Pandemic to the Tourism Industry in Sri Lanka." *International Journal for Research in Applied Science and Engineering Technology* 9(5): 863–70.

Yadav, S. K. S., & Qureshi, M. M. (2021). Impacts of COVID-19 on Indian travel & tourism industry. *Int. J. of Trade and Commerce-IIARTC*, *9*(2), 310-318.

ජයවීර, ව. (2022). සංචාරක ව්‍යාපාරය නැංවීමට අලුත් ප්‍රවේශයක්. *Dinamina* (December 2, 2022).

මල්කාන්ති, එ. (2020). ශ්‍රී ලංකාවේ කෘෂි සංචාරක කර්මාන්තය කාලීන විග්‍රහයක්. කොට්ටාව: සාර ප්‍රකාශනය (December 2, 2022).

විජේසුන්දර, න. (2020). සංචාරක කර්මාන්තයට ප්‍රවේශයක්. Nugegoda: Neo graphics(pvt) Ltd (December 2, 2022).


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පහළොස්වන කලාපය 2025 දෙසැම්බර්
පිටු 22-29
ISSN 1800-1459 eISSN 2386-2041
© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# අනුරාධපුර රාජ්‍ය අවධියේ මෙරට ආර්ථිකය හා බැඳි නෛතික විධිවිධාන සහ ඒවායේ තිරසාර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# (An Investigative Study of the Legal Provisions Related to the Economy of the Anuradhapura Kingdom and Their Sustainable Application)

ආර්. කේ. එම්. ට්‍රිලීෂියා ඉන්ද්‍රාණි

ඉතිහාස සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
rkmt@sjp.ac.lk

## Abstract

This study investigates the legal and institutional arrangements adopted by past rulers in organising the economic processes of the Anuradhapura Kingdom. The research addresses the main problem of how the economic policies implemented during this period influenced the sustainability of the state economy. The primary objective is to identify sustainable state economic policies practiced by the rulers to ensure long-term economic stability. The study also pursues several sub-objectives, including identifying the state economic systems in place, examining the principles and legal frameworks governing the economy, and analysing the management of state income and expenditure. This research employs a qualitative methodology, drawing upon literary and epigraphic sources. According to encyclopedic definitions, law is understood as customary practices and norms established to regulate social and economic activities. In the context of ancient Sri Lanka, law is defined as the practices prescribed by early kings and observed in accordance with established traditions. An analysis of primary sources reveals significant state intervention in managing economic activities such as paddy cultivation, irrigation, internal and external trade, markets, and other income-generating sectors. Strategic management of tax revenue and resource allocation further reflects the rulers' long-term economic vision. The findings suggest that the sustainability of Sri Lanka's historical economy was largely influenced by these well-structured state economic policies. Conversely, periods of unsustainable development can be directly linked to the adoption of ineffective or unsustainable economic policies. Thus, the study concludes that the nature of state economic policy during the Anuradhapura Kingdom period had a direct impact on the sustainability of the country's economic development.

**Keywords**: Cultivation, Economic policies, Sustainable development, Legal provisions

## සාරසංක්ෂේපය

ආර්ථික ක්‍රියාවලියේ සංවිධිතභාවය උදෙසා වූ අතීත පාලකයන් අනුගමනිත නෛතික විධිවිධාන පිළිබඳ විමසුමක් මෙම අධ්‍යයනය ඔස්සේ සිදු කෙරිණ. අනුරාධපුර රාජධානි අවධියේ මෙරට පාලකයන් විසින් ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්ති රාජ්‍ය ආර්ථික තිරසාරත්වය උදෙසා සිදු කළ බලපෑම කෙබඳු ද යන පර්යේෂණ ගැටලු ව ඔස්සේ මෙම පර්යේෂණය මෙහෙයවා ඇත. රාජ්‍ය ආර්ථික තිරසාරත්වය උදෙසා මෙරට පාලකයන් විසින් අනුගමනය කරන ලද තිරසාර රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති කවරේද යන්න විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූ අතර මෙරට ක්‍රියාත්මක රාජ්‍ය ආර්ථික ක්‍රමවේද හඳුනා ගැනීම, රාජ්‍ය ආර්ථිකය හා බැඳි න්‍යායයන් සහ නෛතික ව්‍යුහය හඳුනා ගැනීම, ආදායම් සහ වියදම් කළමනාකරණය කළ ආකාරය පිළිබඳ හඳුනා ගැනීම වැනි අනු අරමුණු රැසක් මෙම අධ්‍යයනය සඳහා පාදක කර ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ දී භාවිත පර්යේෂණ ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යි. විශ්වකෝෂයේ නීතිය නිර්වචනය කර ඇත්තේ "ප්‍රජාව හා බැඳුණා යැයි සම්මත චාරිත්‍ර, ව්‍යවහාරයන් සහ ප්‍රජාව පවත්වාගෙන යාමට උපකාරී වන තත්ත්වය යි." යනුවෙනි. පැරණි ශ්‍රී ලංකාවේ නීතිය සම්බන්ධ ප්‍රාථමික මූලාශ්‍රයක් වශයෙන් වැදගත් වන නීති නිඝණ්ඩුවේ නීතිය හඳුන්වා ඇත්තේ "පළමු රජ දරුවන් විසින් නියම කරන ලද ව්‍යවහාර යුක්ති නොකඩ කොට එම ලෙස ම පැවැත්වීම නීති නම් වන බවයි." සාහිත්‍ය සහ අභිලේඛන මූලාශ්‍රය අන්තර්ගතයන් පරීක්ෂා කිරීමෙන් මෙරට වී ගොවිතැන ඇතුළු ආර්ථික වගා ක්‍රමවේද, අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම, වෙළඳපොළ ඇතුළු සියලු ම ආර්ථික උත්පාදක ක්‍රමවේදයන් නිසි පරිදි කළමනාකරණය කර ගැනීම සඳහා සිදු කළ රාජ්‍ය මැදිහත්වීම පිළිබඳ හඳුනා ගත හැකි වේ. සමකාලීන ලෝක සංදර්භය තුළ ශ්‍රී ලංකාව ඉහළ තැනක වැජඹුනේ මෙසේ අනුගමනය කරන ලද රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්තියේ තිරසාරත්වය නිසා ය. අතීතයේ ලබා ගත් බදු ආදායම් පවා රාජ්‍ය ආර්ථික ප්‍රවර්ධනය සඳහා උපායශීලී ව යොදවා ගැනීමට තරම් පාලකයාගේ දැක්ම විශේෂ එකක්

විය. ඒ අනුව අනුරාධපුර රාජධානි අවධියේ මෙරට පාලකයන් විසින් අනුගමනය කරන ලද තිරසාර රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති මෙරට තිරසාර සංවර්ධනය උදෙසා සෘජු බලපෑමක් කළ බව නිගමනය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචන:** ආර්ථික ප්‍රතිපත්ති, තිරසාර සංවර්ධනය, නෛතික විධිවිධාන

## හැඳින්වීම

සිංහල සංස්කෘතියේ සමාරම්භය මිහිඳු හිමියන්ගේ පැමිණීමට පෙර වූවක් බව බොහෝ වියතුන්ගේ මතය වේ. මහින්දාගමනයට පෙර සිංහල සංස්කෘතියේ ආරම්භය සිදු වී වැව් සංස්කෘතිය ආරම්භ වූ බවට මාටින් වික්‍රමසිංහ (වික්‍රමසිංහ, 2006: 10) දක්වන අදහස මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න විසින් ද පිළිගනියි (සෙනෙවිරත්න, 1998: 46). විජයාගමනයෙන් මෙරට ඉදි වූ අනුරාධ ග්‍රාමය මූලික කරගෙන නව කෘෂිකාර්මික දියුණුවක් ඇති වේ. මහාවංසයේ සඳහන් තොරතුරුවලට අනුව මෙරට ඉදි වූ ආදිත ම වැව ලෙස හඳුනාගනු ලබන්නේ ක්‍රි. පූ. හතරවැනි සියවසේ ඉදිකරන ලද බසවක්කුලම ය (මහාවංසය, 1996). සිංහල ජනයා ස්වකීය ජල කළමනාකරණ ශක්‍යතාව මත නිර්මිත වූ මුල්කාලීන ශිෂ්ටාචාරය තුළින් මානව වංශයේ සුවිශේෂ ස්ථාවරත්වයකට පත් ව ඇත. සිංහලයා සතු සංවර්ධිත වාරි තාක්ෂණ ඥානය සහ බෞද්ධ ස්මාරක ලොව මවිතයට පත් කිරීමට හැකි විය. වැව සහ දාගැබ පදනම් වූ ආර්ථික රටාවක් බිහිවීම ද සුවිශේෂ අවස්ථාවකි. මෙම පරිසරය තුළ ප්‍රධාන ආහාරය බත් වීමත් සහල් සපයා ගැනීමට කුඹුරු කිරීමේ දී වැව් මගින් ජලය ලබාගැනීමත් නිසා විවිධ උපකරණ, සාමූහික ක්‍රියා පිළිවෙත් සහිත නව සංස්කෘතියක් පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී ගොඩ නැගිණ. මෙම පසුබිම හෙළ සංස්කෘතියේ පදනම බවට පත් වේ. ප්‍රධාන ආහාරය ලෙස සහල් සපයා ගැනීම නිසා වැව, රැකියා සම්මුති සහ ජීවනෝපාය මත පදනම් ව ගොඩනැගෙන සංස්කෘතිය මාටින් වික්‍රමසිංහයන් හඳුනාගන්නේ "සහල් සභ්‍යත්වය" යනුවෙනි. මිහිඳු හිමියන්ගේ ආගමනය සිංහල සංස්කෘතිය නව දිශාමානයක් කරා මෙහෙය වූ ප්‍රබල ම සංස්කෘතික සාධකයක් වශයෙන් පෙන්වා දිය හැකි ය. ඉන්දියානු පසුබිම තුළ වූවත් අපට ම ආවේණික ආකාරයෙන් මෙම සභ්‍යත්වය පෝෂණය විය. කෘෂිකර්මාන්තය හා බැඳුණු ජන ජීවිතය නැවුම් අයුරින් බුදුසමය හා මුසු වූ අතර "වැවයි දාගැබයි ගමයි පන්සලයි" යන සංකල්පය මත ගොඩනැන්විණ. අපේ රට පෙරදිග ධාන්‍යාගාරය බව ට පත් වන්නේ ම පාලකයන් විසින් රාජ්‍ය ආර්ථික සංවර්ධනය උදෙසා ගත් ප්‍රතිපත්තිමය තීන්දු නිසා ය. ආර්ථික ක්‍රියාවලිය කිසිදු බාධාවකින් තොර ව විධිමත් ව පවත්වා ගැනීම කෙරෙහි පාලකයන් යොමු කළ අවධානය පිළිබඳ සාහිත්‍ය සහ අභිලේඛන මූලාශ්‍ර මගින් තොරතුරු රැසක් ලබා ගත හැකි වේ. ආර්ථික ක්‍රියාවලියේ සංවිධිතභාවය උදෙසා වූ අතීත පාලකයන් අනුගමනිත නෛතික විධිවිධාන පිළිබඳ විමසුමක් මෙම ලිපිය මගින් සිදු කර ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී භාවිත පර්යේෂණ ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යි. සාහිත්‍ය සහ අභිලේඛන ඇතුළු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් ලබා ගත් දත්ත ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමවේදය සහ තේමා විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කර නිගමනවලට එළඹ ඇත.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

අනුරාධපුර රාජධානි සමයේ ආර්ථිකය පිළිබඳ විමසීමේ දී දේශීය හා විදේශීය වශයෙන් ඉතා වැදගත් ස්ථානයක් හිමි ව තිබේ. සමකාලීන ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තය ප්‍රධාන වූ අතර වෙළඳාම ද සාර්ථක ලෙස පැවති බව අභිලේඛන මූලාශ්‍රය මගින් හඳුනාගත හැකි ය. අනුරාධපුර රාජධානි සමයේ දී ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තයට ප්‍රමුඛස්ථානයක් හිමි විය. වී ගොවිතැන ප්‍රධාන වුවත් එකල කෘෂිකර්මාන්තය ක්‍රම දෙකකින් කරගෙන ගිය බවට සාධක ඇත. පළමු ක්‍රමය වූයේ කැලෑ හෙළි කර පිළියෙල කරගත් බිම් කොටස්වල වී ගොවිතැන් කිරීම යි. දෙවන ක්‍රමය මඩ ඉඩම්වල වගා කිරීම යි. ස්වභාවික භූගෝලීය වටපිටාව මෙන් ම වියළි කලාපයන් ආශ්‍රිත ව නිර්මාණය කර තිබූ වාරිමාර්ග පද්ධතිය ද, බහුතර පිරිසකගේ ජීවනෝපාය මාර්ගය වීම නිසාත් සහ රාජ්‍ය අනුග්‍රහයන් ලබා දීමත් මෙකල කෘෂිකර්මාන්තයේ වර්ධනයට බලපාන ලදී. මෙ සමයෙහි ශිලා ලේඛනවල සෘජුව ම කෘෂිකර්මාන්තය පිළිබඳ සඳහන් නොවන අතර පැරණි විහාර හා සම්බන්ධ පරිත්‍යාග, නීති, දඬුවම්, නියෝග පැනවීමේ දී ඒ බව හෙළිදරව් වෙයි (බණ්ඩාර, .2008: 44). නමුත් මෙකල කෘෂිකර්මාන්තය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීමත් සමග ඒ සම්බන්ධයෙන් විවිධ ව්‍යවස්ථාවන් සම්පාදනය කිරීමට පාලකයන් කටයුතු කර ඇත. ඒ අනුව සිව්වැනි මිහිඳු රජුගේ වෙස්සගිරි පුවරු ලිපියේ අනුරාධපුරයේ සිට තිසා වැවෙන් ජලය ලබාගෙන වී වගා කළ, ඉසුරුමුණි විහාරයට අයත් ව තිබූ කිරි එකසිය හතළිස් හතරක් හා එක් පයක් විශාල කුඹුරක් පිළිබඳ ව සඳහන් වේ.

"මෙ දියෙන් කාරෙන වෙහෙර අවට එක්සිය සූ සාලිස් කිරි එක් පයක කුමබුරට් දාන" (කරුණාරත්න, 2000: 14).

"වෙහෙර අවටැ කුමබුරට් දෙන දිය ඩහක්කොට් කෙත් වත්" (කරුණාරත්න, 2000: 14).

ආදී ලෙස කුඹුරු පිළිබඳ ව සමකාලීන අභිලේඛන සාධක මගින් හඳුනාගත හැකි ය. එනම් කුඹුරු වගා කළ ඉඩම් "කුඹුර්, උබර, කෙය සහ වෙල්" යන්න සඳහන් වේ (Inscription of Ceylon¸ Vol. V, 2005: xxxi). ඇතැම් ඉඩම්වල වගා කළයුතු බෝග වර්ගයන් නියම කර තිබූ ආකාරයක් අභිලේඛන මගින් තහවුරු වේ. සිව්වන මහින්ද රජුගේ වෙස්සගිරි පුවරු ලිපියේ සාධකවලින් එය විස්තර වේ.

"මෙ වෙහෙර අවටැ බද් කෙත් වතු(ට්)දාන වවැකින් දිය තබා සිහිනැටි වපු(ර)නු මීසැ මුග්ඇටි නොවපු රනු ඉසා" (කරුණාරත්න, 2000: 14).

මේ අනුව මෙම විහාරය අවට ඇති කෙත්වතුවල මින් ඉදිරියට මුං ඇට වැපිරීම තහනම් වන අතර ඒ වෙනුවට හීනැටි වී වපුරන ලෙස නියෝග දී ඇත.

සිව්වන මහින්ද රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි ද කෘෂිකර්මාන්තය සම්බන්ධ ව්‍යවස්ථාවක් පිළිබඳ


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

තොරතුරු සඳහන් වෙයි. "හස්කරු පරපුරෙන් වැටෙන කරැ කුමබුර් නො වැටියැ හෙත් මුත් හැරැ නො ගතැයුතු" (කරුණාරත්න, 2000: 14).

පිටගම්වලින් පැමිණ කුඹුරුවල සී සාන පුද්ගලයන්ට කිසිදු හිරිහැරයක් හා කරදරයක් නොකළ යුතු බව දෙවන උදය රජුගෙ පඬුවස්නුවර ටැම් ලිපියේ සඳහන් වේ. "මෙ ගැමැ සී කස්නට් ආනට් අනියා නොකරනු ඉච" (Epigraphaia Zelanica¸ Vol. V, 2001: 6).

ඇළකින් ජලය ලබාගෙන වගා කළ ඉඩමකට ජලය ලබා ගැනීමට වෙල් වැස්සන් හා වෙල් කැමියන් යන නිලධාරින් බාධා නොකළ යුතු බවට පස්වෙනි මිහිඳු රජුගේ පොළොන්නරු රජමාළිගා ටැම් ලිපියෙහි ආඥාවක් පනවා ඇත (Inscription of Ceylon¸ Vol. V, 2004: 243***)***. කෘෂිකර්මාන්තයේ සංවර්ධනය සඳහා රජු විසින් මෙවැනි නීති මාලාවක් හඳුන්වා දීමක් සිදුකර ඇත්තේ සමකාලීන සමාජ පසුතලයේ පැවැති යම් යම් දුර්වල තත්ත්වයන් මඟ හරවා ගැනීමට විය හැකිය. විශේෂයෙන් ම රජුගේ නියෝග ප්‍රාදේශීය වශයෙන් ගෙනයාමට මෙම නීති රීති ඉතා සුවිශේෂ මෙහෙවරක් සිදු කළ ආකාරයක් ද හඳුනාගත හැකි ය (විතානච්චි, 2017: 117). අනුරාධපුර යුගයේ දී විශේෂයෙන් අවසාන භාගයේ දී අභිලේඛනවල සඳහන් කරන ආකාරයට පැවති නීති රීතින් ක්‍රියාත්මක වන්නේද යන්න හා කෘෂිකර්මාන්තය ආශ්‍රිත කටයුතු සොයා බැලීමට පත් කළ නිළධාරි මණ්ඩලයක් පිළිබඳ ව විස්තර ද සමකාලීන අභිලේඛන මඟින් හඳුනා ගැනීමට හැකි වේ. මේ නිසා කෘෂිකර්මාන්තය විෂයෙහි පාලකයා දක්වන ලද නෛතික ක්‍රම කෙතරම් පුළුල් ද යන්න හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

වාරිපද්ධති හා බැඳි නෛතික විධිවිධාන ද මෙහි ලා විශේෂයෙන් සාකච්ඡා කළ යුත්තකි. පුරාතන ශ්‍රී ලංකාවේ වී වගාව අති විශාල වශයෙන් සිදු වූයේ මහා පරිමාණයෙන් හා කුඩා පරිමාණයෙන් යුත් ජලාශ දාමයකිනි. අනුරාධපුර රාජධානිය ආරම්භයේ සිට ම මෙරට වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තය විය. ඒ සඳහා වැසි ජලය ප්‍රමාණවත් නොවීම නිසා ආර්යයන් ජලය එක් රැස්කර තබා ගැනීමට සුදුසු භූමි තෝරා වැව් නිර්මාණය කිරීමට ආරම්භය සනිටුහන් කරන ලදී. පසු ව එය විකාශනය වූ අතර රාජ අනුග්‍රාහය සමඟින් මහා පරිමාණයේ වැව් ඉදිවීම ක්‍රි. ව. 01 වැනි සියවසේ සිට ආරම්භ විය. මෙය අනුරාධපුරයේ මැද භාගය වනවිට එහි උපරිම ස්ථානය දක්වා වර්ධනය විය. ඒ සමඟ මෙරට පාලකයන් විසින් වාරි කර්මාන්ත සම්බන්ධයෙන් නීති රීති පැනවීමට කටයුතු කර ඇත. එහි දී අනුරාධපුර යුගයේ පාලකයන් විසින් වාරිමාර්ග සම්බන්ධයෙන් පනවන ලද නීති රීතින් අභිලේඛන මූලාශ්‍රය මඟින් හඳුනාගත හැකි ය.

වාරිමාර්ග නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කර ආරාක්ෂා කිරීම හා විධිමත් ජල කළමනාකරණයකින් යුක්ත ව පවත්වාගෙන යාමට සමකාලීන රාජ්‍ය පාලකයන් ක්‍රියා කොට ඇත. පස්වන මහින්ද රජුගේ කාලයට (ක්‍රි. ව. 956-972) අයත් දබේගොඩ ටැම් ලිපිය තුළින් එම පසුබිම සන්නිවේදනය කර ඇත. "ඒ ඒ තන්හි සුන් වැ බන්දවා පැවැති වූ දියෙන් හෙළ දිව්හි දුබික් පලවා" (Inscription of Ceylon¸ Vol. V, 2001: 6). මේ අනුව පැවති වාරිමාර්ග පද්ධතිය ප්‍රතිනිර්මාණය කොට කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබා දීම තුළ ආහාර සුලභ කිරීම හා ආර්ථිකය ශක්තිමත් කිරීම රජුගේ ප්‍රධාන වගකීමක් ලෙස සළකා ඇත. මෙම කරුණ පිළිබඳ ව සිව්වන මහින්ද රජුගේ ජේතවනාරාම පුවරු ලිපියේ ද සඳහන් කර ඇත. " බමුණු කොට්..........බද් ගන්කඩ් බඳ්ව ය් නට්(බුන්)..........(පැ)වැත්වූ දියෙන් හෙළ්දිවැ දුබික් (නිවය්).........(දන්)වතුරෙන් ලෙවන් (Inscription of Ceylon¸ Vol. V" 1955(292). ඊට අනුබද්ධ ගංගා හා ඇළ දොළ හරහා වේලි බඳවා නටබුන් (වැව් හා පොකුණු ප්‍රතිසංස්කරණය කරවා) එයින් සැපයූ දියෙන් හෙළදිව දූර්භික්ෂය නිවා.... යනුවෙන් මෙහි සඳහන් වේ.

වැව් නඩත්තු කිරීම සඳහා ගවයන් යොදා ගන්නා ලද ආකාරයක් අභිලේඛන මඟින් පැහැදිලි වේ. දපාළු මහපාගේ දොරබාගේ ටැම් ලිපියේ සඳහන් වන්නේ, "දොළොස් මහ වැ සුනද් වැරියන් මීවුන් නොගන්නා ඉසා (Epigraphia Zelanica, Vol. V, 1955: 292). මෙහි සඳහන් ආකාරයට දොළොස් මහ වැව් ප්‍රතිසංස්කරණය වැදගත් කර්තව්‍යයක් ලෙස සළකා ඇත. මෙම වැව් නඩත්තුවට මිනිසුන් මෙන් ම මී ගවයන් ද යොදාගෙන ඇත. මිනිසුන් විසින් වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම, රළපනාව හා වාරිමාර්ග ඇළ ප්‍රතිසංස්කරණ ආදී කාර්යයන්වල නිරත වී ඇත. සිව්වන මහින්ද රජුගේ කාලයේ නිර්මාණය කරන ලද මිහින්තලා පුවරු ලිපියෙන් ද වැව් ප්‍රතිසංස්කරණයට මානව සම්පත කළමනාකරණය කළ ආකාරය හඳුනාගත හැකි ය. "කුඩින් කළ වරජක් ඇත ගම් සිරිත් දඩ් කිරා කිරූ දඩ් මිනැ ඇකැ අවට සොළොස් රියන් ගැම්බුරු රියන් කබුල් බැගින් ගෙනැ වැව් මෙහෙ කැරැවියැ යුතු නොකළ කිරූ දඩ් ගතැ යුතු" :කරුණාරත්න. 2000: 45). යම් යම් වැරදිවලට හසු වූ විට එයට දඬුවම් ලෙස වැව්වල වැඩ කටයුතුවල නිරත කර වූ බව සඳහන් වේ. මේ ආකාරයට අනුරාධපුර අවසන් අවධියේ දී වාරිමාර්ග ක්‍රම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ නීති ක්‍රම පිළිබඳ ව අභිලේඛන මඟින් සාධක හඳුනාගත හැකි ය.

වෙළඳාම හා සම්බන්ධ නීති ක්‍රම සහ ඒවායේ තිරසාර භාවිතාවන් පිළිබඳව ද අනුරාධපුර රාජ්‍ය අවධියේ මූලාශ්‍රය මගින් තොරතුරු ලැබේ. අනුරාධපුර යුගයේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් විමසා බැලීමේ දී වෙළඳාමට ඉතා වැදගත් තැනක් හිමි විය. එහි දී දේශීය වෙළඳාම මෙන් ම විදේශීය වෙළඳාම ද දැඩි ලෙස ව්‍යාප්ත ව පැවතිණි. එලෙස පැවති වෙළඳාම සම්බන්ධ ව ක්‍රියාත්මක වූ නීති රීති පිළිබඳ ව අභිලේඛන මූලාශ්‍රයන්හි සඳහන් වී ඇත. රාජ්‍යයේ පාලකයා ලෙස රජු මැදිහත් වී ව්‍යවස්ථාවන් හා නියෝගයන් නිකුත් කිරීමක් අභිලේඛන මගින් දක්නට ලැබේ. වෙළෙඳ මධ්‍යස්ථාන පාලනය සම්බන්ධයෙන් ඉතා වැදගත් සාධක රාශියක් ක්‍රි. ව. 10 වැනි සියවසට අයත් බදුලු ටැම් ලිපිය මඟින් හඳුනාගත හැකිය. මෙය තෙවන උදය රජුට ගම් වැසියන් විසින් කරන ලද පැමිණිල්ලක ප්‍රතිඵලයක් වශයෙන් ඉදිරිපත් වූවකි. මෙසේ පැමිණිල්ලකින් පසුව රජුගේ නියෝගයක් ලෙස මෙම ටැම් ලිපිය ප්‍රකාශයට පත් කිරිම වැදගත් කාරණයකි. පැමිණිල්ලේ මූලිකව ම අන්තර්ගත ව තිබුණේ වෙළඳපොළ පාලනය කරන ප්‍රධාන


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මුලාදෑනීන්ගේ සේවකයන් පෙර රජුන් විසින් කරන ලද ව්‍යවස්ථා ඉක්මවා නීති විරෝධී ලෙස දඩ මුදල් හා පඬුරු ගත් බවත්, එය වළක්වන ලෙසත් ය. ඒ අනුව බදුලු ටැම් ලිපියේ මුඛ්‍ය අරමුණ සාමාන්‍ය ජනතාවට සිදුවිය හැකි අසාධාරණ චර්යාවන් පාලනය කර ජනතාවට සාධාරණත්වය ඉටුකර දීම යි. " මියුගුණ මහ වෙහෙර වැඩි කලැ ගිය දවසැ පදිලද් දණ්ඩනායකයන් ගැත්තන් සතලොසැ පිරිවියන් වහන්සෙ දවසැ කළ වැවස්ථා ඉක්මැ අන් නෑයෙන් දඩ ගත්හ. නොසිරිත් පඬුරු ගත්හ........" (අමරවංශ හිමි, 1969: 212). එබඳු අක්‍රමිකතා වැළැක්වීම සඳහා පාලකයන් ක්‍රියාමාර්ග ගත යුතු බව මෙන් ම, ඒ සඳහා ඇහුම්කන් දීම ප්‍රධාන වගකීමක් ලෙස සලකා කටයුතු කිරීම පාලකයාගේ යුතුකමක් ද ලෙස සළකා තිබූ බව පෙනේ. "පිරිකපා ත(බා) දුන් දඩ ගනුත් මිසැ ගම වටා ගෙනැ ගෙ තිරැ ගෙනැ දඩ නො එළ්වනු ඉසා දඩ ගැම හින්දැ ඒ(ළ්) වත් මිසැ තුඩින් ගැමියන් පිටත් කොට නො ගෙනැ යනු ඉසා" (අමරවංශ හිමි, 1969: 212).

සමකාලීන ව බදු අය කිරීමේ නිලධාරීන් විසින් සමාන්‍ය ජනතාව තලා පෙළා පීඩාවට ලක් කරමින් නියමිත ප්‍රමාණයටත් වඩා බදු අය කර ගැනීමේ ක්‍රියාවක නිරත වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යවස්ථාව පණවා ඇත. විශේෂයෙන් ගෙවල්වල සිරකර තබා ගනිමින් ගම්වැසියන් ට තර්ජනය කරමින් හා වෙනත් ස්ථානයකට රැගෙන ගොස් වැඩි බදු මුදල් ඉක්මවා ගැනීමක් සමකාලීන රාජ්‍යය අංශය ට අදාළ බදු එකතු කිරීමේ නිලධාරීන් අතින් සිදු වී ඇත. මේ නිසා සාමාන්‍ය වැසියන් බදු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හා ජීවිතාරක්ෂාව තකා ගමෙන් පලා යාම වැනි හේතු නිසා දෛනික ව, මාසික ව හා වාර්ෂික ව එකතුවන බදුවල මිල ගණන් අඩු වීම නිසා ආර්ථිකයට දැඩි බලපෑමක් සිදු වන්නට ද හැකි වේ. මේ නිසා රජු විසින් මෙම ව්‍යවස්ථාව පිහිටුවීමට කටයුතු කරන ලද බව පැහැදිලි ය. මෙහි දී රාජ්‍යය බලය අනුව කටයුතු කරන සම්දරුවන් හෙවත් රාජ්‍ය නිළධාරීන්ගේ කාර්යභාරය කෙරෙහි බොහෝ සෙයින් සැළකිලිමත් ව ඇත. රාජ්‍ය නිළධාරියා බදු අය කර ගැනීමට පැමිණිවිට ඔවුන්ට විවිධ වෙළඳ ද්‍රව්‍ය නොමිලේ ලබා දීම තහනම් කොට ඇත "ගමට් ආ රදොලින් රහ මස් දිහි තෙල් නො ගන්නා ඉසා වතු පෙත් වත් වැදැ රහ නො ගන්නා ඉසා සොරවෙළඳම් නො කරනු ඉසා"ඩ (අමරවංශ හිමි, 1969: 212).

විශේෂයෙන් ගමට පැමිණෙන රජ කුලයෙහි නියුක්තිකයන් විසින් ගම් වැසියන්ගෙන් රා, මස්, දී, කිරි හා ගිතෙල් වැනි දේ නොගත යුතු බවත්, රා වැනි මද්‍යසාර නිෂ්පාදනය කරන වතු පන්තියට හෝ වතු කොටසට පැමිණ රා නොගැනීම ද කළ යුතු බව මෙහි සඳහන් කර ඇත. මෙවැනි දූෂණ හා වංචාවන් සමකාලීන හෝපිටිගම වෙළඳ සීමාවේ පැවති බවක් මෙයින් හඳුනාගත හැකි ය. නිළධාරීන් අල්ලස් ගැනීම තුළ වෙළඳපොළ ව්‍යවස්ථාවන් උල්ලංඝණය වන අතර රාජ්‍යයට එය දැඩි ලෙස බලපානු ලබයි. අනෙක් අතට නිළධාරීන් යම් යම් දේ ගැනීම තුළ වෙළෙඳුන් රජයට බදු ගෙවීම පැහැර හැරීම පමණක් නොව පාරිභෝගිකයා අපහසුතාවයට ලක්වන ආකාරයේ වෙළඳාම් කරන්නට ද ඔවුන් පෙළඹීමේ හැකියාව වැඩිවන්නට ඇත. මේ නිසා නිලධාරීන් අපක්ෂපාතී ව තම තමන්ගේ වගකීම් හා රාජකාරී නිසි පරිදි ඉටු කිරීම තුළින් රාජ්‍යයේ හා ආර්ථිකයේ පැවැත්ම හා වර්ධනය ලබා ගැනීමට හැකි බව පාලකයා අවබෝධ කරගෙන මෙම ව්‍යවස්ථාව ස්ථාපිත කර ඇත.

මෙම අභිලේඛනයෙන් පොහෝ දිනවල වෙළඳසැල් පවත්වාගෙන යාම තහනම් කරන ලදී. "පොහොය දා සල්කලාකුගෙන් වැපුදයට් තෙල් අද්දක් ගන්නා ඉසා මියගුණ් ම හවෙහෙරැ වැපුද පවත්වනු ඉසා වැපුදයට නොලැබුණා කුගෙන් පෙර සිරිත් දඩ වැපුදයැට් ගන්නා ඉසා" (අමරවංශ හිමි, 1969: 212).

එසේ පොහෝ දා සල්පිල් කළේ නම් ඔහු අනිවාර්යයෙන් මහියංගන මහා විහාරයේ පහන් පූජාව පැවැත්වීම සඳහා දින දෙකක ට ප්‍රමාණවත් වන පරිදි තෙල් නැළියක් පූජා කළ යුතු බව දක්වන ලදී. යම් ආකාරයකින් තෙල් පූජා කිරීම ට අපොහොසත් වන්නේ නම් ඒ සඳහා කලින් නියම කරන ලද දඩය පහන් පූජාව සඳහා ගත යුතු බව දක්වා ඇත. " නොවැටූ මදඩියෙන් (නොයෙන්) නොකිරනු ඉසා සුත් බඩු නොතනැ හින්දැයි නොවිකණකු ඉසා සල් නොකළමනා තැනැ නොකිරනු ඉසා සල් නොළමනාවුන් නොකිරනු ඉසා" (අමරවංශ හිමි, 1969: 212).

පාරිභෝගිකයා වැඩි වැඩියෙන් භාණ්ඩ මිල දී ගැනීම සඳහා වැඩිපුර ලාභ ඉපැයිය හැකි පාරිභෝගිකයා රවට්ටන වංචාකාරී වෙළඳාම තහනම් කිරීම සඳහා ද මෙහි නීතිරීති ඉදිරිපත් කර ඇත. මේ නිසා හොර මිනුම් හා වංචාකාරී වෙළඳාම් කිරීම් මෙකල භාවිතා කර ඇති අතර මේ අනුව ගනුදෙනු දෙපිරිසට ම අලාභයක් නොවන ආකාරයට මේ කිරුම් ක්‍රම සකසා තිබේ. මුද්‍රා නොතබන ලද තරාදි පඩියෙන් කිරීමට තහනම් කිරීමෙන් ඒ අදහස වඩාත් පැහැදිලි වේ. වෙළඳාමට නුසුදුසු ස්ථානවල වෙළඳාම් කිරීම තහනම් කර ඇත්තේ පාරිභෝගිකයාගේ සෞඛ්‍ය ආරක්ෂිත බව සලකා ය (අමරවංශ හිමි, 1969: 212-132). විධිමත් පාලන සංවිධානයක් සහිත බවට තවත් සාධකයක් වන්නේ නීතිමය තත්ත්වයක් තුළ කටයුතු කිරීම යි. මේ ආකාරයට අනුරාධපුර රාජධානි සමයේ දී ක්‍රමවත් වෙළඳ නීතියක් ක්‍රියාත්මක වී ඇති බව මෙම අභිලේඛනගත තොරතුරු මඟින් පැහැදිලි වේ.

දේශීය වශයෙන් මෙන් ම විදේශීය වෙළඳාම ද ඉතා සාර්ථක ලෙස අනුරාධපුර යුගයේ දී ක්‍රියාත්මක වී ඇත. සමකාලීන ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාශීලී ව පැවතිණ. කෙසේ නමුත් මෙම වාණිජමය ප්‍රතිපත්තිය අනුරාධපුර රාජධානිය පුරා ම ශක්තිමත් ව හා අඛණ්ඩ ව පවත්වාගෙන යන ආකාරයක් ඓතිහාසික මූලාශ්‍රය මඟින් තහවුරු වේ. ක්‍රි.ව. පස්වැනි සියවස වනවිට ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය බවට පත් වේ. මෙලෙස විදේශීය වෙළඳාම සාර්ථක ව හා ක්‍රමවත් ව පවත්වාගෙන යාම සඳහා විධිමත් වූ නීතිරීති පද්ධතියක් පැවති බව අභිලේඛන මූලාශ්‍රය මඟින් පැහැදිලි වේ. මෙහි දී ක්‍රි.ව. නමවැනි සියවසට අයත් වන මන්නාරම් කාච්චේරි ශිලා ලිපියෙහි විදේශීය වෙළඳ නීති පිළිබඳ ව තොරතුරු සඳහන් වේ. (ඉන්දික, 2014: 333). ක්‍රිස්තු වර්ෂ නමවැනි සියවසේ දී මහාතිත්ථ වරායේ බදු අය කිරීමට "මහපුටු ලද්දා" නම් රාජ්‍ය නිලධාරියකු පත්


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කර තිබුණි (Epigraphia Zelanica Vol. I, 1933 : 104). අනුරාධපුරයේ ප්‍රධාන වරාය වූයේ මහාතිත්ථ වරාය යි. පර්සියාව සමග පැවැත් වූ සබඳතා පිළිබඳ ව සනාථ කරන අභිලේඛනයක් ලෙස මෙය හඳුනාගෙන තිබේ.

අනුරාධපුර රාජධානි අවධියේ දී ඉඩම ආර්ථික ක්‍රියාවලියේ දී තීරණාත්මක සාධකයක් බවට පත් වූ අතර ඒ හා සම්බන්ධයෙන් ද නීති රීති මාලාවක් බලාත්මක විය. පුරාතන ලංකාවේ ආර්ථික ව්‍යූහය මූලික වශයෙන් ම පදනම් ව පැවතියේ කෘෂිකර්මාන්තය මත ය. කෘෂිකර්මාන්තය හා බැඳුණු ප්‍රධාන ම සාධකය වූයේ භූමිය යි. නැතහොත් ඉඩම යි. භූමිය හා ඉඩම අතර සුළු වෙනසක් තිබෙන අතර සමස්ත භූමියෙන් ම නිශ්චිත ව වෙන් කරගත් කොටස ඉඩම ලෙස නම් විය. එබැවින් ඉඩමට ඇති අයිතිය ඉඩම් භුක්තිය නම් විය. අනුරාධපුර රාජධානි සමයේ දී ඉඩම් භුක්තිය හා සම්බන්ධ නෛතික තත්ත්වය පිළිබඳ විමසීමේ දී පුද්ගල ඉඩම් භුක්තිය හා විහාර දේවාල ඉඩම් භුක්තිය ලෙස කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකි ය. පුද්ගල ඉඩම් භුක්තිය රජුගේ ඉඩම් භුක්තිය හා සාමාන්‍ය ජනයාගේ ඉඩම් භුක්තිය ලෙස කොටස් 02කින් යුක්ත ය. මෙහි දී රජු භූපති, මහිපති යන මතය පෙරටු කරගෙන "රාජ්‍යයේ සියලු ම ඉඩම් රජු සතු ය" යන අදහසට එකඟ වන විද්වත්හු පුරාතන ලංකාවේ රජුට ද එවැනි බලයක් තිබූ බවට තර්ක කරයි. විශේෂයෙන් ම එච්. ඩබ්. කොඩ්රින්ග්ටන්, විල්හෙල්ම් ගයිගර් පමණක් නොව මෑත කාලීන ඉතිහාසඥයන් වන ඇම්. බී. ආරියපාල, ටිකිරි අබේසිංහ වැනි විද්වතුන්ගේ පවා තර්කය වන්නේ රජු සමස්ත භූමියේ ම හිමිකරු ය යන්නයි (විද්‍යාලංකාර, 2000: 78-79). කෙසේ වුවත් අනුරාධපුර යුගයේ අභිලේඛන මූලාශ්‍රයන්වල අන්තර්ගත තොරතුරු මඟින් "රජු භූමියේ හිමිකරු ය" යන අදහස සත්‍ය නොවන බව පැහැදිලි වේ.

මෙකල රාජ්‍යයේ ඉඩම් පිළිබඳ ව රජුට යම් යම් අයිතිවාසිකම් සහ බලතල තිබුණේ ය. වගා කරනු ලැබූ සියලු ඉඩම්වලින් බද්දක් එකතු කිරීමේ අයිතිය ඔහු සතු විය. මේ අයිතිය පදනම් වූයේ ඔහුට තිබූ ඉඩම් හිමිකමක් මත නොව රාජ්‍යයත්, ජනතාවත් ඔහු විසින් ආරක්ෂා කරනු ලැබූ නිසා ය. අභිලේඛන මූලාශ්‍ර සාක්ෂි දරණ ආකාරයට ඇතැම් අවස්ථාවල දී රජු විසින් සාමාන්‍ය ජනයාගෙන් ඉඩම් මිල දී ගත් අවස්ථා ඇත. ක්‍රි. ව. 60- 67 කාල පරිච්ඡේදයට අයත් විහාරගල සෙල්ලිපියෙහි සහ රජු විසින් කහවණු පන්සියයකට මිල දී ගන්නා ලද වැවක් පිළිසකර කර එය ද්වාරික විහාරවාසී භික්ෂූන්ට පූජා කළ බවක් සඳහන් වේ. " සිධ, සබ රජෙ එකදොරික විහරහි පොහොතකර කරවය උපලදොණික වචි පචසතෙ (හි) කිණිය පචසතෙ (හි) බිකුසගහටය දිනෙ" (අමරවංශ හිමි, 1969: 127).

එසේ ම ක්‍රි. ව. 512- 520 කාල පරිච්ඡේදයට අයත් නාගිරි කන්ද ශිලා ලිපියෙහි මහා කුමාරදාස රජු විසින් එලෙස ඉඩම් මිල දී ගත් අවස්ථාවක් පිළිබඳ ව තොරතුරු සඳහන් වෙයි. "සිද්ධම්, මහ කුමරතස රජ අපය (හ බමණග) රිය වෙහෙරටය කෙණෙව් වඩ කොටු දිනක මහගරිය වෙවසර (ෙ) ච වුගරිය වෙවසර (ෙ) ච කබුබෙ වෙවසර (ෙ) ච කටවනක - පුල සර වෙ (ෙ) වව (ෙ) ච ම වතර වෙවසර දක පෙත කඩය බෙපිපෙත බමණගරිය වහෙරෙ බික සඟහට වර පවටය දිනෙ......." (අමරවංශ හිමි, 1969: 149). මහගිරිය වැව හා වැසර කුඹුරු ද, වුගරිය වැව හා වැසර කුඹුරු ද, කබුබෙ වැව හා කුඹුරු ද කටවනකපු වැව හා කුඹුරු ද මහා කුමාරදාස අභය රජු විසින් මිලට ගෙන බ්‍රාහ්මණගිරිය විහාරයට පරිත්‍යාග කළ බව සඳහන් වෙයි.

සාමාන්‍ය ජනයා සතුව ද ඉඩම් භුක්තියක් පැවතුණි. එනම් "රජු සමස්ත භූමියේ ම හිමිකරු ය." යන සම්මතයට පටහැණි ව පුද්ගලික ව ඉඩම් තබා ගැනීමේ හැකියාව ජනයාට ද තිබී ඇත. පුද්ගලික ඉඩම් භුක්තිය යන්නෙන් ජනයාට ඉඩම් මිල දී ගැනීම, විකිණීම, පවරා දීම හා ප්‍රදානය කිරීම වැනි කටයුතු රජුගේ අවසරයක් නොමැති ව කළ හැකි විය (විද්‍යාලංකාර, 2000: 81). ක්‍රි. ව. පළමුවන සියවසට අයත් යැයි සැලකිය හැකි කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ලෙන විහාර ලෙන් ලිපියට අනුව එම ලෙනත්, කුඹුරක් සහ ගොඩ ඉඩමක් "මතය" නම් පුද්ගලයෙකු විසින් භික්ෂූන්ට ප්‍රදානය කර ඇත (විද්‍යාලංකාර, 2000: 81). ක්‍රි.ව. 10 වැනි සියවසට අයත් එප්පාවල ශිලා ලිපියේ ඉඩම් මිල දී ගැනීමක් පිළිබඳ කරුණු සඳහන් වෙයි. " ........උකුණුහුසු කොට්ටාම් වෙලත් මෙ මිහින්දු අට කලන්දකට් මට් විකිණූ තිබූ ගලම්බුරු කැරැයෙහි එක් පයක් ඉසා මා අතින් විපොලියට් දුන් දෙකළන්දක් ඇතුළු වැ දසකළන්දක්........" (අමරවංශ හිමි, 1969: 272). වෙලත් මෙ නම් පුද්ගලයා උකුණුහුසු කොට්ටා නම් තැනැත්තාට රන් කලන් අටකට විකුණන ලද ගලම්බුරු කැරයෙහි 1/4ක් ද, පොලී වශයෙන් වී ලැබෙන සේ දුන් කලන් 02 ක් ද ඇතුළු ව රන් කලන් 10 ක් පමගලු වෙහෙරට හා එහි බෝ රුකට ද පිළිම ගෙට ද පූජා කළ බව එහි සඳහන් වෙයි. ඒ අනුව අනුරාධපුර යුගයේ දී සාමාන්‍ය ජනයාට ද තමන් සතු ඉඩම් විකිණීමට අයිතියක් තිබූ බව අභිලේඛන සාධක මඟින් හඳුනාගත හැකි ය.

ඉඩම් භුක්තිය පිළිබඳ නෛතික තත්ත්වය පිළිබඳ විමසීමේ දී සමාජයේ පුරුෂයන් ට මෙන් ම කාන්තාවන්ට ද ඉඩම් අයිතිවාසිකම් සම ව තිබූ බවට සාක්ෂි අනුරාධපුර රාජධානි සමයෙන් හමුවන අභිලේඛන මඟින් හඳුනාගත හැකි ය. එහි දී ක්‍රි.පූ. යුගයට අයත් බ්‍රාහ්මී ශිලා ලිපිවල බොහෝදුරට සඳහන් වන්නේ කාන්තාවන් විසින් සිදු කරන ලද ලෙන් පූජා කිරීම් ය( විද්‍යාලංකාර, 2000: 82). සමකාලීන සමාජයෙහි රාජකීය කාන්තාවන් හා සමානව ම සාමාන්‍ය කාන්තාවට ද ඉඩම් භුක්තිය පැවතිණි. තිඹිරිවැව ශිලා ලිපියෙහි සඳහන් තොරතුරු මඟින් මේ පිළිබඳ ව කරුණු අනාවරණය වේ. "සිධම් ගව්...... (පුත) මිතයහ පිත අනුළබි තුම්හ කුල සතක......... වය වචි මත(ර) මපිබික පතිගහපවත විහරහි බිකු සගනට දිනි" (ජයවර්ධන, 2017: 43). "........ ගේ පුත්‍ර මිතයගේ දියණිය වූ අනුලම්බිකා තොමෝ සිය කුල සතු වැවේ මාතිකාවේ මත්ස්‍ය භාගය විකුණා ලැබෙන මුදල් ගඟ පවත විහාරයේ භික්ෂූන්ට පරිත්‍යාග කර ඇත. මේ ආකාරයට සමකාලීන සමාජයෙහි කාන්තාවන්ට ද ඉඩම් භුක්තිය පිළිබඳ අයිතිවාසිකම් පැවති බව හෙළි වේ.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


විහාරාරාමවල දේපළ භුක්තිය පිළිබඳ නීතිරීති මාලාවක් ද දක්නට ලැබුණු අතර ඒවා විහාර කළමනාකරණය උදෙසා පැහැදිලිව ම ඉවහල් විය. විහාර දේවාල ඉඩම් භුක්තියට ඇතුළත් වූයේ රජු මෙන් ම සාමාන්‍ය ජනයා ප්‍රදානය කරන ලද වගාකළ හා නොකළ ඉඩම්, රාජකීයන් හා සාමාන්‍ය ජනයා සතු වූ පෞද්ගලික ඉඩම්, රාජ සන්තක කළ ඉඩම් යනාදිය යි. විහාර සන්තක ඉඩම් වශයෙන් දමිගමිය, ඇල්ගමිය, ගුතැකරත්දැ, දමිය, තලොළගම ආදිය තිබූ බව හතරවැනි මිහිඳු රජුගේ (ක්‍රි. ව. 914- 923) මිහින්තලා ලිපියේ සඳහන් වේ (විද්‍යාලංකාර, 2000: 85). ආගමික ආයතනවලට ප්‍රදානය කරන ඉඩම්වල මූලික අයිතිය පැවතියේ අදාළ විහාරයට හෝ ආගමික ආයතනයට වූ අතර එය සමස්ත සංඝ සමාජයට ම අයත් නොවුණි. විහාරාරාම ඉඩම් භුක්තියට අදාළ නෛතික ප්‍රතිපාදන කිහිපයක් හඳුනාගත හැකි ය. ඉන් එකක් නම් විහාරාරාමයන්ට ප්‍රදානය කරන ලද ඉඩම් එකී ආයතනය විසින් කිසිදු අවස්ථාවක විකිණීමට, උකස් කිරීමට, පුද්ගලයෙකු හෝ ආයතනයකට පැවරීමට හෝ ප්‍රදානය කිරීමට අවසර නොතිබීම යි. මෙම නෛතික තත්ත්වය පිළිබඳ ව ක්‍රි.ව. 956-972 කාල පරිච්ජේදයට අයත් සිව්වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි තොරතුරු අන්තර්ගත වේ. "වෙහෙර් දසුන් හා කැමියන් මුත් වෙහෙර් බිමැහුන්කුඩීන්ගෙන් බිම් සොවස් නිසි සෙයින් වෙහෙරම් ගතැ යුතු කහසන්වැ ගත් වෙසට් නො අනුරැ කියව් කියා ඇය් කම් කරනුවන පණිවා කරනුවන ගල්වැටැ නොවිසියැ දියැයුතු සුසුන් වත් වෙහෙරට් මුත් කැමියන් නොගත යුතු මෙ වෙහෙරැ බද් කුවාක් ගම්බිම් කැරැයෙහි බැන්දැ සලසත් මුත් පාට්ට නොදියැ යුතු තුන් දා වර් මුත් පොහො මඟුල් ඇය් සෙක වර් නොගතැයුතු කැමියන් වෙහෙර් දසුත් පිවෙල් කොට් දුනු වක් මුත් ඇත්වෙහෙරැ බද්තුවාක් කන්හි උකස් පමුණු පාට්ටකැරැ කුම බූර් අරැබ් ඇය් නොවැළැන්දිය යුතු වෙහෙරට් කැමින් ගිය කැමියන් හස්කරුවන් දෙන පෙරේ සිරිත් බිලී සාල් මුත් මේත් වැටුම් නොගතැයුතු..............." (අමරවංශ හිමි, 1969: 301).

මිහින්තලා විහාරයට අයත් ඉඩම් කිසිවෙකුට මිල දී ගැනීමට හෝ වෙනත් විහාර භූමියකට අයත් ඉඩම් වෙනත් අයෙකුට විකිණීම හෝ කළ නොහැකි විය. යමෙකු එසේ කළහොත් ඔහු රටින් පිටුවහල් කරන තරම් තරම් වරදක් කළ අයෙකු සේ සැළකේ. විහාරාරාමවලට අයත් ඉඩම් මිල දී ගැනීම තහනම් වුව ද විහාරාරාමවලට ඉඩම් මිල දී ගැනීමට තහනමක් නොවීය. සිව්වන මිහිඳු රජුගේ ක්‍රි. ව. 956- 972 වෙස්සගිරි තෙවන පුවරු ලිපියේ "බොය උපුල්වන් කසුබ් ගිරි රජමහා විහාරයට අයත් ඉඩම් කැබලි" ලබාගත් බව සඳහන් වේ (විද්‍යාලංකාර, 2000: 87). විහාර සේවයේ නියුතු පුද්ගලයන්ට විහාරය සතු ඉඩම්වලින් ගෙවීමට හෝ ඉඩම් පවරා දීමට අදාළ ව විහාර දේවාලයන්ට නෛතික බලය හිමි ව තිබී ඇත. අභයගිරි විහාරයේ සේවයේ නියුක්ත වූ වඩුවන්ට සහ ගල් වඩුවන්ට විහාරයේ කුඹුරුවලින් "කිරි" (විශාලත ම ඉඩම් මිම්ම වූ යාලෙන් 1/5ක කොටස) එකහමාරක් ද ධාන්‍ය වැපිරීමට ගොඩින් ඉඩමක් ද දුන් පුවතක් ක්‍රි. ව. නවවැනි සියවසට අයත් අභයගිරි විහාර සංස්කෘත ලිපියේ සඳහන් වේ (විද්‍යාලංකාර, 2000: 87).


## නිගමනය


ජලය පදනම් කරගත් සංස්කෘතියකින් ගොඩනැඟි අපේ රට සෞභාග්‍ය සහ සමෘද්ධිය අතින් ලොව කිසිදු රටකට නොදෙවෙනි වූ ප්‍රෞඪ රාජ්‍යයකි. මානව සහ සමාජ සුබසාධනය, ආර්ථික ආඪ්‍යතාව, සහ සශ්‍රීකත්වය අතින් එය කිසිදා අන් රටකට දෙවෙනි වූයේ නැත. මහජන අවශ්‍යතා මෙන් ම ආගමික පාර්ශවයන්ගේ එදිනෙදා අවශ්‍යතා ද මෙරටින් උපදන ධනයෙන් විධිමත් ව පවත්වා ගැනීමට අපේ පැරැන්නන් සමත් විය. ආර්ථික කළමනාකරණය උදෙසා නීති රීති පවා සමාජය තුළ බලාත්මක කරමින් ලෝක ආර්ථිකය ඉදිරියේ පෙරදිග ධාන්‍යාගාරයක් බවට අපේ රට පත් කිරීමට උත්සාහ ගත් බව හා එම උත්සාහයන් සාර්ථක ව මල්ඵල දැරූ බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය




විහාරෙගල ශිලා ලිපිය




බදුලු ශිලා ලිපිය

වේවැල්කැටිය ශිලා ලිපිය



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පරිශීලිත මූලාශ්‍රය


අමරවංශ හිමි, කොත්මලේ, (1969) ***ලක්දිව සෙල්ලිපි,*** කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඉන්දික, අමිල. මහඋල්පත. සුසන්ත හා කුමාරසිංහ, කුලතුංග. (2014) ***අභිලේඛනවලින් හෙළිවන විදේශ වෙළඳ සම්බන්ධතා,*** විචාරාවලෝකනය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ'

කරුණාරත්න, සද්ධාමංගල. (2000) ***ශිලාලේඛන සංග්‍රහය, i වෙළුම (1904-1912),*** කොළඹ( පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව'

බණ්ඩාර, නිලන්ති. (2008) ***පුරාණ ශ්‍රී ලංකාවේ සමාජය,*** කඩුල්ල ප්‍රකාශන'

ජයවර්ධන, ගාමිණී. (2017) ***ආදි ශිලා ලිපිවලින් හෙළිවන හෙළ කෘෂි සමාජය,*** කතෘ ප්‍රකාශනයකි'

***මහාවංසය*** ^1996& සුමංගල හිමි හා දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (සංස්.), කොළඹ( ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව'

වික්‍රමසිංහ, මාටින්. (2006) ***සිංහල ලකුණ,*** රාජගිරිය, සරසි.

විතානච්චි, චන්දන රෝහණ. (2017) ***අභිලේඛන අධ්‍යයන ප්‍රවේශය,*** නිහාල් ප්‍රින්ටර්ස්'

විද්‍යාලංකාර, අනුත්තරා දේවි. (2000) ***පැරණි ලක්දිව නීතිය හා අධිකරණය,*** කතෘ ප්‍රකාශනයකි'

සෙනෙවිරත්න, අනුරාධ. (1998) ***වැව් හා මාරිමාර්ග, අපේ සංස්කෘතික උරුමය,*** මධ්‍යම සංස්කෘතික අරමුදල.

***Epigraphaia Zelanica¸ Volume V¸*** S. Paranavitana¸ Published By Department of Archaeology, Sri Lanka¸ 2001¸ No 15.

***Inscription of Ceylon¸, Volume V, Part 1,*** G. S. Ranawella¸, Published by Department of Archaeology, Sri Lanka¸, 2004¸, No. 66.

***Inscription of Ceylon¸, Volume V¸, Part ii,*** G. S. Ranawella¸, Published by Department of Archaeology, Sri Lanka¸, 2005, No 71.

***Epigraphia Zelanica Vol V Part I¸*** S. Paranavitana¸ Archaeological Survey of Ceylon¸1955¸ No. 28.

***Epigraphia Zelanica Vol I,*** S. Paranavitana¸, Published for The Government of Ceylon, Oxford University Press¸1933¸ No 104.



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පහළොස්වන කලාපය 2025 දෙසැම්බර්
පිටු 30-38
ISSN 1800-1459 eISSN 2386-2041
© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# බුත්සරණේ වාක්‍ය විචාරාත්මක ලක්ෂණ

# (Syntactical Features of the *Buthsarana*)

නිල්මිණි දයානන්ද
භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
dayanandanilmini82@gmail.com

## Abstract

*Buthsarana* is considered as the incomparable Sinhalese Prose written by *Vidyachkkrawarthi* at the end 12th century A. D or at the beginning of 13th century A. D. *Buthsarana* reflects a developed stage of Sinhala language and literature. By the time *Buthsarana* was written, Sinhalese had developed with some characteristics unique to it . The extent of the evolution of the syntax during the period from the 10th century A. D. to 13th century A. D. is remarkably significant when comparing the changes that took place in the subsequent period that is until about the 18th century A.D. This is an analysis of syntactical features in *Buthsarana.* Although both quantitative and qualitative research methods have been used to this research, qualitative research methods were used more than quantitative research methods. This research paper has been written after categorising and analysing facts collected by referring primary and secondary sources .The syntactical features of Buthsarana can be identified through this research article.

Key words: *Buthsarana*, incomparable Sinhalese Prose, remarkably significant, syntactical features, *Vidyachakrawarthi*

## සාරසංක්ෂේපය

දොළොස්වන ශතවර්ෂයේ අග භාගයේ දී හෝ දහතුන්වන ශතවර්ෂයේ මුල් භාගයේ දී හෝ විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද *බුත්සරණ* සිංහලයේ අසමසම ගද්‍ය කාව්‍යය වශයෙන් සැලකෙයි. සිංහල භාෂාවේ හා සාහිත්‍යයේ සංවර්ධිත අවධියක් *බුත්සරණින්* පිළිබිඹු වේ. *බුත්සරණ* රචනා වූ සමය වන විට සිංහල භාෂාව ඊට ආවේණික ලක්ෂණ සහිත ව සංවර්ධනය වී තිබිණ. දහවන සියවසේ සිට දහතුන්වන සියවස දක්වා වාක්‍ය සංස්ථිතියේ සිදු වූ වෙනස්කම්, ඉන් පසු දහඅටවන සියවස දක්වා වාක්‍ය සංස්ථිතියේ සිදු වූ වෙනස්කම්වලට වඩා සුවිශේෂ වැදගත්කමක් දරයි. මෙය *බුත්සරණේ* වාක්‍ය විචාරාත්මක ලක්ෂණ පිළිබඳ විශ්ලේෂණයකි. මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද අනුගමනය කොට ඇති අතර මෙහි දී වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් ආශ්‍රයෙන් මාතෘකාවට අදාළ ව එක්රැස් කරගන්නා ලද දත්ත වර්ගීකරණය කොට විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව මෙම පර්යේෂණාත්මක ලිපිය සම්පාදනය කරන ලදි. මෙම පර්යේෂණාත්මක ලිපිය තුළින් *බුත්සරණේ* වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හඳුනාගත හැකි ය.

**කේන්ද්‍රීය වචනඃ** අසමසම ගද්‍ය කාව්‍යය, *බුත්සරණ*, වාක්‍ය විචාරාත්මක ලක්ෂණ, විද්‍යාචක්‍රවර්ති, සුවිශේෂ වැදගත්කම

## හැඳින්වීම

ක්‍රිස්තු වර්ෂ 1017 සිට ක්‍රිස්තු වර්ෂ 1232 දක්වා වූ පොළොන්නරු යුගයේ දී විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද *බුත්සරණ* විශිෂ්ට ගණයේ සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයකි.

සෑම භාෂාවක් ම සැකසී ඇත්තේ 'වාක්‍ය' නමැති ඒකකයෙනි. එහෙයින් භාෂාවක් යනු එම භාෂාව භාවිත කරන ජනතාව කථා කරන හා ලේඛන ක්‍රමයක් ද ඇති කල ලියන සියලු ම වාක්‍යවල එකතුව බව සඳහන් කළ හැකි ය. (අභයසිංහ, 1990ඃ 11).

භාෂාව පිළිබඳ ව සිදු කෙරෙන විද්‍යාත්මක අධ්‍යයනයක් වන වාග්විද්‍යාවේ ශබ්දිම විචාරය, පද විචාරය, වාක්‍ය විචාරය හා අර්ථ විචාරය යන විවිධ ක්ෂේත්‍ර දක්නට ලැබේ. වාක්‍ය විචාරයේ දී විග්‍රහයට භාජනය වන මූලික ඒකකය වන්නේ වාක්‍යය යි. මෙය ශබ්ද, පද ආදියට වඩා පැහැදිලි අර්ථ ප්‍රකාශන ඒකකයකි. වාක්‍යයක් එක් වචනයකින් හෝ වචන අනුක්‍රමයකින් සමන්විත වේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියසීලි විජේමාන්න හා එච්. ආර්. චන්ද්‍රසේන විසින් පොළොන්නරු යුගයේ දී ගුරුළුගෝමි විසින් රචනා කරන ලද තවත් විශිෂ්ට ගණයේ සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක් වශයෙන් සැලකෙන *අමාවතුර* පිළිබඳ ව වාක්‍ය විචාරාත්මක අධ්‍යයන සිදු කොට තිබේ. (කුලසූරිය, 1999ඃ 154).

එහෙත් මේ වන තෙක් ඊට සමකාලීන විශිෂ්ට ගණයේ සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක් වූ විද්‍යාචක්‍රවර්තීන්ගේ *බුත්සරණ* පිළිබඳ ව වාක්‍ය විචාරාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත.

*බුත්සරණ* රචනා වන සමය වන විට සිංහල භාෂාව ඊට ආවේණික ලක්ෂණ සහිත ව ප්‍රවර්ධනය වී තිබිණ. *සිදත් සඟරාවේ* සඳහන් නොවන වර්තමානයේ පවා භාවිත වන ව්‍යාකරණ ලක්ෂණ බොහොමයක් මෙහි දක්නට ලැබෙන්නේ එහෙයිනි. ක්‍රි. ව. 10 වන සියවසේ සිට ක්‍රි. ව. 13 වන සියවස දක්වා සිදු වූ භාෂා පරිණාමය ඉන් පසු අවධියේ දී (18වන සියවස දක්වා) සිදු වූ භාෂා පරිණාමයට සාපේක්ෂ ව වාක්‍ය විචාරය සම්බන්ධයෙන් සුවිශේෂ වැදගත්කමක් දරන බව ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියසීලි විජේමාන්නගේ මතය යි. (Wijemanne, 1984: iii).

*බුත්සරණ* රචනා වූ අවධියට අයත් භාෂණ ව්‍යවහාරය හැදෑරීමට කිසිදු මගක් නොමැති අතර මෙම අධ්‍යයනය තුළින් එකල ලේඛන ව්‍යවහාරය පිළිබඳ ව යම් වැටහීමක් ලබාගත හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

පොළොන්නරු යුගයේ දී රචිත ගුරුළුගෝමීන්ගේ *අමාවතුර* හා විද්‍යාචක්‍රවර්තීන්ගේ *බුත්සරණ* විශිෂ්ට සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථ වශයෙන් සැලකේ. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියසීලි විජේමාන්න හා එච්. ආර්. චන්ද්‍රසේන විසින් පොළොන්නරු යුගයේ දී ගුරුළුගෝමී විසින් රචනා කරන ලද තවත් විශිෂ්ට ගණයේ සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක් වශයෙන් සැලකෙන *අමාවතුර* පිළිබඳ ව වාක්‍ය විචාරාත්මක අධ්‍යයන සිදු කොට තිබේ. (කුලසූරිය, 1999: 154).

*බුත්සරණෙහි* සාහිත්‍යමය වැදගත්කම පිළිබඳ ව බොහෝ ග්‍රන්ථ රචනා වී තිබේ. එහෙත් මේ වන තෙක් එහි වාක්‍ය සංස්ථිතිය පිළිබඳ ව වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත. බුත්සරණේ වාක්‍ය විචාරාත්මක ලක්ෂණ පිළිබඳ ව පර්යේෂණ කිරීමට මෙහි දී අපේක්ෂා කෙරෙන්නේ යථෝක්ත කාලීන අවශ්‍යතාව ඌනපූරණය කිරීමේ පරමාර්ථයෙනි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද අනුගමනය කොට ඇති අතර මෙහි දී වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද යි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයන් ආශ්‍රයෙන් මාතෘකාවට අදාළ ව එක්රැස් කරගන්නා ලද දත්ත වර්ගීකරණය කොට විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව මෙම පර්යේෂණාත්මක ලිපිය සම්පාදනය කරන ලදි.

## පර්යේෂණ ගැටලුව

පොළොන්නරු යුගයේ දී රචිත ගුරුළුගෝමීන්ගේ *අමාවතුර* හා විද්‍යාචක්‍රවර්තීන්ගේ *බුත්සරණ* විශිෂ්ට සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථ වශයෙන් සැලකේ. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පියසීලි විජේමාන්න හා එච්. ආර්. චන්ද්‍රසේන *අමාවතුර* පිළිබඳ ව වාක්‍ය විචාරාත්මක අධ්‍යයන සිදු කොට තිබේ. (කුලසූරිය, 1999: 154). *අමාවතුරෙහි* සංක්ෂිප්ත රචනා රීතිය, වර්ණනාව කථා වස්තුව හා මැනවින් සම්බන්ධ වී තිබීම සහ වචන කිහිපයක් තුළින් අරුත් රැසක් මවාපෑම යන ලක්ෂණ දක්නට ලැබේ. (කරුණාරත්න, 1974: 73).

*බුත්සරණ* රචනා වන සමය වන විට සිංහල භාෂාව ඊට ආවේණික ලක්ෂණ සහිත ව ප්‍රවර්ධනය වී තිබිණ. *සිදත් සඟරාවේ* සඳහන් නො වන වර්තමානයේ පවා භාවිත වන ව්‍යාකරණ ලක්ෂණ බොහොමයක් මෙහි දක්නට ලැබෙන්නේ එහෙයිනි. ක්‍රි. ව. 10 වන සියවසේ සිට ක්‍රි. ව. 13 වන සියවස දක්වා සිදු වූ භාෂා පරිණාමය ඉන් පසු අවධියේ දී (දහඅටවන සියවස දක්වා) සිදු වූ භාෂා පරිණාමයට සාපේක්ෂ ව වාක්‍ය විචාරය සම්බන්ධයෙන් සුවිශේෂ වැදගත්කමක් දරන බව පියසීලි විජේමාන්නගේ මතය යි. (Wijemanne, 1984: iii) .

*බුත්සරණේ* සරල හා සංකීර්ණ වාක්‍ය රටා විද්‍යමාන වේ. මෙහි *අමාවතුරට* සමාන වාක්‍ය රටා මෙන් ම *අමාවතුරෙහි* දක්නට නො ලැබෙන, නූතන ව්‍යවහාරයට සමාන වාක්‍ය රටා ද අන්තර්ගත වේ. තව ද *අමාවතුරේ* හා *බුත්සරණේ* අන්තර්ගත ඇතැම් භාෂා ලක්ෂණ වර්තමානයේ භාෂණ ව්‍යවහාරයට පැමිණ ඇති බව ද මෙම පර්යේෂණය තුළින් හෙළිදරව් විය.

*බුත්සරණෙහි* සාහිත්‍යමය වැදගත්කම පිළිබඳ ව බොහෝ පර්යේෂණ සිදු කොට ග්‍රන්ථ හා ලිපි ප්‍රකාශයට පත් කොට ඇතත් එහි අන්තර්ගත යථෝක්ත වාක්‍ය රටා පිළිබඳ ව වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත. එහෙයින් *බුත්සරණෙහි* අන්තර්ගත වාක්‍ය සංස්ථිතීන්හි විද්‍යමාන වන වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ අරමුණ

*බුත්සරණේ* වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හඳුනාගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර එහි අන්තර්ගත සරල හා සංකීර්ණ වාක්‍ය රටාවල වාක්‍ය සංස්ථිතීන්හි විද්‍යමාන වන වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හඳුනාගැනීම මෙහි උප අරමුණු වේ.

## පර්යේෂණයේ වැදගත්කම

පොළොන්නරු යුගයේ රචිත විශිෂ්ට සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක් වන *බුත්සරණෙහි* සාහිත්‍යමය වැදගත්කම පිළිබඳ ව බොහෝ ග්‍රන්ථ රචනා වී ඇතත් මින් පෙර එහි වාක්‍ය විචාරාත්මක අධ්‍යයනයක් සිදු වී නොමැත. මෙම පර්යේෂණාත්මක ලිපිය තුළින් *බුත්සරණේ* වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හඳුනාගත හැකි ය. එහෙයින් එය වාග්විද්‍යාත්මක වශයෙන් මෙන් ම සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය සම්බන්ධයෙන් ද බෙහෙවින් වැදගත් වේ.

## දත්ත විශ්ලේෂණය

දොළොස්වන ශත වර්ෂයේ අග භාගයට හෝ දහතුන්වන ශතවර්ෂයේ මුල් භාගයට හෝ අයත්


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක් වන *බුත්සරණෙහි* කර්තෘ, ග්‍රන්ථ නාමය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව ග්‍රන්ථාවසානයෙහි මෙසේ දැක් වේ.

"විද්‍යාචක්‍රවර්තීන් විසින් කළ අමෘතාවහ නම් බුධ චරිතය නිමි." (*බුත්සරණ*, 1953: 360).

මෙම කෘතිය රචනා කරන ලද්දේ 'විද්‍යාචක්‍රවර්තීන්' විසින් බවත්, ඔහු විසින් එයට දෙන ලද නම 'අමෘතාවහ' යන්න බවත්, එහි බුද්ධ චරිතය විදහා දැක්වෙන බවත් මෙම පාඨයෙන් හෙළි වේ.

මෙහි සඳහන් 'අමෘතාවහ' යන්නෙහි 'අමෘත සංඛ්‍යාත නිර්වාණය ලබා දෙන' යන අරුත ගැබ් ව පවතී. එහෙත් මෙම ග්‍රන්ථයෙහි ප්‍රකීර්ණක හා මිශ්‍ර කථා කාණ්ඩවල සෑම ප්‍රධාන පාඨයක් අන්තයෙහිත්, සෑම දමන කථාවක අවසානයෙහිත් යොදා ඇති " 'බුදුන් සරණ යෙමි'යි බුත්සරණ යා යුතු", " 'මහතාණන් සරණ යෙමි'යි බුත්සරණ යා යුතු" හා " 'සර්වඥයන් සරණ යෙමි'යි බුත්සරණ යා යුතු" ආදී පාඨ අනුව හාරසිය අසූ එක්වරක් හමුවන "බුත්සරණ යා යුතු" යන්න හේතු කොට ගෙන '*බුත්සරණ*' යන අපර නාමයක් භාවිතයට පැමිණ, වහරෙහි ජනප්‍රිය වී ඇත. (අභයසිංහ, 1999: 132, 133).

ත්‍රිපිටකයෙහි සඳහන් වන සූත්‍ර සහ අටුවා ඇසුරින් රචිත *බුත්සරණෙහි* අන්තර්ගතය අනුව ලබුගම ලඞ්කානන්ද හිමි එය පරිච්ඡේද සොළොසකට බෙදා දක්වා ඇත.

මෙම පර්යේෂණාත්මක ලිපියේ දී විමර්ශනය කරනු ලබන්නේ *බුත්සරණේ* වාක්‍ය විචාරාත්මක ලක්ෂණයන් ය.

කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාක්‍යාංශය අග ධාතු ප්‍රකෘතියට පර ව '-ත්' ප්‍රත්‍යය යෙදී, එය ද්විත්ව වශයෙන් යෙදීම *බුත්සරණෙහි* දක්නට ලැබේ.

උදා:

I. "එ වේලෙහි එ ඇතු ළං වත් වත් සැදැහැත්තො ළෙහි අත් ගසන්නට වන්හ, මුහුණැ අත් දෙන්නට වන්හ, බලා සිටියැ නො හෙම්හ'යි මුහුණින් හෙන්නට වන්හ. (*බුත්සරණ*, 1953: 82).

II. "... එ බලත් බලත් 'මෙ වැනි රුවට මී නියා ජරාවක් වන් කල්හි අප අපට මැ කියන්නෙ කිම්දැ'යි ...." (*බුත්සරණ*, 1953: 229).

III. "එ මිහිරි රුව ඇසැ හෙත් හෙත් එ මිහිරි කට හඬ කනැ හෙත් හෙත්, දකුණතින් ගත් කඩුව වැටීහෙන බව නො දැනැ ...." (*බුත්සරණ*, 1953: 65).

IV. "මෙ සේ පැතිරී සවනක් ඝන බුදු රසින් මුළු ලොවැ සදමින් වඩුත් වඩුත්, නුවර රසින් සැදෙත් සැදෙත් පිල් සත් විදහා ගෙයි ගෙයි මොනරුන් නටත් නටත් මැදිරියෙහි හුන් ගිරා සැළලිහිණි ආදී පක්ෂීන් පියා පැහැර හඬත් හඬත්, වීණා වේණු මිහිඟු බෙර ආදි ගැසුවන් නැති වැ තම තමා වැ හඬත් හඬත්, හන් පළන් ආභරණ තම තමා මැ කිඞ්කිණික ජාල සෙ මධුරනාද පවත්වත් පවත්වත්, මෙ සලකුණින් 'වැඩි දෑ වනැ'යි දික් කළ ඇසට ...." (*බුත්සරණ*, 1953: 80).

V. "වාතමණ්ඩලයෙන් තමන් ගෙ මඬුව අහසට නැඟෙත් නැඟෙත් 'අප දුකින් කරවාගත් මඬුව ගියෙ යැ'යි හඬමින්, ...." (*බුත්සරණ*, 1953: 104).

මෙම වාක්‍ය වින්‍යාස රටාව *අමාවතුරෙහි* ද දක්නට ලැබේ. මෙය නූතන ව්‍යවහාරයෙහි දක්නට නො ලැබෙන ලක්ෂණයකි.

කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාක්‍යාංශ සඳහා *බුත්සරණෙහි* 'කල්හි' යන්න ද යෙදී තිබේ. *අමාවතුරේ* ද මෙම ලක්ෂණය දක්නට ලැබේ.

උදා:

I. "... තාරකාවෝ යැ යනාදි වූ උජ්වල වූ ආභරණයන් උසුලන්නට වන් කල්හි, හැල් පිණිසැ ඉදි කළා වූ ලියැද්දේ පිපි මහනෙල් මල් හැල් ගෙවියන් සිත් සේ කඩා පළඳින කල්හි, සවාමිදරුවාණෝ වස් වසා අන්තයෙහි පවරා, ...." (*බුත්සරණ*, 1953: 121).

II. ".... ඔහු විසින් අනුදත් කල්හි නා විමනට වදනා ගරුඩ රාජයක්හු සෙ එ අග්නි ශාලාව ඇතුළට සැක නැති වැ වැඩැ, ...." (*බුත්සරණ*, 1953: 123).

III. ".... රතන සූත්‍රය වැනි ධර්‍ම රත්නයක් ලොවැ පහළ වුව මනා කල්හි, පස්වා දහසක් මුළුල්ලෙහි සියලු සත්ත්‍වයනට සියලු උපද්‍රව දුරු කරන ධර්‍ම නමැති ඖෂධ මහා වෘක්ෂයක් ලොවැ මුල් බට මනා කල්හි, සුවාසු දහසක් ප්‍රාණීන් එකහෙළා අමා මහ නිවන් දුට මනා කල්හි, එ තැන්හි හුන් පිරිසින් සමහර කෙනෙක් නැඟී සිටැ, ...." (*බුත්සරණ*, 1953: 170).

VI. "තව ද, තමන් වහන්සෙ වෙදිස පර්‍වතයෙහි ඉන්ද්‍රශාල නම් ගුහායෙහි වැඩැවසන කල්හි පඤ්ච පූර්‍වනිමිත්ත දැකැ ...." (*බුත්සරණ*, 1953: 232).

VII. "... පඤ්චශිඛයා යවා අවකාශ ඉල්ලා 'එන්නට කියව'යි වදළ කල්හි දෙදෙව් ලොවැ දෙවතාවන් හා සමඟ එක හැඳපලක් සා ලෙනට වැදැ ...." (*බුත්සරණ*, 1953: 232).

මෙම ව්‍යවහාරය වර්තමානයේ අභාවිත ව පවතී. නූතනයේ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සාදාගනු ලබන්නේ ධාතු ප්‍රකෘතියට පර ව 'ද්දී' යනුවෙන් යෙදීමෙන් හෝ වර්තමාන කෘදන්තයට පර ව 'විට' යනුවෙන් යෙදීමෙනි.

උදා:

I. උද හිරු නැඟෙද්දී සූරියකත් කුසුම් විකසිත වෙයි.

II. ගුරුතුමිය පන්තියට එන විට සිසුහු හුනස්නෙන් නැගිට්ට හ.

ඊට සමීප වාක්‍ය රටා ද *බුත්සරණේ* කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාක්‍යාංශ අතර දක්නට ලැබේ.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උදා:

I. "මෙසෙ මෙ තීර්ථකයන් වළහම් ගෙයෙකැ හඬන්නවුන් සෙ වියවුල් වැ හඬමින් සිටියැ දී, නැවැතැ ශක්‍රයා සුයර්දිව්‍යපුත්‍රයා කැඳවා ...." (*බුත්සරණ*, 1953: 104).

II. "බිසවුන් දරුවන් සොයා යා දී බොසතාණො ඇසිපිය නො බහා නිඳි වියො වැ හුන්නාහ." (*බුත්සරණ*, 1953: 353).

අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සඳහා *බුත්සරණේ* 'නම්' නිපාතය, 'ඉදින්' නිපාතය සහිත ව මෙන් ම රහිත ව ද යෙදී ඇත.

උදා:

I. "... "අපි දු ඉදින් ධූමයක් හළමො නම්, මේ නාගරාජයා තබා මුළු ලොව මැ ඉවසාගත නො හෙන්නෙ යැ, ...." (*බුත්සරණ*, 1953: 123).

II. "... 'වහන්සෙ, ඉදින් කැමැති සෙයෙක් නම් ආකාශයට මැ නැඟී ගත මැනැවැ'යි කීහ." (*බුත්සරණ*, 1953: 94).

III. "... ඉදින් තට බැරි නො වෙ නම්, මෙ තාගෙ ගිනිහල් ගෙයි අද එක රැය වසමෝ දැ'යි වදළ සේකැ" (*බුත්සරණ*, 1953: 122).

IV. "එ ආළවකයා බසක් අසන්නා කැමැති එකෙක් වී නම්, රුවක් බලන ඇසක් ඇති එකෙක් වී නම්, කීවක් සිතන සිතක් ඇති එකෙක් වී නම්, එ මා දැමූ සත්ත්වයන් අතුරෙහි ඌත් ගලවා ගන්නා බව නො දන්නි ද?" (*බුත්සරණ*, 1953: 139).

V. "ඉදින් යාචකයො අවුත් සිටැ 'මහරජ, තා ගෙ ඇස් උදුරා දෙව'යි කිවු නම්, දිගුපුළුල් නිල්නුවන් දෙක තල් ළොඳ දෙකක් සෙ උදුරා අතැ තබාලමි." (*බුත්සරණ*, 1953: 320).

ඉහත සිවුවන වැකියෙහි 'නම්' නිපාතය, 'ඉදින්' නිපාතය රහිත ව යෙදී ඇති අතර සෙසු වැකිවල 'නම්' නිපාතය, 'ඉදින්' නිපාතය සහිත ව යෙදී තිබේ.

වාක්‍යාරම්භයෙහි 'ඉදින්' නිපාතය රහිත ව වාක්‍ය මධ්‍යයේ 'නම්' නිපාතය වර්තමානයේ ද යෙදේ. වර්තමානයේ එය බහුල ව යෙදෙන්නේ භාෂණ සිංහලයේ ය.

උදා:

I. ඔයා යනවා නම් මාත් ඒ ගමනට එනවා.

'කෙසේද යත්' යන්න සහ එහි විකල්ප රූප ද අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා අර්ථයෙහි යෙදී ඇත.

උදා:

I. "ඔවුන් ගෙ ගමන් යහපත් නියාව කෙසේද යත්: හිරුගෙ තෙජස්, සඳු ගෙ සෞම්‍යගුණ, මහ මුහුදෙහි ගැඹුරු ගුණ ...." (*බුත්සරණ*, 1953: 37).

II. "සර්වඥයන් වහන්සෙ මෙතෙක් දුර තැන් වදළෙ කුමක් පිණිස ද යත්, ඒ සථානය සියලු බුදුන් වහන්සෙවරුන් දැ ගෙ මහා ප්‍රාතිහාර්‍ය කරන තැන් හෙයිනුත් නැවැත සෘධිප්‍රාතිහාර්‍ය බලන්නට මහා ජනයා රැස්වනු පිණිසත් දුරුතැන් දක්වා වදළ සේකැ." (*බුත්සරණ*, 1953: 100).

III. "එ කවර හඬ සතරෙක් ද යත්: විධුරපණ්ඩිතයන් වහන්සෙ ගන්නා පිණිසැ පූර්ණභද්‍ර නම් යක්ෂයා කුරු රට බැසැ ධනඤ්ජය නම් රජහු හා දූ කෙළැ දිනූ ක්ෂණයෙහි අත හෙළාපියා 'මම දිනිමි' ගහාලූ හඬ යැ ...." (*බුත්සරණ*, 1953: 144).

IV. "මෙ මැ සැටියෙ ලොකයෙහි අනිත් ආයුධ තුනෙක් ඇති. එ කවරෙ යත්: ශක්‍රයා ගෙ වජ්‍රායුධ යැ, වෛශ්‍රවණයාගෙ ගදායුධ යැ, මාරයා ගෙ පාරාවළල්ල යැ මෙ චෙලායුධය හා සතර යැ." (*බුත්සරණ*, 1953: 149).

V. "එ හි මසැස නම් කවරෙ ද යත්: යම් තැනෙක්හි ඇස රොම පිහිටියෙ ද, එ තැන්හි දියබෙරලිය මල පැහැ වූ ඉතා නිල් වූ පැහැ යැ, ..." (*බුත්සරණ*, 1953: 260).

මෙම ව්‍යවහාරය ද මේ වන විට අභාවයට ගොස් ඇති අතර වර්තමානයේ බොහෝවිට අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සකසා ගනු ලබන්නේ ධාතු ප්‍රකෘතියට පර ව '-ඔත්', '-හොත්' ප්‍රත්‍ය යෙදීමෙනි.

නූතනයේ මෙන් *බුත්සරණේ* ද කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව සකසාගැනීම සඳහා '-හොත්' ප්‍රත්‍යය යෙදී ඇති අන්දම පහත වැකියෙන් සනාථ වේ. මෙය *අමාවතුරේ* දක්නට නොමැති ලක්ෂණයකි.

උදා:

I. "එ ආයුධයෙහි බලවත්කම් කියත්: අහසට දැමුව හොත් දෙළොස් හවුරුද්දක් වැසි නැති වැ යෙයි; බිමට ගැසුව හොත් එතෙක් මැ කල් බිම තිලන තණගැටෙක් නැති වැ යෙයි, මුහුදට දැමුව හොත් සියලු මුහුද පැළී වළලු ගැසී වියැළීයෙයි, මහමෙරට ගැසුව හොත් කිළිල්කඩක් සෙ කපා-ගෙනැ යෙයි." (*බුත්සරණ*, 1953: 149).

*බුත්සරණෙහි* සමීකරණ වාක්‍ය ද දැකිය හැකි ය. මෙහි සමීකරණය දැක්වීමේ දී අවධාරණාර්ථයේ 'නම්' නිපාතය යෙදී ඇත.

උදා:

I. "ඇසට රසඳුනක් බඳු වූ පුතුන් වැදුවෝ නම් චන්ද්‍රාදේවීහ, පුතුන් ලද්දෝ නම් මහාප්‍රතාප රජ්ජුරුවෝ යැ"යි එකපැහැර තුඩ තුඩ කියැවූ හ." (*බුත්සරණ*, 1953: 13).

II. "නුඹ ගෙ මනහර රූ දුටු හෙයින් ඇස් ලද්දමෝ නම් අපි යැ, නුඹ ගෙන් කන්කලු බස් ඇසූ හෙයින් කන් ලද්දමෝ නම් ඇපි යැ, නුඹ ගෙ ගුණයෙහි මිහිරි විඳි හෙයින් සිත් ලද්දමෝ නම් අපි යැ, ...." (*බුත්සරණ*, 1953: 39).

මෙම වාක්‍ය රටාව වර්තමානය වන විට ලේඛන සිංහලයේ අභාවිත ව ඇති අතර භාෂණ සිංහලයේ ඇතැම්විට භාවිත වේ.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උදා:

I. "මේක නං ඔයාගෙ වැඩක් තමයි."
II. "මේ සැරේ නං ක්‍රිකට් ලෝක කුසලානෙ දිනුවෙ ඕස්ට්‍රේලියාව."
III. "සුමාලි නං හරිම හුරුබුහුටි ගෑනු ළමයෙක්."

මෙහි දී 'නම්' නිපාතය භාෂණ සිංහලයට අනුකූල ව 'නං' යනුවෙන් යෙදී තිබේ.

'සුදුසු' යන පදය ද *බුත්සරණේ* වාක්‍යවල විවිධාකාරයෙන් යෙදී තිබෙනු දැකිය හැකි ය.

උදා:

I. "මේ පාත්‍රය ද නුඹ වහන්සෙට මැ සුදුසු යැ,...." (*බුත්සරණ*, 1953: 96).
II. "මෙසෙ උපද්‍රව ඇති තැනෙක තපස්වීන් වසන්නට සුදුසු නො වෙයි; සවාමීන් අනික් තැනකට වඩනා බව සුදුසුයැ'යි කීයැ." (*බුත්සරණ*, 1953: 138).

යථෝක්ත වාක්‍යවල මෙන් වාක්‍යාවසාන 'ය' නිපාතය සහිත ව 'සුදුසු' යන්න වර්තමානයේ යෙදෙන්නේ කලාතුරකිනි. වර්තමානයේ බොහෝවිට එයට පර්යාය පද වන 'උචිත', 'යෝග්‍ය' ආදී පද වාක්‍යාවසාන 'ය' නිපාතය සමග භාවිත වේ. යථෝක්ත අවසන් වාක්‍යයේ ප්‍රථම අන්තර් වාක්‍යයේ මෙන් නිෂේධාර්ථ ක්‍රියා පදයකට පූර්වයෙන් 'සුදුසු' යන පදය යෙදීම වර්තමානයේ ද දක්නට ලැබේ. නූතන ව්‍යවහාරයෙහි ඒ සඳහා බොහෝවිට යෙදෙනුයේ 'නු' නිපාතය යි.

පුනරුක්තිය *බුත්සරණේ* දක්නට ලැබෙන වාක්‍ය වින්‍යාස ලක්ෂණයකි. මෙහි දී කෘදන්ත රූප, පූර්ව ක්‍රියා රූප, ප්‍රච්ඡන්න ක්‍රියා රූප, නිපාත හා ඇතැම් පද ද *බුත්සරණේ* වාක්‍යවල පුනරුක්ත වශයෙන් යෙදී තිබෙනු දැකිය හැකි ය.

**කෘදන්ත රූප:**

උදා:

I. "මා දීපඞ්කරපාදමූලයෙහි අතට පත් නිවන් හැර සසරට වැදැ හිස් කපා දුන්නෙ, ඇස් උපුටා දුන්නෙ, තෙලියත්හි පෙළී ලේ දුන්නෙ, සියතින් ලියා මස් දුන්නෙ, අඹුදරුවන් දුන්නෙ සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි මහ දුක් ගත්තෙ මැ පිණිසා වේදැ'යි සිතා අනඳ මහ තෙරුන් වහන්සෙ අතින් පාත්‍රය හැර-ගෙනැ කැවුම් පිළිගෙනැ වදළ සේකැ." (*බුත්සරණ*, 1953: 233, 234).
II. "තව ද, සසර දුකට පිළියම් කියන, නිවනට නිසි ප්‍රතිපත්ති කියන, කුසල් අකුසලයට නිසි විපාක කියන, වරදට නිසි ආපත්ති කියන, ආසය අනුසය දෙකට නිසි දහම් කියන, තමන් ගෙ කායචිත්ත ප්‍රයොගය හා හැනෙන බස් කියන, නො වළහා අනුන් ගෙ ගුණ කියන 'කරව'යි කටයුත්තක් මැ කියන, 'නො කරව'යි නොකටයුත්තක් මැ කියන, දහමැයි නොදහම් නොකියන, කුසල් හා පව් නොමුසු කරන, පව් හා කුසල් නොමුසු කරන, 'හරුව'යි හැරැපියැ යුත්තක් මැ කියන, 'ගනුව'යි ගත යුත්තක් මැ කියන 'බුදුන් සරණ යෙමී' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953: 300, 301).
III. "තව ද, සසර පමණින් ආවා වූ යාචකයනට 'ඉදෙව' යන, භයපතුනට 'මම යැ' යන, උගහට පැනයට 'දන්මී' යන, 'බණ යැ'යි කිව 'කියමී' යන, මවුන් පියන් ගුරුන් ආදීන් වුව 'වඳිමි, පුදමි' යන, දහමට පිහිටයෙමි' යන, සබවසට 'දිවි දෙමි' යන, බොරුවට 'වෙවුලමී' යන, 'සාධූන් දකිම්ව'යි යන, අසාධූන් හා එක් වැ නො පැසෙම්ව'යි යන, අත්පා ආදි කපන්නන්ට 'ක්ෂමා කෙරෙමී' යන, හිස් සිඳිනවුනට 'දිගායු වේව'යි යන, 'පඤ්චකාම යැ'යි කිව 'නිඤ කෙරෙමී' යන, 'සංස්කාර ධර්ම යැ'යි කිව 'අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැ'යි යන, ...." (*බුත්සරණ*, 1953: 305-306).

**පූර්ව ක්‍රියා:**

උදා:

I. "... නොයෙක් සිවුපාවො තමන් මුඛයෙන් ගත් තණ කබල කාත් නො පියා, හෙළාත් නො පියා එ හඬ අසා සිටිති." (*බුත්සරණ*, 1953: 256).
II. "තව ද මල් පිපි පරසතුරුකක් සෙ තමන් උපන් ලොව සුවපත් කළ, මහසායෙහි මහ වැව් පුරා වට වැස්සක් සෙ තමන් උපන් ලොව දහම් වැස්සෙන් සුභික්ෂ කළ, කෙවුන්නෙහි බඳ රුවනක් සෙ තමන් උපන් ලොව සනාථ කළ, මිහි බඳ ගසක් සෙ තමන් උපන් ලොව මිහිරි කළ, භද්‍රජාති ඇතුන් සිටි කාලිඞ්ග වනයක් සෙ තමන් උපන් ලොව මහඇගි කළ, මහ ඇගි මුතු දෙන මුතු මුවදෙර මුහුදක් සෙ තමන් උපන් ලොව ධර්මරත්නාකර කළ, ගොකුණෙහි සිටි ගොරදක් සෙ තමන් උපන් ලොව මඞ්ගල්‍ය කළ, සඳුන් කපුරු උපදනා දඬවන බෙහෙදක් සෙ තමන් උපන් ලොව මිල වැඩි කළ, මහානිධානයක් එබු ප්‍රදෙශයක් සෙ 'වැඩසිටි තැන කොතැන දෝ හො'යි ලොවැස්සන් ලවා විමසවන, විදර්ශනායෙහි ඵලසිතක් සෙ සාරපරම්පරායෙහි කෙළවර සිටියා වූ 'බුදුන් සරණ යෙමී' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953: 310).
III. "... මහා උත්සාහයෙන්, මහා පරාක්‍රමයෙන් 'අඹුවෝ යැ'යි නො සිතා 'දරුවෝ යැ'යි නො සිතා 'රාජ්‍ය යැ'යි නො සිතා, 'මස් යැ'යි නො සිතා, 'හිස යැ'යි නො සිතා, 'ලෙහෙ යැ'යි නො සිතා ජීවිත යැ'යි නො සිතා 'මුළු ලොව මෙ සසර දුකින් කවර ද ගලම් දෙහො'යි යන සිතින් එක් දවසක් කරන යත්නයක් සෙ, එක පැයක් කරන යත්නයක් සෙ මහායත්න කොටැ ...." (*බුත්සරණ*, 1953: 236).
IV. "... එකුන්තිස් හවුරුද්දක් පඤ්චකාමසුව අනුභව කොටැ බ්‍රහ්මයන් එළැ වූ සත්පූර්ව නිමිත්ත දැකැ වදුරා, පඤ්චකාමයෙහි ආදීනව හා මහණවීමෙහි අනුසස් ද දැකැ වදුරා, රාහුල කුමාරයන් වහන්සෙ වැනි පුත්රුවනක් උපන් දවස් ...." (*බුත්සරණ*, 1953: 237).


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**ප්‍රච්ඡන්න ක්‍රියාඃ**

උදාඃ

I. "... නිම් වළල්ලෙන් යුක්ත වූ සිසාරා සිටැ බලනුවනට පතුල් මැදැ තේරිතේරී පැනෙන නාභි ඇති, වට රෙඛා ඇති, නාභිමුඛය සිසාරා සිටි වට ඇති, මැදින් පැනෙන වට රෙඛා ඇති, දුරට මැ පැනෙන්නා වූ දැවි හා දැවියෙහි වට රෙඛා හා නිම්වළලු හා නෙමි මාණික්‍ය ඇති, සක්ලකුණින් හොබනා වූ, ...." ( *බුත්සරණ*, 1953ඃ 248).

II. "... 'මෙමැ නියා දනාධ්‍යාශයෙක් මුළු ලොවැ කවුරුන් කෙරෙහි ඇද්ද! මෙසෙ වූ අද්භූතයක් දුටුවිරුවො ඇද්ද! මෙ වැනි ආශ්චර්‍ය්‍යයක් ඇසුවිරුවො ඇද්ද? මෙසෙ විස්මය වූ දනසම්භාර ඇති 'එ මහතාණන් හා එක් වම්හ'යි 'එ උතුමා උපන් උපන් තැන්හි මැ උපදමොව'යි, මෙ වැනි අදහසෙක් සියලු සත්ත්‍වයනට වාසනා වේව'යි." (*බුත්සරණ*, 1953ඃ 319, 320).

**නිපාතඃ**

උදාඃ

I. "දෙරළ දෙරළ නැඟි සඳක් සෙ, හැම සතුන් තම තමන් ජීවිතයක් සෙ, නො හැකිළැ පිපි වනින් සිටිනා රත් පියුමක් සෙ, කර රස නැතිවැ අමා රස ගත් මහ මුහුදක් සෙ, හැම කල්හි මැ අඩු නොවැ සිටිනා පුන් සඳක් සෙ, පණු පිලවුන් නොවන් මිහි වදයක් සෙ, සෙණබය නැති මහ මේකුළක් සෙ, නො නැසී සිටිනා විදුලියක් සෙ, නො මිරිකී තිබෙන යෞවනයක් සෙ, මරින් නොමැකෙන ජීවිතයක් සෙ, දුගීන් අතැපත් මහා නිධානයක් සෙ, මහ සායෙහි ලද අනැගි රස භොජනයක් සෙ, මහ සයුරෙහි නැව් බුන් තැන්හි දුටු මහ දිවයිනක් සෙ, ආදි කප්හි මහ අඳුරෙහි දුටු ළහිරු මඬලක් සෙ, සසර බියෙහි දුටු නිවන් මඟක් සෙ, මහ ලෙඩෙක්හි ලද දිව බෙහෙදක් සෙ, දුකෙහි ලත් පිටිවහලක් සෙ, මරුකතරෙහි දුටු මහවිලක් සෙ, 'මුළු ලොවමැ අමුතු වැ මිහිරි වැ දුටු බුදුන් සරණ යෙමී' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953ඃ 4).

II. "... රෑ දහවල් 'කවරක්හු දෙව් ලොවැ ලාලම් දෙ හෝ, කවරක්හු බඹ ලොවැ ලාලම් දෙ හො කවරක්හු අමා මහ නිවන්හි ලාලම් දෙ හෝ, කවරක්හු නිරැ දුකින් ගලවම් දෙ හෝ, කවරක්හු තිරිසන් දුකින් ගලවම් දෙ හෝ, කවරක්හු ප්‍රේත දුකින් ගලවම් දෙ හෝ, කවරක්හු අසුරකායෙන් ගලවම් දෙ හෝ'යි මිනිස් ලොවින් නා ලොවට, නා ලොවින් ගුරුළු විමනට, ගුරුළු විමනින් දඹදිවට, දඹදිවින් ලක්දිවට, ලක්දිවින් දඹදිවට දිවෙමින් සියලු සතුන් පිණිසැ ඇවිදැ නො විඩා වැ දුග්ගත් බුදුන් සරණ යෙමී' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953ඃ 34).

III. "එ ආළවකයා බසක් අසන්නා කැමැති එකෙක් වී නම්, රුවක් බලන ඇසක් ඇති එකෙක් වී නම්, කීවක් සිතන සිතක් ඇති එකෙක් වී නම්, එ මා දැමූ සත්ත්‍වයන් අතුරෙහි උෟත් ගලවා ගන්නා බව නො දන්නි ද?" (*බුත්සරණ*, 1953ඃ 139).

IV. "... සවසතික යැ ශ්‍රී වත්ස යැ නන්‍ද්‍යාවර්ත යැ සෞවස්තික යැ අවතංසක යැ වර්ධමානක යැ භද්‍රපීඨ යැ ප්‍රසාද යැ තොරණ යැ ශෙවතචඡත්‍ර යැ මඟුල්කඩුව යැ මිණිතල් වැට යැ මොනරපිල්කලඹ යැ චාමර යැ නළල්පට යැ මිණිරුවනැ දැසමන්මල්දම යැ නීලොත්පල යැ රක්තොත්පල යැ රක්තපද්ම යැ ශෙවතපද්ම යැ පූර්ණකලස යැ පූර්ණපාත්‍ර යැ සප්තසාගර යැ චක්‍රාවාටපර්වත යැ හිමාලය පර්වත යැ මහමෙරු පර්වත යැ හිරමඬුලු යැ සඳමඬුලු යැ දෙ දහසක් කොදිව් පිරිවර කොටැ ඇති සතර මහාවිප යැ පිරිස් සහිත වූ සත්රුවනින් හෙබි චක්‍රවර්ත්තියැ දක්ෂිණාවර්ත වූ ධවල ශඞ්ඛ යැ සවර්ණ මත්ස්‍ය යුගල යැ චක්‍රායුධ යැ පඤ්ච මහා ගඞ්ගා යැ සප්ත-කුලපර්වත යැ සප්ත දහතලා යැ ගරුඩරාජ යැ ශිශුමාර යැ ධ්වජ යැ පතාකා යැ රන්සිවි ගෙ යැ සවර්ණවාලව්‍යජන යැ කෛලාසපර්වත යැ සිංහරාජ යැ ව්‍යාඝ්‍රරාජ යැ, වලාහක අශව රාජ යැ උපොෂථ හසති රාජ යැ වාසුකී නාගරාජ යැ හංස රාජ යැ වෘෂභ රාජ යැ ඓරාවණ හසති රාජ යැ ස්වර්ණමකර යැ සත්රුවන් මහා නෞකාව යැ වසුපස්සෙහි ලු දෙන්නු යැ කිම්පුරුෂ යැ කින්නරී යැ කුරවි කෙවිල්ලො යැ මයුර රාජ යැ ක්‍රෞඤ්ච රාජ යැ චක්‍රවාක රාජ යැ ජීවඤ්ජීවක නම් පක්ෂි රාජ යැ ස දිව්‍යලොක යැ සොළොස් බඹතල යැ යන මෙතෙක් ලක්ෂණ තාක් යටපත්ලෙහි පැනෙන හෙයින් මුළු ලොවැ තමන් සරණ වන් බව හඟවන්නාක් වැනි වූ, ශක්‍රයා හිස තබා සැතැපෙන බිස්සක් වැනි වූ සොධා හළ පැන් මහා බඹ හට අභිෂේකජල කළා වූ, ශ්‍රී පාද ඇති වන බැවින් දෙවන මහා පුරුෂ ලක්ෂණයෙන් හෙබී සිටියා වූ බුදුන් සරණ යෙමී' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953ඃ 248, 249).

V. "බොධිසත්ත්ව කලැ විධුරපණ්ඩිත වැ මනුෂ්‍යරාජයකු හා නාගරාජයකු හා ගරුඩරාජයකු හා එක විටැමැ විචාළ පැන ක්ෂණයෙහි විසඳා නාගරාජයා ගෙ කණ්ඨමාණික්‍යයෙන් හා ගරුඩරාජයා ගෙ රන් මාලායෙන් හා ශක්‍ර දිව්‍යරාජයා ගෙ දිව සළුයෙන් හා මනුෂ්‍යරාජයා ගෙ ගෙරි දහස් ආදීන් හා පූජා ලැබත් පැන විසඳූ හ." (*බුත්සරණ*, 1953ඃ 151).

VI. "එක් බුදු කෙනකුන් වහන්සෙ සක්මන් කරන කල්හි අනිත් බුදුන් වහන්සෙ වැඩහෝනා සේක් හෝ යැ, වැඩ සිටිනා සේක් හෝ යැ, වැඩහිඳිනා සේක් හෝ යැ." (*බුත්සරණ*, 1953ඃ 112, 113).

VII. "පන්සියක් රාජකුමාරවරුන් රහත් කොටැලා මහා වනයෙහි වැඩැහිඳැ කැටි වූ දිව්‍යබ්‍රහ්මයනට මහාසමය සූත්‍රය දෙසා-වදළ දවස් දැ, දෙළොස් හවුරුද්දක් මුළුල්ලෙහි පොළො තෙලෙ සිටැ බඹලොව දක්වා සියලු සතුන් විසඳාගත නුහුණු මඞ්ගල ප්‍රශ්නය


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විසඳා මහාමඞ්ගල සූත්‍රය දෙසා-වදළ දවස් ද, තමන් වහන්සෙ ගෙ පුත් වූ රාහුල කුමාරයන් වහන්සෙට අවවාද කරනු පිණිසැ අම්බලට්ඨිකාවට වැඩැ රාහුලොවාද සූත්‍රය දෙසා-වදළ දවස් ද, සමචිත්තපරියාය සූත්‍රය දෙසා-වදළ දවස් දැ'යි මේ සතර තැන්හි ...." (*බුත්සරණ*, 1953: 244).

මේ අතුරින් වර්තමාන සිංහල වාක්‍යවල මෙසේ පුනරුක්ත ව යෙදෙන්නේ 'හෝ', 'ද', 'ත්' ආදී නිපාත පමණි.

උදා:

I. සුනිල් ද, කමල් ද, නිමල් ද, අමල් ද පුහුණුවීම් කටයුතු සඳහා ක්‍රීඩාංගණයට ගිය හ.
II. විදුහල්පතිතුමා ත්, ආචාර්ය මණ්ඩලය ත්, දෙමව්පියන් අතුරින් කිහිපදෙනෙකු ත්, උසස් පෙළ සිසුහුත් චාරිකාව සඳහා සහභාගි වූ හ.
III. සුරේනි හෝ සුනන්ද හෝ මම හෝ කෙටි දුර ධාවන ඉසව්ව සඳහා සහභාගි වෙමි.

එකම වාක්‍යයක් තුළ ඇතැම් පද නැවත නැවත යෙදීම හෙවත් පද පුනරුක්තිය *බුත්සරණේ* ප්‍රකට භාෂා ලක්ෂණයකි. ඒ පිළිබඳ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**සුදුසු:**

උදා:

I. "උන් වහන්සෙ විසින් සුදුසු සුදුසු කොටැ ප්‍රාතිහාර්‍ය්‍ය දැක් වූ කල්හි කරන සාධුකාර කොලාහල යැ'යි දැන්වූ සෙයෙකැ." (*බුත්සරණ*, 1953: 97, 98).
II. "සෙසු සුයාම-සන්තුසිතාදි දිව්‍යපුත්‍රයෝ තමන් තමනට සුදුසු සුදුසු වූ වල් විදුනා දි වූ නොයෙක් මඞ්ගලෝපකරණ ගෙනැ නික්මුණහ." (*බුත්සරණ*, 1953: 117).

මෙම වාක්‍යවල මෙන් 'සුදුසු' යන පදය ද්විත්ව වී යෙදෙනු වර්තමානයේ දක්නට නො ලැබේ.

උදා:

I."එසේ අශෝභන ලෙස හැසිරීම ඔබ වැන්නකුට සුදුසු නො වෙ යි."

**ලදින්:**

උදා:

I. ".... සෝවන්මග ලදින් සොවන් ඵල ලදින්, සකෘදගාමි මග ලදින් සකෘදගාමි ඵල ලදින්, අනාගාමිමග ලදින් අනාගාමිඵල ලදින්, රහත් මග ලදින් රහත් ඵල ලබන විට මැ එකොළොස් දහස් පන්සියක් ගඞ්ගා වැදැ පිරීගිය මහ මුහුදක් සෙ ...." (*බුත්සරණ*, 1953: 273).

**කෙනෙකුව:**

උදා:

I. "සවාමීනි, තෙපි සඳුට වඩා සෞම්‍ය කෙනෙකුව, හිරුට වඩා තෙජස් ඇති කෙනෙකුව, මුහුදට වඩා ගැඹුරු කෙනෙකුව, මහමෙරට වඩා අචල කෙනෙකුව, සියලු රුවන්හි, සියලු මල්හි සියලු තරුවෙහි, සියලු විදුලියෙහි, සියලු දෙව් දුන්නෙහි සියලු සන්ධ්‍යා වලායෙහි, සියලු සරද්වලායෙහි පැහැ තාක් එක් කොටැ අළලාපියා, ...." (*බුත්සරණ*, 1953: 240).

**දවස් ද:**

උදා:

I. "... බිම්සර රජ්ජුරුවන් ගෙ ගෙහි වැඩැ හිඳැ තිරොකුඩ්ඩ සූත්‍රය වදළ දවස් ද, සුමනමාලාකාර සමාගමයෙහි බණ වදළ දවස් ද, බදිරඞ්ගාර ජාතක සමාගමයෙහි බණ වදළ දවස් ද, ජම්බුකාජීවක සමයෙහි බණ වදළ දවස් ද, ආනන්‍දසෙට්ඨි සමාගමයෙහි බණ වදළ දවස් ද වෙන වෙන මැ සුවාසූ දහසක් ප්‍රාණීන් අමාමහ නිවන්හි ලූ 'බුදුන් සරණ යෙමි' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953: 243, 244).
II. "පන්සියක් රාජකුමාරවරුන් රහත් කොටැලා මහ වනයෙහි වැඩැහිඳැ කැටි වූ දිව්‍යබ්‍රහ්මයටනට මහාසමය සූත්‍රය දෙසා-වදළ දවස් ද, දෙළොස් හවුරුද්දක් මුළුල්ලෙහි පොළො තෙලෙ සිටැ බඹලොව දක්වා සියලු සතුන් විසඳා-ගත නුහුණු මඞ්ගලප්‍රශ්නය විසඳා මහාමඞ්ගල සූත්‍රය දෙසා-වදළ දවස් ද, තමන් වහන්සෙ ගෙ පුත් වූ රාහුල කුමාරයන් වහන්සෙට අවවාද කරනු පිණිසැ අම්බලට්ඨිකාවට වැඩැ රාහුලොවාද සූත්‍රය දෙසා-වදළ දවස් ද, සමචිත්තපරියාය සූත්‍රය දෙසා-වදළ දවස් දැ'යි මෙ සතර තැන්හි සියයෙකැ දහසෙකැ ලක්ෂයෙකැ කොටියෙකැ ප්‍රකොටියෙකැ යනාදි හිමක් නැති වැ අසඞ්ඛ්‍ය බැගින් අනන්තාපරිමාණ සත්වයන් නිවන් මහ පුරයෙහි ලූ 'බුදුන් සරණ යෙමි' බුත්සරණ යා යුතු." (*බුත්සරණ*, 1953: 244).

**බව යැ:**

උදා:

I. "තව ද, පිරී තිබෙන්නා වූ ඇඟිලි ඇති බව යැ, තව ද ක්‍රමයෙන් සිහින් වැ ගිය ඇඟිලි ඇති බව යැ, තව ද වට වූ ඇඟිලි ඇති බව යැ, තව ද රත් වැ තිබෙන්නා වූ නිය ඇති බව යැ, තව ද සිනිඳු වූ නිය ඇති බව යැ, තව ද සැඟැවී තිබෙන්නා වූ බොලැට ඇති බව යැ, ...." (*බුත්සරණ*, 1953: 258-260).

එක ම විශේෂණ පද, නාම පද, ක්‍රියා පද හා කෘදන්ත පුනරුක්ත ව සිංහල වාක්‍ය තුළ යෙදීම මේ වන විට අභාවයට ගොස් ඇත.

*බුත්සරණෙහි* අන්තර්ගත තවත් වාක්‍ය රටාවක් නම් උක්ත නාම පදයට අනතුරු ව කෘදන්ත නාමයක් යෙදී සැකසුණු නාම විශේෂණ වාක්‍යාංශ සහිත වාක්‍ය යි.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

උදා:

I. "ඕ එක් දවසක් පතුල් පහණින් සොධන්නී පළමු වත් කළ පැන් මඳක් ගොස් වියැළි-ගියා දුට, ...." (*බුත්සරණ*, 1953: 224).

II. "... ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ තමා ගෙ පුරස්ත්‍රීන් කෙරෙන් එක් ස්ත්‍රියක කැඳවා කියන්නෙ: 'පෘථිවියෙහි යම් වස්තුවක් තිට ප්‍රිය ද එයට දසවරයක් ගනැ'යි කීයැ." (*බුත්සරණ*, 1953: 316).

III. "එ අසා බැමිණිය කියන්නී 'තො සඞ්ග්‍රාම භූමියට නො වැදැ මැ පැරැදි එකකු වැන්නෙහි, ජඩ වූ තඹවිටිමැලිය, මට කන්නලවු නො පිරුවා ගොස් රජ්ජුරුවන් අතින් කෙල්ලක කොල්ලකු ගෙනෙව'යි කියා බමුණා වෙර ලේ කයි." (*බුත්සරණ*, 1953: 337).

IV. "බෝසතාණො ලොකු කුමාරයන් කැඳවා කියන්නාහු 'පෙරමඟට ගොස් බමුණා අතැ කෙඞ් පිරිකර ගෙනැ කැඳවාගෙනැ එව'යි යැවූ හ." (*බුත්සරණ*, 1953: 342).

V. "එ මැ දවස් සඳ මහ රජාණො සවප්නයක් දක්නාහු; මිනිසකු අවුත් රන්මල් දෙකක් තමන් අතට දුන්නා දැකැ, පිබිදැපියා චතුර්වෙදයෙහි නිපුණයන් ගෙන්වා-ගෙනැ තමන් දුටු සවප්නය විචාළහ." (*බුත්සරණ*, 1953: 355, 356).

මෙම වාක්‍ය රටාව *අමාවතුර, බුත්සරණ* යන ග්‍රන්ථද්වයේ ම බහුල ව දක්නට ඇතත් මේ වන විට එය අභාවයට ගොස් ඇත.

යමෙක් සිතූ දෙයක් පිළිබඳ ව දැක්වීමේ දී කෙටි වාක්‍යාංශයකින් සිතූ බව දක්වා ඉන් අනතුරු ව සිතූ දෙය දැක්වීමේ වාක්‍ය රටාව *අමාවතුරේ* මෙන් ම *බුත්සරණේ* ද දක්නට ලැබේ. මෙම ග්‍රන්ථයෙහි මෙම වාක්‍ය රටාව යමෙක් කියූ දෙයක් පිළිබඳ ව දැක්වීමේ දී ද යෙදී තිබේ.

උදා:

I. "මෙසෙ දන් කෙළි මැ කෙළි කොටැ දන් දී අට හැවිරිදි වයස් වූ කල විසිතුරු වූ ප්‍රසාදයෙහි පනවන ලද ශ්‍රී යහන් මසතකයෙහි පලක් බැඳ වැඩහිඳැ සිතන්නාහු; "මා ඉපැදැ දන ක්‍රියාවෙහි සුව නො විඳැ දවස් ගණනෙක් නිකම් මැ ගියෙ යැ, හෙ දැන් අට හවුරුද්දෙකැ, තව ද දවස් මෙසෙ මැ යේ දෝ හො'යි ...." (*බුත්සරණ*, 1953: 320).

II. "බිසවු කියන්නාහු 'සවාමීනි, නුඹ වහන්සෙ පෙරැ දන් දෙන්නට කියත් මුත් නගා තබන්නට නො කියන සේකැ, දැන් කුමක් සඳහා මෙසෙ වදළඳැ දැ'යි සැක කොටැ පිළිවිස්සාහ." (*බුත්සරණ*, 1953: 325)

III. "... සිත් නමැති දිය එවැ නිවා සිතන්නාහු: 'දන් නමැති සත්‍ය ක්‍රියාව දෙෂයැ'යි කී නගරවාසීන් සිත් ගන්නට නො පිළිවෙනැ ...." (*බුත්සරණ*, 1953: 326).

IV. "එ සඳැ වෙසතුරු මහරජාණො සිතැ ඇත්ත කියන්නාහු: 'සොඳුර, අප ගෙ ඇතු දන් දුන්නෙන් නගරවාසී කිපී අප මෙ රටැ නො හින්දැ දී වඞ්ගගිරි වනයට යවන්නට සම්මත කළොල, එසෙ හෙයින් ඇපි වනයට යම්හ, අප වලට ගියහ'යි දළ සෝදුකින් නො තැවී සුව සෙ ජීවත් වව, දරුවන් දෙබිහින්නන් කෙරෙහි බියපත් වව. සොඳුර, තොප දිවි රැක්මෙහි සිත් ඇති වව, අප ගිය කලැ තොප රක්ෂා කරන සවාමිකෙනකුන් ඇත. උනට කීකරු වැ අත්පාමෙහෙ කරව, තව ද දරුවන් කෙරෙහි බියපත් වව'යි කීහ." (*බුත්සරණ*, 1953: 326).

V. "එ සඳැ වුසතිදෙවී ද යෙහෙළණින් බස් අසා පුතණුවන් කෙරෙහි කළ ශොකයෙන් හඬමින් කියන්නාහු: 'සෙලින් හී මියෙම් මැ යැ, දිව ඇදැ කා මියෙන් මැ යැ, සිරිඟි කා මියෙම් මැ යැ, ගිනි වැදැ මියෙම් මැ යැ, මාගෙ මඳ වරදකුත් නැති ම-පුතණුවන් වනාන්තර යවත් නොහැම්මෙමි, නගරවාසීන් ගෙ කියමන් ගෙනැ ම-පුතණුවන් වනාන්තර යවා නම් 'මී සැලු' කල මැස්සන් පලන්නා සෙ තොප ගෙ රජය නස්නෙ වේදැ'යි කීහ." (*බුත්සරණ*, 1953: 327).

වර්තමාන ව්‍යවහාරයේ දී යමෙකු සිතූ දෙයක් පිළිබඳ ව 'සිතී' යන ආඛ්‍යාතයෙන් අවසන් වන කෙටි වාක්‍යාංශයකින් දක්වනු නො ලැබේ. ඊට විකල්ප වශයෙන් නූතන ව්‍යවහාරයේ සිදුවන්නේ උක්තය හා ආඛ්‍යාතය අතරට සිතූ දෙය උද්ධෘත පාඨ ලක්ෂණ යටතේ යෙදීම යි.

උදා:

I. සුනිමල් "මම හොඳින් ඉගෙන, උසස් රැකියාවකට ගොස් දුගී බවින් අත් මිදෙමි"යි සිතී ය.

නූතන ව්‍යවහාරයේ යමකු පැවසූ දෙයක් පිළිබඳ ව සඳහන් කරන්නේ ද උක්තය හා ආඛ්‍යාතය අතරට පැවසූ දෙය උද්ධෘත පාඨ ලක්ෂණ යටතේ යෙදීමෙනි.

උදා:

I. සුනිමල් "අම්මේ, මට විභාගෙට කොළඹ යන්න තියෙන්නෙ හෙට උදේ පාන්දර"යැයි පැවසී ය.

ප්‍රකාශයට අනතුරු ව උක්තය හා ආඛ්‍යාතය යෙදීමේ වාක්‍ය රටාවක් ද නූතන ව්‍යවහාරයේ පවතී.

උදා:

I. "ඉදිරි වසර කිහිපය තුළ විරැකියා ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් ගේනවා"යැයි ජනාධිපතිතුමා ප්‍රකාශ කළේ ය.

තමන් නිශ්චිත ව දන්නා දෙයක් පිළිබඳ ව අවධාරණාර්ථයෙන් ඇසීම සඳහා භාවිත වූ 'වේද' යන්න සහිත වාක්‍ය රටාවක් *බුත්සරණෙහි* දැකිය හැකි ය.

උදා:

I. "හැයි සවාමිනී, නුඹ ගෙ ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය බලන්නට වේ ද මා එන්නෙ?" (*බුත්සරණ*, 1953: 105).


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

II. "සියලු සේනාව බිඳී ගිය කලැ <u>වේ ද</u> රජ්ජුරුවන් තමන් ඇතු නැඟෙන්නෙ?" (*බුත්සරණ*, 1953: 107).
III. "ආළවකය, කුමක්හි හසළ කළ සුව එළවන්නෙ දැ'යි කියා <u>වේ ද</u> තා විචාරන්නෙ?" (*බුත්සරණ*, 1953: 153).
IV. "මෙ දඹදිවට සලකුණු වූයෙ දඹ ගස් <u>වේ දැ</u>'යි කියා ...." (*බුත්සරණ*, 1953: 190).
V. "... එසේ හෙයින් <u>වේ ද</u> තී මෙ නර මහල්ලාට අඹු වූයෙ?" (*බුත්සරණ*, 1953: 336).

මෙම වාක්‍ය රටාව වර්තමානයේ අභාවිත ය. එහෙත් භාෂණ සිංහලයේ 'වේද' යන්නට විකල්ප වශයෙන් වර්තමානයේ 'නේද?' යන්න භාවිත වේ.

උදා:
I. "මං කිව්ව නිසා <u>නේ ද</u> අද ඔයා මේ රැස්වීමට ආවෙ?"
II. "පොඩි කාලෙ ඉඳල මහන්සිවෙලා ඉගෙන ගත්ත නිසා <u>නේද</u> සුනිල් අද හොඳ රස්සාවක් කරන්නෙ?"

*බුත්සරණේ* ඇතැම් ප්‍රශ්නාර්ථ වාක්‍යවල ප්‍රශ්නාර්ථවාචී පදය වාක්‍ය මධ්‍යයේ යෙදී තිබේ.

උදා:
I. "... මෙ දෙව සමාගමයෙහි <u>කිම් ද</u> තා බලන්නෙ?" (*බුත්සරණ*, 1953: 142).

එහෙත් මෙම ව්‍යවහාරය මේ වන විට අභාවිත ව ඇති අතර වර්තමානයේ ප්‍රශ්නාර්ථවාචී පදය යෙදෙන්නේ වාක්‍ය අගට ය.

උදා:
II. "ඔබ මෙහි බලන්නේ <u>කුමක්ද?</u>"

බුත්සරණේ අන්තර්ගත වාක්‍ය විචාරාත්මක ලක්ෂණ මෙසේ විමර්ශනය කළ හැකි ය.

*බුත්සරණින්* හෙළිවන දොළොස්වන, දහතුන්වන සියවස්හි වාක්‍ය විචාරාත්මක ලක්ෂණ මෙසේ විමර්ශනය කළ හැකි ය.

## නිගමනය

යථෝක්ත විමර්ශනයට අනුව පැහැදිලි වන්නේ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාක්‍යාංශය අග ධාතු ප්‍රකෘතියට පර ව '-ත්' ප්‍රත්‍යය යෙදී, එය ද්විත්ව වශයෙන් යෙදීම, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාක්‍යාංශ සඳහා *බුත්සරණෙහි* 'කල්හි' යන්න ද යෙදීම, වර්තමානයට සමීප වාක්‍ය රටා ද *බුත්සරණේ* කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාක්‍යාංශ අතර දක්නට ලැබීම, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සඳහා අමාවතුරේ මෙන්ම බුත්සරණේ ද 'නම්' නිපාතය 'ඉදින්' නිපාතය සහිත ව මෙන් ම රහිත ව ද යෙදීම, 'කෙසේද යත්' යන්න සහ එහි විකල්ප රූප ද අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා අර්ථයෙහි යෙදීම, නූතනයේ මෙන් *බුත්සරණේ* ද කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව සකසා ගැනීම සඳහා '-හොත්' ප්‍රත්‍යය යෙදීම, සමීකරණ වාක්‍යවල දී සමීකරණය දැක්වීමේ දී අවධාරණාර්ථයේ 'නම්' නිපාතය යෙදීම, කෘදන්ත රූප, පූර්ව ක්‍රියා, ප්‍රච්ඡන්න ක්‍රියා, නිපාත පුනරුක්තිය, සුදුසු, ලදින්, කෙනෙකු ව, දවස් ද, බව යැ, ආදී පද පුනරුක්තිය, නාම පදයට අනතුරු ව කෘදන්ත නාමයක් යෙදී සැකසුණු නාම විශේෂණ වාක්‍යාංශ සහිත වාක්‍ය අන්තර්ගත වීම, යමෙක් සිතූ දෙයක් පිළිබඳ ව දැක්වීමේ දී කෙටි වාක්‍යාංශයකින් සිතූ බව දක්වා ඉන් අනතුරුව සිතූ දෙය දැක්වීමේ වාක්‍ය රටාව දක්නට ලැබීම, තමන් නිශ්චිත ව දන්නා දෙයක් පිළිබඳ ව අවධාරණාර්ථයෙන් ඇසීම සඳහා භාවිත වූ 'වේද' යන්න සහිත වාක්‍ය රටාව හා ඇතැම් ප්‍රශ්නාර්ථ වාක්‍යවල ප්‍රශ්නාර්ථවාචී පදය වාක්‍ය මධ්‍යයේ යෙදීම ආදී වාක්‍ය විචාරාත්මක ලක්ෂණ *බුත්සරණෙහි* අන්තර්ගත ව ඇති බව යි.

*බුත්සරණෙහි* සරල හා සංකීර්ණ වාක්‍ය රටා විද්‍යමාන වේ. මෙහි *අමාවතුරට* සමාන වාක්‍ය රටා මෙන් ම *අමාවතුරෙහි* දක්නට නො ලැබෙන, නූතන ව්‍යවහාරයට සමාන වාක්‍ය රටා ද අන්තර්ගත වේ. එයින් අනාවරණය වන්නේ *අමාවතුර* රචනා වූ අවධියට සමීප අවධියක *අමාවතුරට* අනතුරු ව *බුත්සරණ* රචනා වී ඇති බව යි.

## පරිශීලිත මූලාශ්‍රය


අභයසිංහ, ඒ. ඒ. (1953). "සිංහල ගද්‍යය සහ බුත්සරණ", **උවසර**. 132, 133.01.

අභයසිංහ, ඒ. ඒ. (1990). **සිංහල වාක්‍ය විභාගය - සරල වාක්‍යය**. කර්තෘ ප්‍රකාශනයකි.

කරුණාරත්න, ඩබ්ලිව්. (1974). **පොළොන්නරුපුර සාහිත්‍යය.** කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

කුලසූරිය, ආනන්ද. (1999). **සිංහල සාහිත්‍ය 1.** බොරලැස්ගමුව: සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ.

කෝපරහේවා, සඳගෝමි. (2020). **ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්වීමේ විධික්‍රම.** කොළඹ: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.)සමාගම.

ලඞ්කානන්ද හිමි, ලබුගම. (1953). (සංස්.). **බුත්සරණ.** කොළඹ, සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Wijemanne, Piyaseeli. (1984). **Amavatura.** Colombo: Lake House Printers and Publishers Ltd.



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පහළොස්වන කලාපය 2025 දෙසැම්බර්
පිටු 39-59
ISSN 1800-1459 eISSN 2386-2041
© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයෙහි වීදි මට්ටමේ නිලබලකරුවන්ගේ පරිපාලන ශක්‍යතාව හා අභිමතානුසාරී බලය : බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

# (Administrative Capacity and Discretionary Power of Street-Level Bureaucrats in Integrated Rural Development: A Case Study of the Buttala Divisional Secretariat)

ජේ. එම්. මධුෂානි[1] සහ ජී. සී. එල්. පතිරණ [2]

සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
**madushanijm771@gmail.com**
**pathiranaakash@gmail.com**

## Abstract

Street-level bureaucrats play a central role in implementing Integrated Rural Development Projects (IRDPs), but their effectiveness is often constrained by limited administrative capacity and discretionary authority. This study examines how such constraints shape project outcomes, with reference to two IRDPs implemented in 2022 and 2024 in two Grama Niladhari Divisions under the Buttala Divisional Secretariat Division. Data was collected through semi-structured questionnaires, unstructured interviews, and case studies, supplemented by secondary sources such as books, research articles, reports, and websites. The sample consisted of 80 respondents. Quantitative data were analysed using Microsoft Excel, while qualitative data were examined through thematic analysis. Drawing on Michael Lipsky's Street-Level Bureaucracy theory, the study focused on four dimensions: accessibility of resources, institutional cooperation, community involvement, and the training and capacity of officers. Findings reveal that bureaucrats face persistent challenges, including limited access to resources, inadequate training, weak institutional collaboration, low levels of community participation, and insufficient public awareness. Moreover, while bottom-up policy implementation is often viewed as a democratic approach, the authority of higher-level officials continues to shape and restrict the autonomy of street-level bureaucrats. These findings affirm Lipsky's argument that street-level bureaucrats operate under systemic and political constraints that limit effective policy execution. The study recommends strengthening resource allocation, enhancing training, improving inter-institutional cooperation, and fostering greater community engagement, while emphasising the need for collaborative efforts from institutional, political, and community stakeholders to ensure the success of IRDPs.

**Keywords:** Administrative Capacity, Buttala Divisional Secretariat, Discretionary Power, Integrated Rural Development Projects, Street-Level Bureaucrats

## සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වීදි මට්ටමේ නිලධාරින් විශේෂ කාර්යභාරයක් ඉටු කරයි. නමුත්, පරිපාලන හැකියාව සහ අභිමතානුකූල තීරණ ගැනීමේ බලය සීමා වීමේ ප්‍රතිඵල ලෙස, ව්‍යාපෘති ප්‍රතිඵලය අඩාල කරන අභියෝග බොහොමයක් මතු වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ, එම සීමාවන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී කෙසේ බලපාන්නේ ද යන්න විග්‍රහ කිරීම යි. ඒ සඳහා 2022 සහ 2024 වර්ෂවල දී බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් දෙකක ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති දෙකක් මූලික කරගෙන පර්යේෂණය සිදු කරන ලදි. දත්ත රැස් කිරීමට අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි, ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයන ක්‍රම යොදා ගෙන ඇති අතර, ද්විතීයික දත්ත පොත්, පර්යේෂණ ලිපි, වාර්තා, පුවත්පත් සහ වෙබ් අඩවි ආදියෙන් රැස් කරන ලදි. නියැදි ප්‍රමාණය 80 දෙනෙකුගෙන් සමන්විත විය. ප්‍රමාණාත්මක දත්ත මයික්‍රොසොෆ්ට් එක්සෙල් මෘදුකාංගයෙන් ද, ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය ඔස්සේ ද විග්‍රහ කරන ලදි. මයිකල් ලිප්ස්කිගේ වීදි මට්ටමේ නිලධාරි න්‍යාය මූලික කරගෙන, සම්පත් ලබා ගැනීමේ හැකියාව, ආයතනික සහයෝගීතාව, ජනතාවගේ සහභාගීත්වය සහ නිලධාරින්ගේ පුහුණුව හා ධාරිතාව යන මාන ද්විපද තුළ විග්‍රහය සිදු කරන ලදි. අධ්‍යයනයෙන් හෙළිවූයේ, සම්පත් හිඟය, නිලධාරින්ගේ පුහුණුවේ හා කාර්ය සාධනයේ ගැටලු, ආයතන මට්ටමේ අවශ්‍ය සහයෝගය නොමැති වීම, ජනතාවගේ සහභාගීත්වය අඩු වීම සහ දැනුවත්භාවය පමාවීම යන අභියෝග වීදි මට්ටමේ නිලධාරින්ට බලපාන බව යි. කෙසේ වෙතත්, පහළ සිට ඉහළට ප්‍රතිපත්ති සම්ප්‍රාදන ආකෘතිය ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයක් ලෙස පිළිගත හැකි

වුවත්, ඉහළ මට්ටමේ නිලධාරීන්ගේ බලය හා නියමයන් නිසා බිම් මට්ටමේ නිලධාරීන්ගේ අභිමතානුසාරී බලය සීමාවට ලක්ව ඇත. එමගින් මයිකල් ලිප්ස්කි විසින් විස්තර කරන ලද න්‍යායමය සංකීර්ණතා සජීවී ව පිළිබිඹු කරන බව තහවුරු විය. මෙම අභියෝග මඟහරවා ගැනීම සඳහා සම්පත් ලබා ගැනීම ශක්තිමත් කිරීම, නිලධාරි පුහුණුව හා කාර්ය සාධනය වර්ධනය කිරීම, ආයතනික සහයෝගීතාව වැඩිදියුණු කිරීම සහ ජනතාවගේ සහභාගීත්වය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය ය. දේශපාලන බලධාරීන් සහ ප්‍රජාව සමගාමී ව කටයුතු කිරීම, ව්‍යාපෘති සාර්ථකත්වයට අවශ්‍ය ප්‍රාග්ධනකාරී කොන්දේසියකි.

**කේන්ද්‍රීය වචන:** පරිපාලන ශක්‍යතාව, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, අභිමතානුසාරී බලය, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති, වීදි මට්ටමේ නිලබලකරුවන්

## හැඳින්වීම

ග්‍රාමීය සංවර්ධනය යනු, විහිදී විසිරුණු හා සම්පත් අවම තත්ත්වයන් තුළ ජීවත්වන ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සුභසිද්ධිය, සමාජ සමානත්වය, හා ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය උසස් කිරීමට නියුක්ත වූ සංකීර්ණ ක්‍රියාවලියක් ලෙස හැඳින්විය හැකි ය. ග්‍රාමීය සංවර්ධනය වූ කලී ආර්ථික අරමුණු පමණක් නොව, සමාජ-සංස්කෘතික, පාරිසරික හා ආගමික ගැඹුරු මට්ටම් ද ඇතුළත් කරන, බහුමාන සංවර්ධන ක්‍රියාවලියකි. ග්‍රාමීය ජනතාවගේ යථාර්ථ ගැටලු ආදායම් අස්ථාවරතාව, කෘෂිකර්මාන්තය මත පදනම් වූ උපජීවිකාව, මූලික යටිතල පහසුකම් පිළිබඳ හිඟය, සහ සමාජ සේවා ප්‍රවේශය සීමිත වීම අවබෝධ කරගැනීම ග්‍රාමීය සංවර්ධන කටයුතු සංවිධානයේ පදනමක් වී තිබේ.

1970 දශකයේ සිට ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ලෝක ප්‍රවණතා තුළ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සංකල්පය (**Integrated Rural Development - IRD**) විශේෂ ප්‍රාග්ධර්මයක් ගත් අතර, එය ආංශික මැදිහත්වීම් පමණක් ග්‍රාමීය දුප්පතුන්ගේ බහුමාන ගැටලු විසඳීමට නො හැකි බව පිළිගත් ප්‍රතිපත්ති සම්පාදකයින් හා සංවර්ධන වෘත්තිකයන්ගේ අවබෝධයෙන් උද්භවය ලැබීය. මේ අනුව, ග්‍රාමීය කෘෂිකර්මාන්තය, රැකියා නිර්මාණය, යටිතල පහසුකම්, සෞඛ්‍යය, අධ්‍යාපනය, හා සමාජ සේවා ආදී ක්ෂේත්‍ර අතර සම්බන්ධීකරණය මගින් දුප්පත් ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය සමගාමී ව උසස් කිරීමට කටයුතු කිරීම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයේ මූලික අරමුණ වී තිබේ. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයේ මූලික දෘෂ්ටිකෝණය වන්නේ, කෘෂිකර්මය, රැකියා නිර්මාණය, යටිතල පහසුකම්, සෞඛ්‍ය, අධ්‍යාපනය, හා සමාජ සේවා ආදී ක්ෂේත්‍ර අතර ස්ථායි සහ සම්බන්ධීකරණාත්මක මැදිහත්වීම් මඟින් දුප්පත් ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය සම්පූර්ණ ආකාරයෙන් වැඩි දියුණු කිරීම යි (**Hulme & Shepherd, 2003; FAO, 1978**). මෙහි දී, එක් ක්ෂේත්‍රයක් තුළ නවීන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවට, සමාජ-ආර්ථික අවශ්‍යතා අතර සම්බන්ධතාව සලකා බැලීම වැදගත් වේ. උදාහරණයක් ලෙස, කෘෂිකර්ම කාර්මිකත්වය වැඩිදියුණු කිරීම සඳහා නව යටිතල පහසුකම් හා පුහුණු වැඩසටහන් සමඟ සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් එක් කළ යුතු ය (**Singh, 1986**). කෙසේ වෙතත්, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම බොහෝ විට අභියෝගාත්මක ය. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ ව සිදු කරන ලද බොහෝ පර්යේෂණවලට අනුරූප ව, ව්‍යාපෘති සාර්ථකවීම ප්‍රධාන කරුණු කීපයක් මත තීරණය වන ආකාරය පෙන්වා දී තිබේ:

බහු-ආංශික සම්බන්ධීකරණය - ක්ෂේත්‍ර අතර සබැඳි වැඩසටහන් සහ කාර්යමණ්ඩල සම්පාදනය (**WHO, 2019/2025, National Nutrition Secretariat, 2018–2025**).

ප්‍රජා සහභාගීත්වය - නිලධාරීන් සහ ප්‍රාදේශීය ජනතාව අතර සෘජු සම්බන්ධතා මගින් අවශ්‍යතා හඳුනා ගැනීම (**Ministry of Local Government, 2009,Making, 2019, Fernando, 2024**).

පරිපාලන සහ සංවිධානාත්මක හැකියාවන් - සම්පත් කළමනාකරණය, ව්‍යාපෘති සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ දක්ෂතා (**UNDP, 2009, PMI, 2021,SLIDA, 2025**).

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම මඟින් ප්‍රාදේශීය ජනතාවගේ සමාජ-ආර්ථික හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වූ මූලික මාර්ගෝපදේශ ලබා දෙන බව පර්යේෂණ තොරතුරු පෙන්වයි (**World Bank, 1980; Chambers, 1997**). ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කර ඇත්තේ පාලනයේ ඉහළ මට්ටම්වල මත නමුත් ඒවා රඳා පවතින්නේ වීදි මට්ටමේ නිලධාරීන්ගේ ප්‍රයත්නයන් මත ක්‍රියාත්මක කිරීමට යි. වීදි මට්ටමේ නිලධාරීන් (**Street-Level Bureaucrats**) යනු, සෘජුව ම මහජනතාව සමඟ අන්තර්ක්‍රියා කරන අතර, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී නීතිමය බලය පමණක් නොව, අභිමතානුසාරී බලය බලය (**Discretionary Power**) ද යොදාගන්නා රාජ්‍ය සේවකයෝ වෙති (**Lipsky, 1980**). මයිකල් ලිප්ස්කි විසින් 1970 දශකයේ දී පුරෝගාමී ව ගොඩනැගූ මෙම සංකල්පය තුළ ගුරුවරුන්, පොලිස් නිලධාරීන්, සමාජ සේවකයින්, ග්‍රාම නිලධාරීන් වැනි කණ්ඩායම් ඇතුළත් වන අතර, ඔවුහු සෘජුව ම ප්‍රජාවන් සමඟ සම්බන්ධ වී ප්‍රතිපත්ති ජීවමාන කරන "නීතිවල නියෝජිත ක්‍රියාකාරකම්" ඉටු කරන මට්ටම නියෝජනය කරති.

ග්‍රාමීය සංවර්ධන පසුබිම තුළ, වීදි මට්ටමේ නිලධාරීන් තීරණාත්මක භූමිකාවක් ඉටු කරන අතර, ඔවුන්ගේ කාර්යභාරය ප්‍රතිපත්ති නාමිකව සැලසුම් කරන ලද ආකෘතිය සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ යථාර්ථ අවශ්‍යතා අතර සම්බන්ධීකරණය කරනු ලබයි (**Evans, 1996; Hupe & Hill, 2007**). මෙහි දී, ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරයන්ට අයත් වන්නේ:

ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ සෘජු සම්බන්ධතාව ගොඩනගා ගැනීම,

සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීම සහ ප්‍රජා සහභාගීත්වය දිරිමත් කිරීම,

ප්‍රජා අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම,


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දේශීය අවශ්‍යතා සමග ගැළපෙන ව්‍යාපෘති සැලසුම් සඳහා තොරතුරු හා සහාය සැපයීම,

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගික සම්බන්ධීකරණය ඉටු කිරීම (**Maynard-Moody & Musheno, 2003**).

කෙසේ වෙතත්, මෙම විශාල කාර්යභාරයන් ඉටු කිරීමේදී වීදි මට්ටමේ නිලධාරීන්ට බොහෝ අභියෝග මුහුණ පාන්නට සිදු වේ. සම්පත් හිඟය, ආයතනීය අකාර්යක්ෂමතා, දේශපාලන බලපෑම්, සහ පුහුණු දක්ෂතා හිඟය වැනි ගැටලු ඔවුන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක් කරන අයුරු න්‍යායමය සහ ප්‍රායෝගික සාකච්ඡා මගින් විශේෂයෙන් අවධාරණය කර ඇත (**Bardach & Kagan, 1982; Grindle, 1997**).

ඒ අනුව, ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථකත්වය අවසානයේ රඳා පවතින්නේ, වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාවන් හා ඔවුන්ගේ අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කරන ආකාරය මත බව පර්යේෂණ දත්ත පෙන්වයි (**Hupe, 2014**). මෙම පර්යේෂණයෙහි අරමුණ වන්නේ, ඔවුන්ගේ භූමිකාව හා සීමා සම්පූර්ණයෙන් විග්‍රහ කරමින්, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී මතුවන ගැටලු සවිස්තරාත්මක ව අවබෝධ කර ගැනීම යි. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලධාරීන් සීමිත සම්පත්, නිලධාරිවාදී අකාර්යක්ෂමතා, දේශපාලන බලපෑම් සහ ප්‍රමාණවත් පුහුණුවක් නොමැතිකම වැනි ගැටලු රාශියකට මුහුණ දෙන අතර එහි දී වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාවන් හා අභිමතානුසාරී බලය සීමාවට ලක් වී තිබේ ද? ඒ සඳහා බලපා ඇති ගැටලු සහ අභියෝග කවරේ ද? යන පර්යේෂණ ගැටලුව පිළිබඳ මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් අවධානය යොමු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ මෙවැනි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලධාරීන් විශාල කාර්යභාර්යක් සිදු කරන අතර ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වීදි මට්ටමේ නිලධාරීන් මුහුණ දෙන ගැටලු වෙත අවධානය යොමු කිරීමෙන් ග්‍රාමීය ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාවට බලපාන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට, සම්පත් වෙන් කිරීම සහ ප්‍රාදේශීය පාලන ව්‍යුහයන්ගේ හිඩැස් පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දේ. වීදි මට්ටමේ නිලධාරීන් මුහුණ දෙන ගැටලු අවබෝධ කර ගැනීමෙන් ප්‍රතිපත්ති සම්පාදකයන්ට, සංවර්ධන වෘත්තිකයන්ට සහ රාජ්‍ය ආයතනවල පවතින උපාය මාර්ග පිරිපහදු කිරීමට සහ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මෙන් ම ව්‍යාපෘතිවල ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට ඉතා වැදගත් වේ. නමුත් ශ්‍රී ලංකාව තුළ මේ සම්බන්ධ ව පර්යේෂණයන් සිදුව ඇත්තේ ඉතා අල්ප වශයෙන් වන අතර සිදු කර ඇති පර්යේෂණවල වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරීබලය සීමාවට ලක් වීම සඳහා බලපා ඇති ගැටලු සහ අභියෝග පිළිබඳ අවධානය යොමු කර නො තිබුණි. ඒ අනුව බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරාගෙන එහි ක්‍රියාත්මක වූ අරාගල කෘෂිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සහ ඔක්කම්පිටිය පාර, 3 වන පටුමඟ මාර්ග සංවර්ධන ව්‍යාපෘති පාදක කර ගනිමින් එම ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක් වීම සඳහා බලපා ඇති ගැටලු සහ අභියෝග මොනවාද යන්න මෙම පර්යේෂණය හරහා පුළුල් ව විශ්ලේෂණය කරන ලදි.

## සාහිත්‍ය විමර්ශනය

මයිකල් ලිප්ස්කි (**Michael Lipsky**) (**1980**) විසින් වීදි මට්ටමේ නිලබල ක්‍රමය : රාජ්‍ය සේවාවන්හි පුද්ගලයාගේ උභතෝකෝටිකය (**Street-Level Bureaucracy: Dilemmas of the Individual in Public Services**) ග්‍රන්ථය, රාජ්‍ය සේවාවන් ක්‍රියාත්මක වීමේ දෛනික පළපුරුද්ද සහ පරිපාලනයෙහි තීරණ නිර්මාණය (**Administrative Decision-Making**) පිළිබඳ විශ්ලේෂණයට ලක් කොට ඇත. ලිප්ස්කිගේ මූලික අදහස වන්නේ, " වීදි මට්ටමේ නිලබලකරුවන්" (**Street-Level Bureaucrats-SLBs**) සෘජුව ම ජනතාවට සේවා සපයන රාජ්‍ය සේවකයන් වන අතර ඔවුන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන ආකාරය නියෝජනය කරනු ලැබේ. ඔවුන්ගේ අභිමතානුසාරී බලය (**Administrative Discretion**) මගින් ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන ආකාරය සහ සේවා ගුණාත්මකභාව තීරණය කරනු ලැබේ. ලිප්ස්කි පෙන්වා දෙන්නේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී තමන්ට ලබා දී ඇති සීමාසහිත සම්පත් සහ අධික වැඩ රාජකාරි හේතුවෙන් නීතිමය රාමුවට අනුව ක්‍රියා කිරීම අභියෝගයට ලක්වී ඇති බව යි. එමෙන්ම ඉහළ නිලධාරී මට්ටමින් පැමිණෙන්නා වූ පෙළඹවීම් සහ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ ඉල්ලීම් අතර සිදුවන්නා වූ අනුදෝලනයකට ද වීදි මට්ටමේ නිලබලකරුවන්ට මුහුණ පෑමට සිදුව තිබේ. එමෙන්ම වීදි මට්ටමේ නිලධාරීන් සතු පරිපාලනයෙහි වගවීම ද අවිධිමත් පරිපාලන සම්මතයන් සමග අභියෝගයට ලක්වීමට ද සිදුව තිබේ.

මීරසාහිබු ඒ. සහ තරහදීන් එෆ්. (**Meerasahibu A. & Thaharadeen F.**) විසින් 2015 දී සිදු කර ඇති අධ්‍යයනයක් වන ග්‍රාමීය සංවර්ධනය ගොඩනැගීමේ දී නිලබල ක්‍රමයෙහි කාර්යභාරය : ශ්‍රී ලංකාවේ අඩ්ඩාලයිචෙනල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇසුරින් (**The Role of Bureaucracy in Building Rural Development: A Study of Addalaichenal Divisional Secretariat, Sri Lanka**) යන පර්යේෂණය මගින් ග්‍රාමීය සංවර්ධනය විශේෂයෙන් ම අඩ්ඩාලිචේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත ව නිලධාරීවාදයේ කාර්යභාරය අධ්‍යයනයට ලක් කර ඇත. මෙහි දී ග්‍රාමීය සංවර්ධනයේ දී වීදි මට්ටමේ නිලධාරීන් විශාල කාර්යභාර්යක් සිදු කරන බව පෙන්වා දෙන ලදි. ග්‍රාමීය සංවර්ධනයේ දී වීදි මට්ටමේ නිලධාරීන් පාර්ශ්වකරුවන්ගේ සහයෝගය නො තිබීම, දේශගුණික බාධක, ප්‍රජා සහභාගීත්වය අවම වීම වැනි ගැටලුවලට මුහුණ දෙන බව මෙම පර්යේෂණය මගින් අනාවරණය කර ගෙන තිබේ. අධ්‍යයනයේ ප්‍රධාන දුර්වලතාවක් වන්නේ රජයේ මූලාශ්‍ර මත පමණක් පදනම් වීමත් ප්‍රතිලාභීන්ගේ හඬ නියෝජනය


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නො වීමත් ය (**Meerasahibu & Thaharadeen** , 2015).

හේරත් පී. (**Herath, P.**) විසින් 2017 දී සිදු කර ඇති අධ්‍යයනයක් වන රාජ්‍ය සේවාවන් සැපයීම සහ ශ්‍රී ලංකාවේ පරිපාලනයෙහි අභිමතානුසාරී බලය බලය (**Public Service Delivery and Bureaucratic Discretion in Sri Lanka**) යන පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සැපයීමේ දී නිලධාරිවාදයේ අභිමතය අධ්‍යයනයට ලක් කර ඇත. ගුරුවරුන්, සෞඛ්‍ය නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් වැනි ඉදිරි පෙළ රාජ්‍ය නිලධාරීන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සහ සේවා ප්‍රතිඵලවලට සෘජුව ම බලපෑම් කිරීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන බව අධ්‍යයනයෙන් ඉස්මතු කරයි. සම්පත් සීමාවන්, අධික වැඩ බර සහ ආයතනික අභියෝග හේතුවෙන්, මෙම නිලධාරීන් ප්‍රතිපත්ති ප්‍රායෝගික යථාර්ථයන්ට අනුවර්තනය කිරීම සඳහා සැලකිය යුතු අභිමත බලයක් ක්‍රියාත්මක කරයි. මෙම අභිමතය ධනාත්මක සේවා ප්‍රතිඵලවලට මඟ පාදන බව සහතික කිරීම සඳහා ඵලදායී අධීක්ෂණය, පුහුණුව සහ වගවීමේ යාන්ත්‍රණයන් අත්‍යවශ්‍ය බව හේරත් අවධාරණය කරයි. සමස්තයක් වශයෙන්, මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ පරිපාලන සැකසුම තුළ ලිප්ස්කිගේ (1980) වීදි මට්ටමේ නිලධාරිවාදී න්‍යාය සන්දර්භගත කොට තිබේ.

මයුරි කුලරත්න (**Mayuri Kularathne**) විසින් 2023 දී සිදු කරන ලද සමාජ සුභසාධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වීදි මට්ටමේ නිලධාරීන්ගේ ආකල්පමය හැඩගැස්වීම (**Shaping the Disposition of Street- Level Bureaucrats in the Implementation of Social Welfare Policy**) යන අධ්‍යයනයේ අරමුණු වන්නේ සමාජ සුභසාධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වීදි මට්ටමේ නිලධාරීන්ගේ හැසිරීම හා ඔවුන්ගේ වෘත්තීය විනිශ්චය හැඩගැස්වීමේ ක්‍රමවේදයන් විමර්ශනය කිරීම යි. මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කර ඇත්තේ වීදි මට්ටමේ නිලධාරීන්ගේ ආකල්ප ගොඩනඟන්නේ කෙසේ ද? සහ එය සිදු වන්නේ කුමන තත්ත්වයක් යටතේ ද? යන්න අධ්‍යයනය කිරීම කෙරෙහි ය. මෙම පර්යේෂණයේ ප්‍රතිඵලවලින් සමාජ සුභසාධන ප්‍රතිපත්තියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වීදි මට්ටමේ නිලධාරීන්ගේ ආකල්ප හා පුරවැසියන්ගේ ආකල්ප බලපාන බව පෙන්වා දී ඇත (**Mayuri Kularathne, 2023**).

පීටර් හියුප් සහ මයිකල් හිල් (**Peter Hupe & Michael Hill**) විසින් 2007 දී සිදු කරන අධ්‍යයනයක් වන වීදි මට්ටමේ නිලබල ක්‍රමය සහ මහජන වගවීම (**Street Level Bureaucracy and Public Accountability**) යන පර්යේෂණය මගින් වීදි මට්ටමේ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන අභිමතය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී බලපාන ආකාරය පරීක්ෂා කරන ලදි. මෙම පර්යේෂණය මගින් සොයා ගෙන ඇත්තේ අභිමතය පරිදි නිලධාරීන්ට ප්‍රාදේශීය අවශ්‍යතාවලට ප්‍රතිපත්ති අනුවර්තනය වීමට ඉඩ දෙන අතර, එය නොගැළපීම් සහ විවිධ අනුග්‍රහයන් ඇති වීමට හේතු විය හැකි බව යි. ග්‍රාමීය ප්‍රදේශවල, අධීක්ෂණය නොමැතිකම බොහෝ විට මෙම ගැටලු උග්‍ර කරන අතර එය දුර්වල ප්‍රතිඵලවලට තුඩු දෙන බව පෙන්වා දේ (**Peter Hupe & Michael Hill , 2007**).

නිකොලස් පී. එන්ඩ්ලොවු සහ ටෙන්ඩායි එම්. එන්සුමා (**Nicholas P. Ndlovu & Tendai M. Nzuma**) විසින් 2024 දී සිදු කර ඇති පර්යේෂණයක් වන නැමීබියාවේ කෘෂි වන වගාව ක්‍රියාත්මක කිරීම : වීදි මට්ටමේ නිලධාරිවාදී දෘෂ්ටිකෝණය ඇසුරින් (**The Implementation of Agroforestry in Namibia: A Street – level Bureaucracy Perspective**) යන පර්යේෂණය මගින් කෘෂි වන වගා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සන්දර්භය තුළ වීදි මට්ටමේ නිලධාරීන් මුහුණ දෙන විශේෂිත අභියෝග පිළිබඳ විමර්ශනය කර ඇත. එහි දී නැමීබියාවේ කලාප පහක් පුරා කෘෂි වන වගා පිළිබඳ අධ්‍යයනය කරමින් සොයා ගෙන ඇත්තේ ආයතනික සැකසුම්, කෘෂි වගා සාර්ථකත්වයට බලපාන අතර එහි දී වීදි මට්ටමේ නිලධාරීන් මුහුණ දෙන අභියෝග ලෙස තාක්ෂණික බාධක ඇති බව පෙන්වා දී තිබේ (**Nicholas P. Ndlovu & Tendai M. Nzuma, 2024**).

කෙසේ නමුත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය හා වීදි මට්ටමේ නිලධරය සම්බන්ධයෙන් විවිධ දේශීය හා විදේශීය පර්යේෂණ සිදු කර ඇතත්, එමඟින් ප්‍රජාව සවිබල ගැන්වීම වැනි ග්‍රාමීය සංවර්ධනයේ විවිධ පැතිකඩ ගවේෂණය කරන අතර ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලබලකරුවන් මුහුණ දෙන අභියෝග සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ අවම ප්‍රමාණයකි. එහි දී දේශීය වශයෙන් සිදු කර ඇති පර්යේෂණවලින් බොහොමයක් ආයතනික ව්‍යුහයන්ගේ ආකාර්යක්ෂමතාව, මූල්‍ය බාධාවන් වැනි සාර්ව මට්ටමේ ගැටලු කෙරෙහි අවධානය යොමු කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. වීදි මට්ටමේ නිලධාරීන් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී නිලධාරීන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක්වීම වැනි අනෙකුත් ගැටලු පිළිබඳ දේශීය ආනුභාවික අධ්‍යයනයන් දක්නට ලැබෙන්නේ විරල වශයෙන් නිසාවෙන් මේ පිළිබඳ ඉලක්ක කොට ගෙන පර්යේෂණය සිදු කර තිබේ. එමෙන්ම ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලධාරීන් මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් මෙතෙක් සිදු කොට ඇති විවිධ අධ්‍යයන සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, සිද්ධි අධ්‍යයනය වැනි ක්‍රමවේද භාවිත කොට ඇති අතර ඇතැම් අධ්‍යයන එක් විධික්‍රමයකට පමණක් සීමා වී තිබේ. කෙසේ නමුත් මෙම අධ්‍යයනය මිශ්‍ර ක්‍රමවේදය මත පදනම් ව සිදු කරනු ලබයි. මේ සඳහා ගුණාත්මක දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සිද්ධි අධ්‍යයන ක්‍රමය උපකාරී කොට ගැනීම නිසාවෙන් අධ්‍යයන ක්‍රමවේදය විධිමත්භාවයෙන් සහ ක්‍රමානුකූලභාවයෙන් යුක්ත වනු ඇත.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණ ගැටලුව

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය යනුවෙන් හඳුන්වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල සමාජ, ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් උපායමාර්ගික ප්‍රවේශයකි. එහි ඉලක්කය වන්නේ ආර්ථික,සමාජ,පාරිසරික සහ ආයතනික වශයෙන් ඒකාබද්ධ කිරීම මගින් ග්‍රාමීය දරිද්‍රතාවයේ බහුමාන පැතිකඩ ආමන්ත්‍රණය කිරීම යි. වර්තමානය වන විට බිම් මට්ටමේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීමේ දී වීදි මට්ටමේ නිලධාරින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. නමුත් ඔවුන් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී විවිධ අභියෝගවලට මුහුණ දේ. මෙහි දී බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පාදක කර ගනිමින් සිදු කළ සංවර්ධන ව්‍යාපෘති දෙකක් ලෙස 2024 වර්ෂයේ දී ක්‍රියාවට නැංවු අරාගල කෘෂිමාර්ගය යන සංවර්ධන ව්‍යාපෘතිය හා 2022 වර්ෂයේ දී ක්‍රියාවට නැංවු ඔක්කම්පිටිය පාර, 3 වන පටුමඟ මාර්ග සංවර්ධන ව්‍යාපෘති වීදි මට්ටමේ නිලධාරින් විසින් ක්‍රියාවට නංවා ඇති අතර එහි දී වීදි මට්ටමේ නිලධාරින්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක් වී තිබේ ද? ඒ සඳහා බලපා ඇති ගැටලු හා අභියෝග කවරේ ද? යන්න විමර්ශනය කිරීම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව බවට පත් වී ඇත.

## පර්යේෂණ අරමුණ

පර්යේෂණයේ ප්‍රධානත ම අරමුණ වුයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අරාගල කෘෂිමාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය සහ ඔක්කම්පිටිය පාර, 3 වන පටුමඟ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් එම ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලධාරින්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක් වීම සඳහා බලපා ඇති ගැටලු සහ අභියෝග හඳුනා ගැනීම යි.

මෙම ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අනු අරමුණු කිහිපයක් ද පර්යේෂණයෙහි දී අවධානය යොමු කරන ලදි. එනම් සම්පත් ලබා ගැනීමේ හැකියාව වීදි මට්ටමේ නිලධාරීන්ගේ අභිමතානුසාරීබලය සීමාවට ලක්වීම සඳහා බලපා ඇති ආකාරය පරීක්ෂා කිරීම, නිලධාරින්ගේ පරිපාලන හැකියාව සහ අභිමතානුසාරී බලය සීමාවට ලක්වීම සඳහා ආයතනික සහයෝගීතාව සහ ඒකාග්‍රතාව බලපෑ ආකාරය විමර්ශනය කිරීම සහ ජනතා සහභාගීත්වය නිලධාරින්ගේ පරිපාලන හැකියාව වර්ධනය කිරීම සඳහා හේතු වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම යි.

## පර්යේෂණයේ වැදගත්කම

මෙම අධ්‍යයනය මගින් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාවය හා එම ක්‍රියාවන්ට ඍජුව ම බලපාන වීදි මට්ටමේ රාජ්‍ය නිලධාරින්ගේ (Street-Level Bureaucrats) භූමිකාව ගැඹුරු ලෙස විමර්ශනය කරයි. ඔවුන්ගේ පරිපාලන හැකියාවන්, තීරණ ගැනීමේ ස්වාධීනතාව සහ අභිමතානුසාරී ප්‍රවණතා විශ්ලේෂණය කිරීමෙන්, සංවර්ධන ප්‍රතිඵල හා නිලධාරින්ගේ කාර්ය සාධන අතර සම්බන්ධය පැහැදිලි කර ගැනීමට අධ්‍යයනය මගින් දරනු ලබන්නා වූ ප්‍රයත්නය රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා අතිශයින්ම වැදගත් වන බව සඳහන් කළ යුතු ය. වීදි මට්ටමේ නිලබලකරුවා වූ කලී සෘජුව ම ජනතාව සමග කටයුතු කරන ඔවුන්ගේ අවශ්‍යතාවයන්හි දී සංවේදී වන රාජ්‍ය ප්‍රතිපත්තීන්හි අර්ථය සැබෑ ලෙස සමාජය මත සාධාරණීකරණය කරන නිලධාරීහු වෙති. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ජනතාව අතර වඩාත් ඵලදායී සහ ප්‍රතිචාරාත්මක සාකච්ඡාවක අවශ්‍යතාවය මතු කෙරෙන වත්මන් සමාජ සන්ධර්භය තුළ මෙම අධ්‍යයනයෙහි වැදගත්කම ප්‍රබල ලෙස මතු කළ යුතු ව තිබේ. අධ්‍යාපනික පරිසරයකින් බලන විට, ශ්‍රී ලංකාවේ විකේන්ද්‍රණය වූ පරිපාලන පද්ධතිය තුළ සූක්ෂ්ම මට්ටමේ රාජ්‍ය නිලධාරින්ගේ භූමිකාව අධ්‍යයනය කිරීමේ නව දෘෂ්ටිකෝණයක අවශ්‍යතාව අධ්‍යයනය මගින් මතු කෙරෙන ප්‍රධාන තර්කනයකි. එය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී මනෝභාව, අභිලාෂා හා දක්ෂතා වැනි මනුෂ්‍යීය සාධකයන්ගේ වැදගත්කම විශේෂයෙන් අවධාරණය කරයි. මේ හරහා, නිලධාරින්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම, ආයතනික ශක්තිමත්භාවය ගොඩනැගීම, සහ ප්‍රතිපත්ති සංශෝධන සඳහා අවශ්‍ය විද්‍යාත්මක තොරතුරු ලබා දිය හැක. පරිපූර්ණ ප්‍රවේශයකින් විශ්ලේෂණය කරන විට, මෙම ගවේෂණය පරිපාලන කාර්යක්ෂමතාව හා අභිමතානුසාරී බලය ඒකාබද්ධව ක්‍රියාත්මක වීමෙන්, ග්‍රාමීය සංවර්ධනයේ ස්ථායීත්වයට කෙරෙන දායකත්වය විමර්ශනය කරනු ලැබේ. එමඟින් ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම අතර පවතින පරතරය පුරවා ගැනීමට දායක වීමත් සමඟ, ග්‍රාමීය සංවර්ධන හා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රවල ගවේෂකයන්, ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, සහ ප්‍රායෝගික ක්ෂේත්‍රයේ විශේෂඥයන් සඳහා ද වැදගත් දායකත්වයක් ලබා දෙන බව අවධාරණය කළ යුතු ය.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය තුළ දත්ත රැස්කිරීමේ දී ප්‍රාථමික සහ ද්විතීයික ක්‍රමවේදය මත පදනම් විය. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් මෙයට අනුබද්ධ වන අභ්‍යාන්තරික හා බාහිර පාර්ශවයන් මගින් තොරතුරු ලබා ගැනීම සිදු විය. ප්‍රධාන ලෙස ම, සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය, ප්‍රශ්නාවලි ක්‍රමවේදය හා සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරමින් ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක දත්ත යොදා ගනිමින් අදියර 03ක් යටතේ පර්යේෂණය සිදු කරන ලදි. පළමු අදියරේ දී සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිත කරමින් අධ්‍යයන ප්‍රදේශයට අදාළ ව ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති දෙකක් තෝරා ගනිමින් අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා එම ව්‍යාපෘතිවලට සම්බන්ධ නිලධාරීන් 20 දෙනෙකු තෝරා ගනිමින් පර්යේෂණ සිදු කිරීම, දෙවන අදියරේ දී සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරගනිමින් තෝරාගත් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලැබු පුද්ගලයන් 10 දෙනෙකු පදනම් කරගනිමින් සිද්ධි අධ්‍යයනය සිදු කිරීම, තෙවන අදියර තුළ දී බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ව ග්‍රාම නිලධාරි වසම් දෙකෙන්


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

එක් ග්‍රාම නිලධාරි වසමකින් පුද්ගලයන් 25ක් බැගින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙන් පුද්ගලයන් 50ක් පදනම් කරගනිමින් අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි ඉදිරිපත් කරමින් තොරතුරු සපයා ගනිමින් පර්යේෂණය ක්‍රියාවට නැංවිය. ඒ අනුව අධ්‍යයනයෙහි සමස්ත නියැදිය 80කි. ද්විතීයික දත්ත රැස් කිරීම සිදුකරනු ලද්දේ පුවත්පත්, සඟරා, අන්තර්ජාලය, ග්‍රන්ථ, පර්යේෂණ ලිපි ඇතුළු අනෙකුත් වාර්තා මඟිනි. රැස් කළ ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය (Thematic Analysis ) යොදාගනිමින් විශ්ලේෂණය සිදු කළ අතර, ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා මයික්‍රොසොෆ්ට් එක්සෙල් මෘදුකාංගය භාවිත කරන ලදි.


## ප්‍රතිඵල සහ සාකච්ඡාව

මෙම අධ්‍යයනය ඇසුරින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක්වීම සඳහා බලපා ඇති අභියෝග රැසක් අනාවරණය කරගනු ලැබීය. එම අභියෝග වන්නේ සම්පත් ලබා ගැනීමේ අභියෝගය, ආයතනික සහයෝගීතාව තුළ ඇතිවන අභියෝග, ප්‍රජා සහභාගීත්වය අවම වීම සම්බන්ධ ව ඇතිවන අභියෝගයන් ය. මෙම අභියෝග පිළිබඳ පහත පරිදි විශ්ලේෂණය කර ඉදිරිපත් කර ඇත.

## සම්පත් ලබා ගැනීමේ හැකියාව සීමාවීම

සම්පත් ලබා ගැනීමේ හැකියාව ප්‍රධාන කොටස් පහක් යටතේ සාකච්ඡා කෙරේ. එනම් මානව සම්පත්, භෞතික සම්පත්, මූල්‍ය සම්පත්, නිලධාරින්ගේ පුහුණුව, නිලධාරින්ගේ කාර්ය සාධනය සම්බන්ධ ව පැන නඟින අභියෝගයන් පිළිබඳ ව ය. ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වැදගත් අංගයක් ලෙස මානව සම්පත් හඳුනාගත හැකි ය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන නිලධාරින්, සේවක මණ්ඩලය හා කම්කරුවන්, ප්‍රදේශයේ ජනතාව සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍ය මානව සම්පත් වේ. තෝරාගත් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සිදු කළ ප්‍රදේශයන්හි ජනතාව මේ පිළිබඳ යම් අවබෝධයක් පවතින බව ප්‍රශ්නාවලිය ඔස්සේ ඔවුන් දැක් වූ ප්‍රතිචාර මගින් පැහැදිලි වේ. එම ප්‍රතිචාර පහත පරිදි වේ.

ප්‍රස්තාර අංක 1: මානව සම්පතෙහි අභියෝග




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව "ඔබ ප්‍රදේශයට අයත් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ දී, ව්‍යාපෘතිභාර නිලධාරින් හා සේවකයින්ගේ සේවාව පිළිබඳ ඔබ තෘප්තිමත් වේ" යන කල්පිතයට 90%ක් ම සෘණාත්මක ප්‍රතිචාර දක්වා තිබේ. මෙම කල්පිතයට එකඟ වී ඇත්තේ 4%ක පුද්ගලයන් සංඛ්‍යාවකි. ඔක්කම්පිටිය පාර තුන්වන පටුමඟ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව ගත් විට ඒ සම්බන්ධ ව නිලධාරින්ගේ පුරප්පාඩු පවතින අතර ඒ අංශය තුළ සේවය කළ ඇත්තේ එක් ඉංජිනේරු නිලධාරියෙකු පමණි. එම නිලධාරිවරයා සමඟ පැවති සම්මුඛ සාකච්ඡාවේ දී ඔහු ඉදිරිපත් කළ අදහස පහත පරිදි වේ.

"අපේ කණ්ඩායමට නිලධාරින් වැඩි වුණා නම්, ඉදිකිරීම් කටයුතු වේගවත් කරන්න තිබුණා. ඒත් නිලධාරින් ගොඩක් නැති නිසා වැඩි කාර්යභාර්යක් මට තමයි කරන්න සිද්ධ වුණේ" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

මෙයින් පැහැදිලි වන්නේ ප්‍රමාණවත් පරිදි නිලධාරින් නොමැති නිසා එක් නිලධාරියෙකුට අධික වැඩ පැවරුණු බව යි. මානව සම්පත් අඩු වීම නිලධාරින්ගේ පරිපාලන වගකීම් නිසි පරිදි ඉටු කිරීමට බාධා මතු වූ අතර එහි දී නිලධාරින්ට අධික වැඩ පැවරීම, නවීන කාර්යක්ෂම ක්‍රම අනුගමනය කළ නො හැකි වීම, ප්‍රජාව සමඟ සබඳතා පැවැත්වීමට අපහසුවීම ආදි ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වේ. එමඟින් නිලධාරින්ගේ තීරණ ගැනීමේ හැකියාව සීමා වූ බව පැහැදිලි වේ. ව්‍යාපෘති ප්‍රතිලාභ ලැබූ ජනතාව පදනම් කර ගනිමින් සිද්ධි අධ්‍යයනයක් සිදු කළ අතර එහි දී පහලගම වසමේ පදිංචි විජේරත්න රත්නනායක (වයස 60, ගොවියෙක්) මේ ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලබන බව සඳහන් කරමින් ඉදිරිපත් කළ අදහස පහත පරිදි වේ.



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

"පාර සංවර්ධනය කරන්න නිලධාරීන් හිටියේ ටික දෙනයි. ඒ නිසා මේ පාර හදන්න ගොඩක් කල් ගියා. ඒ වුනාට මේ පාර හැදුවාට පස්සේ අපිට ඉතා පහසුවෙන් ගොවිතැන් කටයුතු සඳහා යාමට පහසු වුනා" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

මින් පැහැදිලි වන්නේ ව්‍යාපෘතිය මගින් ප්‍රජාවට ප්‍රතිලාභ හිමි වී තිබෙන බව යි. නමුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මානව සම්පත් අවම වීම හරහා ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ දී නිලධාරීන්ට දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ අතර එම නිසා ඔවුන්ට ව්‍යාපෘතිය අවසන් කිරීමට විශාල කාලයක් ගත වී තිබේ.

ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරීන්ට ගැටලුවලට හා අභියෝගයන්ට මුහුණු නො දී ව්‍යාපෘතිය සාර්ථක ව ක්‍රියාවට නැංවීමට පුහුණුව වැදගත් වේ. මෙහි දී නිලධාරීන්ගේ තාක්ෂණික දැනුම, කළමනාකරණ හැකියාවන්, ප්‍රජා සන්නිවේදනය සහ ආරක්ෂිත වැඩපිළිවෙළ පිළිබඳ පුහුණුවක් තිබීම අත්‍යවශ්‍ය වේ. මේ පිළිබඳ ජනතාව ප්‍රශ්නාවලිය ඔස්සේ දැක්වූ ප්‍රතිචාර පහත පරිදි දැක්විය හැකි ය.


ප්‍රස්තාර අංක 2: නිලධාරීන්ගේ අවම පුහුණුව පිළිබඳ අභියෝගය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව "ඔබ ප්‍රදේශයේ සිදු කළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවූ නිලධාරීන්ට ව්‍යාපෘති සම්බන්ධ ව පුහුණුව තිබූ නිසා ව්‍යාපෘතිය නිශ්චිත කාල සීමාවේ දී අවසන් කිරීමට හැකි විය" යන කල්පිතයට 86%ක් ඍණාත්මක ප්‍රතිචාර දක්වයි. මෙමගින් පැහැදිලි වන්නේ අධ්‍යයන ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නිලධාරීන්ගේ පුහුණුව අවම බව යි. ව්‍යාපෘති ක්‍රියාවට නැංවූ නිලධාරීන්ගේ පුහුණුව අවම බව පැවසීමට හේතු ලෙස ජනතාව විසින් ප්‍රශ්නාවලිය ඔස්සේ ලබා දුන් අදහස් පහත පරිදි දැක්විය හැකි ය.

ප්‍රස්තාර අංක 3: නිලධාරීන්ගේ පුහුණුව අවම බව පැවසීමට ප්‍රජාව දැක්වූ අදහස්





(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ජනතාව දැක්වූ ප්‍රතිචාර මගින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට නිලධාරීන්ගේ පුහුණුව අවම වීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ප්‍රමාද වීම, ප්‍රජාව සමඟ නිලධාරින්ගේ සන්නිවේදනය අවම වීම නිසා ප්‍රජාවගේ සහභාගීත්වය අවම වීම සහ නිලධාරින් සම්බන්ධ විශ්වාසය අවම වීම, නිලධාරින්ගේ කළමනාකරණය දුර්වල නිසා සැලසුම් කළ ව්‍යාපෘති අර්ධ කාලීන වශයෙන් නවතා දැමීමට සිදු වීම, නිලධාරින් නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිත කර නොමැති වීමෙන් ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව අඩු වීම යන අහිතකර බලපෑම් ඇති වු බව පෙන්වා දෙයි. කෙසේ නමුත් මෙලෙස නිලධාරින්ගේ පුහුණුව අවම වීමෙන් විවිධ අභියෝගවලට මුහුණ දීමට නිලධාරින්ට සිදුවන අතර එහි දී ඔවුන්ගේ පරිපාලන හැකියාව සීමාවට ලක් වේ. ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සාර්ථකත්වය සඳහා නිලධාරින්ගේ කාර්ය සාධන වැඩපිළිවෙළ වැදගත් කරුණකි. එහි දී නිලධාරින්ට පැහැදිලි අරමුණ, වගකීම් හා කාර්ය භාර්යයන් ලබා දෙන අතර එහි දී ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය මැනීමට හා අගය කිරීමට කාර්ය සාධන වැඩපිළිවෙළ වැදගත් වේ.

ප්‍රස්තාර අංක 5: නිලධාරින්ගේ කාර්ය සාධන වැඩපිළිවෙළෙහි ඇති වු අභියෝග




(මුලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත රූප සටහනට අනුව "ඔබ සිතන ආකාරයට ඔබ ප්‍රදේශයේ සිදු කළ සංවර්ධන ව්‍යාපෘතියේ සාර්ථකත්වය උදෙසා නිලධාරින්ගේ කාර්ය සාධනය හේතු වී තිබේ" යන කල්පිතයට 88%ක් ඍණාත්මක ප්‍රතිචාර දක්වයි. මෙමගින් පැහැදිලි වන්නේ අධ්‍යයන ප්‍රදේශයේ ක්‍රියාත්මක වු තෝරාගත් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී විවිදි මට්ටමේ නිලධාරීන්ගේ කාර්ය සාධන වැඩ පිළිවෙළ පිළිබඳ ව ප්‍රශ්නාවලිය ඔස්සේ ජනතාවගේ වැඩි ප්‍රතිචාරය වුයේ ඍණාත්මක ප්‍රතිචාරයන් බව යි. ඒ අනුව පැහැදිලි වන්නේ නිලධාරින්ගේ කාර්ය සාධනය තුළ ගැටලු සහගත තත්ත්වයන් ඇති වී තිබෙන බව යි. ජනතාව ප්‍රශ්නාවලිය ඔස්සේ මේ පිළිබඳ මෙලෙස අදහස් දක්වා තිබේ.

"මේ පාර සංවර්ධනය කිරීමේ දී යන්ත්‍ර සූත්‍ර, අත්‍යවශ්‍ය දේවල් අඩු නිසා නිලධාරින්ට තීරණ ගන්න බාධාවන් ඇති වෙන්න ඇති" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025).

ජනතාවගේ මෙම ප්‍රතිචාර මගින් පැහැදිලි වන්නේ අධ්‍යයනය සඳහා තෝරාගත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් පරිදි සම්පත් නොමැති වීම නිසා නිලධාරින්ට ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ දී ගැටලු මතු වී ඇති බව යි. එහි දී ඔවුන්ට ව්‍යාපෘතිය සම්බන්ධ තීරණ ගැනීම සීමා වී තිබේ. ව්‍යාපෘති සම්බන්ධ නිලධාරින් සමඟ පැවැති සම්මුඛ සාකච්ඡා තුළ දී එම ව්‍යාපෘතියට සම්බන්ධ නිලධාරිවරයෙකු මේ සම්බන්ධ ව දැක්වූ අදහස් පහත පරිදි වේ.

"අපි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විට අපේ කාර්යයන් ඉහළ නිලධාරින් විසින් අධීක්ෂණය කරන නිසා අපට ස්වාධීන ව තීරණ ගැනීමට නො හැකි වීමේ ගැටලු සමහර අවස්ථාවල මතු වුණා"(ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025).


නිලධාරින්ගේ මෙම ප්‍රතිචාර මගින් පැහැදිලි වන්නේ තෝරාගත් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ කාර්ය සාධනය තුළ දී දේශපාලන බලපෑම්, ඉහළ නිලධාරින්ගේ සීමාවන්, ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී රාජ්‍ය නීති රීතිවලට අනුව ක්‍රියා කිරීමට සිදු වීම ආදි කරුණු මගින් නිලධාරින්ට ස්වාධීන තීරණ ගැනීමට නො හැකි වීම වැනි ගැටලුවලට මුහුණ දී තිබෙන බව යි. එම කරුණු මගින් පැහැදිලි වන්නේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවූ නිලධාරින්ගේ පරිපාලන හැකියාව හා තීරණ ගැනීමේ බලය සීමා වීම යි.

ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සාර්ථක වීමට නම් භෞතික සම්පතෙහි ප්‍රමාණවත් හා ගුණාත්මක බව අත්‍යවශ්‍ය වේ. මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, යටිතල පහසුකම් සහ දක්ෂ මානව සම්පත් ව්‍යාපෘතියේ දිගුකාලීන සාර්ථකත්වය තීරණය කරයි. නමුත් භෞතික සම්පත් ප්‍රමාණවත් නො වීම, උසස් තත්ත්වයේ භෞතික සම්පත් භාවිත කර


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නොමැති බව අධ්‍යයන ප්‍රදේශය තුළින් පැහැදිලි වේ. එය ප්‍රශ්නාවලිය මගින් ජනතාව දැක්වූ අදහස් ඔස්සේ තහවුරු කළ හැකි ය.

ප්‍රස්තාර අංක 6: භෞතික සම්පත් අභියෝග




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව "ඔබ ප්‍රදේශයේ සිදු කළ සංවර්ධන ව්‍යාපෘතිය උසස් ප්‍රමිතියකින් යුක්ත ව සිදු කර ඇත" යන කල්පිතයට එකඟ වන්නේ 2%කි. ඒ අනුව 88%ක් භෞතික සම්පත් පිළිබඳ සෘණාත්මක ප්‍රතිචාර දක්වයි. භෞතික සම්පත් ප්‍රමාණවත් හා ගුණාත්මක නොවන බව මෙයින් පැහැදිලි වේ. එබැවින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී භෞතික සම්පත් ප්‍රමාණවත් නො වන නිසා ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරින්ට ද ව්‍යාපෘති සිදු කිරීමේ දී අභියෝගවලට මුහුණ දීමට සිදු වූ අතර සාර්ථක ලෙස ව්‍යාපෘති සිදු කිරීමට බාධා ඇති විය. එය ජනතාව විසින් ප්‍රශ්නාවලිය ඔස්සේ ලබා දුන් අදහස් මගින් තවදුරටත් පැහැදිලි වේ.


"මේ පාර හදන කාලේ නිලධාරින් ව්‍යාපෘතියට අවශ්‍ය යන්ත්‍ර උපකරණ අවශ්‍ය පරිදි තිබුනේ නෑ" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රතිචාරවලට අනුව යන්ත්‍ර සූත්‍ර අවම වීම, අමුද්‍රව්‍ය ප්‍රමාණවත් නො වීම, මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නො වීම, කල් පැවැත්ම අඩු වීම හා බාල අමුද්‍රව්‍ය භාවිත කර තිබීම, ස්වාභාවික අපදාවලට ඔරොත්තු දෙන සම්පත් භාවිත කර නො තිබීම, නවීන තාක්ෂණ උපකරණ නොමැති වීම යනාදි භෞතික සම්පත් ප්‍රමාණවත් නො වීම පිළිබඳ ගැටලුවලට මුහුණ දී ඇති බව පැහැදිලි වේ. ව්‍යාපෘති සම්බන්ධ ව නිලධාරින් සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාවක දී නිලධාරිවරයෙකු දැක්වූ අදහස වන්නේ,

"අපට වාහන නොමැති නිසා නිතරම පුද්ගලික වාහන භාවිත කරන්න සිද්ධ වුණා. විශේෂයෙන් වැසි සමයේ ව්‍යාපෘතිය සිදු කරන ස්ථානවලට පවා ගමන් කිරීම ගැටලුවක් වුණා" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත දැක්වූ නිලධාරින්ගේ අදහස් මගින් පැහැදිලි වන්නේ ව්‍යාපෘතිය සිදු කිරීමේ දී ප්‍රාථමික සම්පත් හිඟය, අත්‍යවශ්‍ය උපකරණ ප්‍රමාණවත් නො වීම, ප්‍රවාහන පහසුකම් නොමැති වීම යන ගැටලුවලට විදි මට්ටමේ නිලධාරින් මුහුණ දෙන බවයි. මෙම කරුණු මගින් නිලධාරින්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක් වූ බව පැහැදිලි වේ. ප්‍රශ්නාවලිය ඔස්සේ ජනතාවට ඉදිරිපත් කළ "සීමිත සම්පත් භාවිතයෙන් නිලධාරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ හැකියාව පිළිබඳ ඔබ තෘප්තිමත් වේ" යන කල්පිතයට ඔවුන් දැක්වූ ප්‍රතිචාර පහත පරිදි වේ.

ප්‍රස්තාර අංක 7: සීමිත සම්පත් භාවිතයෙන් නිලධාරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම පිළිබඳ ජනතාවගේ ප්‍රතිචාර






© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

වීදි මට්ටමේ නිලධාරින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ඔවුන්ට තිබූ සීමිත සම්පත් ක්‍රියාවට නැංවීමේ හැකියාව පිළිබඳ ජනතාවගේ ප්‍රතිචාර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඒ පිළිබඳ තෘප්තිමත් බව ප්‍රතිචාර දක්වා ඇත්තේ 34%ක ප්‍රමාණයකි. 66%ක් තෘප්තිමත් නො වන ලෙස ප්‍රතිචාර දක්වා ඇත. මෙයින් පැහැදිලි වන්නේ වැඩි පිරිසක් සීමිත සම්පත් භාවිතයෙන් නිලධාරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම පිළිබඳ තෘප්තිමත් නො වන බවයි. එයට හේතු වුයේ ව්‍යාපෘතියට අවශ්‍ය යන්ත්‍ර උපකරණ අවම නිසා ඉතා මන්දගාමී ව ක්‍රියාවට නැංවීමයි. නිලධාරින් සමග තිබූ සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය වුයේ ප්‍රවාහන පහසුකම් ද අවම බව යි. ඒ තුළින් නිලධාරින්ට ව්‍යාපෘතිය සිදු කරන ස්ථානය නිරන්තරයෙන් නිරීක්ෂණය සඳහා ගමන් කිරීමට ගැටලු මතුවන අතර ම ප්‍රදේශයේ ජනතාව සමග නිරන්තර සම්බන්ධතාව තබා ගැනීම අපහසු විය. ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යවශ්‍යම දෙයක් ලෙස භෞතික සම්පත් පැවැතිය යුතු අතර එලෙස නො වීමෙන් ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරින්ට කාර්යක්ෂම ව ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට ගැටලු මතු වෙයි. මෙහි දී වීදි මට්ටමේ නිලධර න්‍යාය තුළ සඳහන්වන වීදි මට්ටමේ නිලධාරින් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී මුහුණ දෙන අභියෝගවලට මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරින් ද මුහුණ දෙන බව ප්‍රායෝගික ව දැක ගත හැකි ය.

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී මූල්‍ය සම්පත් ඉතා වැදගත් වේ. ග්‍රාමීය සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීමේ දී මූල්‍ය සම්පත් සම්බන්ධ සැලසුමක් හොඳින් සකස් කිරීම අනිවාර්ය වන අතර, එය දිගු කාලීන සාර්ථකභාව සඳහා මූලික පදනමක් ලෙස ක්‍රියා කරයි. නමුත් තෝරාගත් අධ්‍යයන ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරින්ට බලපෑ ප්‍රධාන අභියෝගයක් ලෙස මූල්‍ය සම්පත් අභියෝගය පෙන්වා දිය හැකි ය. එම අභියෝගය වන්නේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නො වීමයි. මේ සම්බන්ධයෙන් ජනතාව ප්‍රශ්නාවලිය ඔස්සේ දැක්වූ ප්‍රතිචාර පහත පරිදි දැක්විය හැකි ය.

ප්‍රස්තාර අංක 8: මූල්‍ය සම්පත් අභියෝගය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව, "ඔබ සිතන්නේ ඔබ ප්‍රදේශයේ සිදු කළ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ දී මුදල් සම්බන්ධයෙන් ගැටලු ඇති වී නොමැති බවයි" යන කල්පිතයට අනුව එකඟ වන්නේ 2%කි. මේ සම්බන්ධයෙන් සෘණාත්මක ප්‍රතිචාර 92%කි. ජනතාවගේ ඉහත ප්‍රතිචාරවලට අනුව තහවුරු වන්නේ සංවර්ධන ව්‍යාපෘතිය සිදු කිරීමේ දී මූල්‍ය ගැටලු ඇති වූ බව යි. මෙයින් පැහැදිලි වන්නේ ව්‍යාපෘති සිදු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණවත් ව නො ලැබීම නිසා ව්‍යාපෘතියේ වැඩ කළ සේවකයින්ට පවා ඔවුන්ගේ මුදල් ලැබීමට ප්‍රමාද වූ අතර ම ව්‍යාපෘතියේ ද වැඩ අවසන් කිරීමට විශාල කාල සීමාවක් ගිය බව ය. එහි දී ව්‍යාපෘතියට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට මුදල් නොමැති වීම, ව්‍යාපෘතියේ වැඩ කරන සේවකයින්ට නිසි පරිදි ගෙවීම කළ නො හැකි වීම ආදි අභියෝගයන්ට ව්‍යාපෘති භාර නිලධාරින්ට මුහුණ දීමට සිදු විය. මෙහි දී ව්‍යාපෘතියට අවශ්‍ය මුදල් ප්‍රමාණවත් ලෙස නො ලැබීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක වීමට ගතවන කාලය දිගු වන අතර, අර්ධ සංවර්ධනයක් තුළ නතර වීමට සිදු විය. මෙලෙස ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට ඇතිවන ප්‍රමාදවීමත් සමග නිලධාරින් සම්බන්ධයෙන් ජනතාවගේ විශ්වාසය අඩු වේ. තව ද මුදල් අවශ්‍ය ප්‍රමාණයට නොමැති වීමෙන් ව්‍යාපෘති කළමනාකරණය කරන නිලධාරින්ට අවශ්‍ය තීරණ ගන්නට නො හැකිවන අතර ම, ඔවුන්ගේ අභිමතානුසාරී බලය සහ පරිපාලන හැකියාව ද සීමා වීම සිදු වේ.


**ආයතනික සහයෝගීතාව**

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ආයතනික සහයෝගීතාව ඉතා වැදගත් ය. මේ තුළින් නියෝජිත නිලධාරින් අතර සබඳතාව හා උසස් නිලධාරින්ගේ සහය පිළිබඳ සාකච්ඡාවට බඳුන් කෙරේ. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේ දී නියෝජිත නිලධාරින් අතර සබඳතාව ව්‍යාපෘති සාර්ථකත්වයට අත්‍යවශ්‍ය තීරණාත්මක සාධකයකි. නිලධාරින් අතර මනා සන්නිවේදනය, වගකීම් බෙදීම,


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රජාව සමග සම්බන්ධතාව සහ එහි දී ප්‍රජාවේ අවශ්‍යතා හඳුනාගෙන ගැටලු අවබෝධ කර ගෙන විසඳුම් ලබා දීමට සහ නායකත්වය වැනි මූලික කරුණු නිසි ලෙස ක්‍රියාවට නැංවීමෙන් ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාව වැඩිවන අතර, ප්‍රජා අවශ්‍යතා පරිදි තිරසාර සංවර්ධනයක් ද ඇති කළ හැකි ය. නමුත් අධ්‍යයන ප්‍රදේශයේ තෝරාගත් ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සම්බන්ධ ව නිලධාරීන් අතර සහයෝගීතාව එතරම් නො තිබුණ බව ප්‍රශ්නාවලිය ඔස්සේ ජනතාව දැක්වූ ප්‍රතිචාර මගින් පැහැදිලි වේ.

ප්‍රස්තාර අංක 9: නියෝජිත නිලධාරීන් අතර සබඳතාමය ගැටලු





(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව "ඔබ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘතිය සිදු කිරීමේ දී නිලධාරීන් අතර මනා සබඳතාවක් තිබු බව ඔබ සිතයි" යන කල්පිතයට 40%ක් දැඩි ලෙස එකග නො වන අතර, 30%ක් එකග නො වේ. මෙහි දී එකග වන්නේ 6%කි. 70%ක් ම මේ සම්බන්ධයෙන් සෘණාත්මක ප්‍රතිචාර දක්වා තිබේ. නිලධාරීන් අතර සබඳතාමය ගැටලු තිබූ බව මෙයින් පැහැදිලි වේ. ජනතාව ප්‍රශ්නාවලිය ඔස්සේ දැක්වූ ප්‍රතිචාර මත ඒ බව තවදුරටත් තහවුරු වේ. නිලධාරීන් සම්බන්ධ ව පැවැති සාකච්ඡා තුළ දී ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීමේ දී ඔවුන් අතර සබඳතාවය අඩු වීමට හේතු විමසූ විට දැක්වූ අදහස් පහත පරිදි වේ.

"ව්‍යාපෘති සම්බන්ධ ව කටයුතු සිදු කිරීමේ දී සිටියේ නිලධාරීන් අවම ප්‍රමාණයක්. ඒ නිසා ව්‍යාපෘතිය සම්බන්ධ වැඩ රාශියක් පැවරීම නිසා සමහර අවස්ථාවල දී සන්නිවේදනය අඩු වුන අවස්ථා තිබුණා" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

නිලධාරීන් සමග පැවැති සම්මුඛ සාකච්ඡා තුළින් පැහැදිලි වන්නේ ව්‍යාපෘතිය වැඩ කටයුතු සම්බන්ධ ව ඔවුන් අතර සන්නිවේදනය, සහයෝගීතාව නැති වීමට හේතු ලෙස ව්‍යාපෘතියේ නිලධාරීන් සංඛ්‍යාව අවම වීමත් සමග ව්‍යාපෘතියේ වැඩ කරන නිලධාරීන්ට ව්‍යාපෘති සම්බන්ධ වැඩ රාජකාරි රාශියක් සිදු කිරීමට සිදුවීමත් හේතු වූ බව යි. මෙලෙස නිලධාරීන් අතර සන්නිවේදන අඩු වීම සම්බන්ධ ව සහ එයින් ඇති වූ බලපෑම පිළිබඳ ව ජනතාව ප්‍රශ්නාවලිය ඔස්සේ දැක්වූ අදහස් පහත පරිදි වේ.

ප්‍රස්තාර අංක 10: නිලධාරීන් අතර සබඳතාවයක් නොමැති වීමෙන් ඇති වූ බලපෑම්





© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)


මේ ආකාරයට ජනතාව විසින් ප්‍රශ්නාවලිය ඔස්සේ දැක්වූ නිලධාරින් අතර සබඳතාව අවම වීම මගින් ඇති වූ අහිතකර ප්‍රතිඵල ඉහත ප්‍රස්තාරය මගින් පැහැදිලි වේ. නිලධාරින් අතර සබඳතාව අවම වීම හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම් ලෙස ව්‍යාපෘතිය ගුණාත්මක බවෙන් අඩු වීම, නිලධාරින් සම්බන්ධ ව ජනතාවගේ විශ්වාසය අඩු වීම, නැවත පාරේ නඩත්තු කටයුතු සිදු කිරීමට සිදු වීම, ජනතාව විසින් නිලධාරින් විවේචනයට ලක් කිරීම ආදී අහිතකර බලපෑම් පෙන්වා දිය හැකි ය. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති සම්බන්ධ නිලධාරිවරයෙකු සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාවක දී ලබාගත් අදහස් පහත පරිදි වේ.

"මේ ව්‍යාපෘතිය සිදු කිරීමේ දී මුල්‍ය අරමුදල් නියමිත කාලයට නො ලැබුණ නිසා ව්‍යාපෘති කළමනාකරණ නිලධාරින් අතර සන්නිවේදනය ප්‍රමාද වූ අවස්ථා ද තිබුණා. එයින් ව්‍යාපෘති නිම කිරීම නිශ්චිත දවසට සිදු කිරීමට නො හැකි වුණා" (නියැදි සමීක්ෂණය,2025)

මෙයින් පැහැදිලි වන්නේ නිලධාරින් අතර සබඳතාව අවම නිසා ව්‍යාපෘතිය නිම කිරීමට අනවශ්‍ය ප්‍රමාදයක් ඇති වූ බව යි. සමස්තයක් වශයෙන් ඉහත සඳහන් නිලධාරින්ගේ ප්‍රතිචාර මගින් පැහැදිලි වන්නේ ව්‍යාපෘතියට සම්බන්ධ නිලධාරින් සංඛ්‍යාව අවම වීම තුළින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරින්ට වැඩ රාශියක් කිරීමට සිදුවන අතර ඒ තුළින් නියෝජිත නිලධාරින් අතර සන්නිවේදනය අවම වීම මගින් තොරතුරු හුවමාරුවේ ප්‍රමාදය ඇති වූ අතර එහි දී ව්‍යාපෘති සම්බන්ධ ව තීරණ ගැනීමේ දී නිලධාරින් ගැටලුවලට මුහුණ දුන් බව යි.

උසස් නිලධාරින් ලෙස සැලකෙන්නේ වීදි මට්ටමේ නිලධාරින්ට උපදෙස්, මඟපෙන්වීම් සිදු කරන ප්‍රධානීන් ය. විශේෂයෙන් ම ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක දී උසස් නිලධාරින් ලබා දිය යුතු සහයෝගීතාව විවිධ මානයන්ගෙන් දැකගත හැකි ය. එනම් පරිපාලන මඟපෙන්වීම, තාක්ෂණික උපදෙස්, ප්‍රතිපත්ති සහ නීතිමය නිර්දේශ, ආයතනික සන්නිවේදන පහසුකම් සලසාදීම සහ නිලධාරින්ට මූලික ගැටලු විසඳාදීම වැනි කරුණු ය. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමේ දී උසස් නිලධාරින්ගේ සහයෝගීතාව පහළ මට්ටමේ නිලධාරින්ගේ කාර්ය සාධනය සඳහා අත්‍යවශ්‍ය වේ. එය ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා පමණක් නොව ජනතා විශ්වාසය, රාජ්‍ය සේවයේ විනිවිදභාව සහ ව්‍යාපෘතිය පසුකාලීන ව පවත්වාගෙන යාමේ හැකියාව සඳහා ද මූලික තැනක් ගනී. තෝරාගත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී මේ පිළිබඳ ප්‍රශ්නාවලිය ඔස්සේ ජනතාව දැක්වූ අදහස් පහත පරිදි වේ.

ප්‍රස්තාර අංක 11ː නිලධාරින්ට උසස් නිලධාරින්ගෙන් ලැබුණු සහාය පිළිබඳ ජනතාවගේ ප්‍රතිචාර




(මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත රූප සටහනට අනුව "ඔබ ප්‍රදේශයේ සිදු කළ ව්‍යාපෘතිය සම්බන්ධ ව නිලධාරින්ට උසස් නිලධාරින්ගෙන් අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ලබා දී ඇති බව ඔබ සිතයි" යන කල්පිතයට 20%ක් දැඩි ලෙස එකඟ නොවන අතර 30%ක් එකඟ නොවේ. 6%ක් එකඟ වන අතර 4%ක් දැඩි ලෙස එකඟ වේ. මේ සම්බන්ධයෙන් 40%ක ප්‍රමාණයක් මධ්‍යස්ථ වේ. එයට හේතු ලෙස මේ සම්බන්ධයෙන් ඔවුන්ට අවබෝධයක් නොමැති වීම හේතු විය හැකි ය. උසස් නිලධාරින්ගෙන් ලැබුණු සහයෝගය ව්‍යාපෘති සම්බන්ධ නිලධාරින් සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාව තුළින් විමසූ අතර ඒ පිළිබඳ ඔවුන් දැක්වූ අදහස මෙලෙස ය.

"ගොඩක් වේලාවට අපි තීරණ ගන්නේ ඉහළ නිලධාරින්ගෙන් විමසලා. ඒත් ඒ ප්‍රතිචාර ලැබෙන්න ප්‍රමාද වීම් සිදු වෙනවා" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

නිලධාරින්ගේ ප්‍රතිචාර මගින් පැහැදිලි වන්නේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ඇති වන ගැටලු සහ අනෙකුත් ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉහළ නිලධාරින්ට වාර්තා කළ ද ඒ සම්බන්ධ ප්‍රතිචාර ලැබීමට ප්‍රමාද වන බව යි. එහි දී නිලධාරින් ව්‍යාපෘතිය සම්බන්ධ තීරණ ගැනීමේ දී අපහසුතාවකට ලක්වන බව පැහැදිලි වේ. උසස් නිලධාරින්ගේ සහයෝගයක්



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පැවැතීම තුළින් පහළ නිලධාරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඔවුන් තුළ විශ්වාසය ඇති කරයි. උසස් නිලධාරින් ව්‍යාපෘතියට විවෘත ව සහභාගී වීම, සාකච්ජා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම, ව්‍යාපෘති ක්‍රියාදාම පිළිබඳ මාර්ගෝපදේශ සපයන ආකාරය පහළ නිලධාරින්ගේ කාර්ය සාධනයට වටිනාකමක් එක් කරන අතර ප්‍රජාව වෙත යන සේවාවේ ගුණාත්මකභාව ද ඉහළ නංවයි. නමුත් නිලධාරින් ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තා, ව්‍යාපෘති සම්බන්ධ ව ඇතිවන ගැටලු ඉහළ නිලධාරින්ට නිරන්තරයෙන් වාර්තා කරන අතර එහි දී ඉහළ නිලධාරින්ගේ ප්‍රතිචාර ලැබීම ප්‍රමාද වීම් සිදු වන බව පැහැදිලි වේ. මේ තුළින් සිදු වන්නේ ව්‍යාපෘතිය කාර්යක්ෂම ව ක්‍රියාවට නැංවීමට නිලධාරින්ට බාධා ඇති වූ බවයි. එම නිසා ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් නිලධාරින්ගේ තීරණ ගැනීමේ හැකියාව ද සීමා වූ බව පැහැදිලි වේ.

**ප්‍රජා සහභාගීත්වය**

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ප්‍රජා සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. මෙහි දී ග්‍රාමීය ජනතාවට සංවර්ධන ව්‍යාපෘති සඳහා ජාති, කුල, ආගම්, ස්ත්‍රී, පුරුෂ ආදි කිසිදු භේදයක් නොමැතිව සහභාගී වීමට අවස්ථාව හිමි විය යුතු ය. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක ප්‍රධානතම අරමුණක් වන්නේ ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම වන අතර එහි දී ප්‍රජා සහභාගීත්වය අත්‍යවශ්‍ය කරුණක් වන අතර එය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති මගින් ඵලදායි කාර්යක්ෂම ප්‍රතිඵල ලබා ගැනීමට හේතු වේ. නමුත් අධ්‍යයන ප්‍රදේශය තුළ ජනතාව සහභාගීත්වය අවම වීම නිසා ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරින් අභියෝගවලට මුහුණ දෙයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රදේශයේ ජනතාවගේ සහභාගීත්වය අවම බව ප්‍රශ්නාවලිය ඔස්සේ ජනතාව දැක්වූ අදහස් මගින් තහවුරු වේ. අධ්‍යයන නියැදිය තුළ දී ව්‍යාපෘතියට ජනතා සහභාගීත්වය 36%ක් ලෙසින් හඳුනා ගනු ලැබූ අතර 64%ක් සහභාගී වී නොමැති බව අනාවරණය විය. නමුත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් නිලධාරින්ට සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය අත්‍යවශ්‍ය පදනමක් ලෙස සැලකේ. ජනතා සැබෑ අවශ්‍යතා අනුව ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ඔවුන්ගේ සෘජු සම්බන්ධතාව ව්‍යාපෘතියේ තිරසාරත්වය සහ ප්‍රබල ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මහත් වශයෙන් උපකාරී වේ. ප්‍රජා සහභාගීත්වය අඩු නම් බාහිර පාර්ශ්වයන්ගේ පාලනයට නතු වීමට හේතු වේ. මෙහි දී ඉහත ප්‍රස්තාරයට අනුව සුළු පිරිසක් ව්‍යාපෘතිවලට සහභාගී වී ඇති අතර ඔවුන් ව්‍යාපෘතියට සහභාගි වූ ආකාරය විවිධ මට්ටම් තුළින් දැකගත හැකි ය. ජනතාව ව්‍යාපෘතියට සහභාගි වූ ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.


රූප සටහන 1: ප්‍රජාව ව්‍යාපෘතියට සහභාගි වූ ආකාරය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රස්තාර අංක 13: ප්‍රජාව ව්‍යාපෘතියට සහභාගි වූ ආකාරය




(මුලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

මේ අනුව "අවශ්‍යතා හඳුනා ගැනීමේ සාකච්ජාවල දී සහභාගී වීම" යන අවස්ථාව ලෙස හඳුන්වන්නේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිලධාරින් ජනතාව හමුවීම්වල දී ජනතාව ඔවුන්ගේ ගමනාගමන ගැටලු, ව්‍යාපාරික හා කෘෂිකාර්මික ආදි කටයුතු සඳහා මාර්ග ප්‍රවේශය සඳහා ඇති අවශ්‍යතාවය අවධාරණය කිරීම යි. ඒ අනුව ජනතාවට ඉදිරිපත් කළ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය තුළ දී මේ සඳහා ප්‍රතිචාර දක්වා ඇති පුද්ගලයින් 07දෙනෙකු හඳුනා ගන්නා ලදි. "ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අදහස් දැක්වීම" යන අවස්ථාව තුළ දී මාර්ගය ඉදිකිරීම් පිළිබඳ ව තම අදහස් යෝජනා ඉදිරිපත් කිරීම සිදු වේ. ජනතාවට ඉදිරිපත් කළ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය තුළ දී මේ සඳහා ප්‍රතිචාර දක්වා ඇති පුද්ගලයින් 03දෙනෙකු හඳුනා ගන්නා ලදි. " ශ්‍රමදාන අවස්ථාවල දී සහ තමන්ගේ දේපොළ ලබා දීම" යන අවස්ථාව ලෙස හඳුන්වන්නේ සැලසුම් සම්පූර්ණ වූ පසු, මාර්ගය ඉදි කරන ස්ථානයේ පිරිසිදු කිරීම සහ ඇතැම් අවස්ථාවන්හි දී ජනතාව පෞද්ගලික තමාගේ භූමි දේපළක් පවා නොමිලේ ලබා දීමට එකඟ වීම යි. ජනතාවට ඉදිරිපත් කළ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය තුළ දී මේ සඳහා ප්‍රතිචාර දක්වා ඇති පුද්ගලයින් 06දෙනෙකු දැකගත හැකි ය. " ඉදිකිරීම් නිරීක්ෂණ සහ ප්‍රතිපෝෂණ ලබා දීම" යන අවස්ථාව තුළ දී මාර්ගය ඉදිවන අතරතුර එය නිරීක්ෂණය කර දුෂ්කරතා හා දෝෂ පිළිබඳ නිලධාරින්ට දැනුම් දීමත්, යෝජනා ඉදිරිපත් කිරීමත් සිදු කෙරේ. මේ සම්බන්ධයෙන් ජනතාවට ඉදිරිපත් කළ ප්‍රශ්නාවලිය මගින් දෙදෙනෙකු ප්‍රතිචාර දක්වා තිබේ. මේ ආකාරයට ප්‍රජාව ව්‍යාපෘතියට සහභාගි වූ ආකාරය හඳුනා ගත හැකි ය.

ඉහත දැක්වූ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රජාව සහභාගීවීමේ ප්‍රතිශතය පිළිබඳ දත්ත සටහනට අනුව 64%ක් පමණ පුද්ගලයන් සංඛ්‍යාවක් ව්‍යාපෘති සඳහා සහභාගි වී නොමැති බව පැහැදිලි වේ. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය භාර නිලධාරිවරයා සමඟ පැවැති සම්මුඛ සාකච්ජාව තුළ දී ඔහුගේ අදහස වුයේ,

"අපි ව්‍යාපෘතිය සම්බන්ධ ව ප්‍රදේශයේ ග්‍රාමීය සමිති නායකයින් හරහා තමයි ජනතාව දැනුවත් කිරීම් කරන්නේ. ඔවුන් හා ජනතාව අතර විශ්වාසය අඩු වීම ජනතාව මේ ව්‍යාපෘතිවලට සහභාගීවීම අවම වීමට හේතුවක් වෙන්න පුළුවන්" (නියැදි සමීක්ෂණය, 2025)


ඉහත දැක්වූ ප්‍රතිචාර මගින් පැහැදිලි වන්නේ ග්‍රාමීය සංවර්ධනය තුළ ප්‍රජා සහභාගීත්වය අවම වීම නිලධාරීන් මුහුණු දුන් අභියෝගයක් බව යි. ග්‍රාමීය ව්‍යාපෘති සංවර්ධනයක් යනුවෙන් හඳුන්වන්නේ ප්‍රජාමුලික සැලසුම් ක්‍රියාවලියකි. පහළ සිට ඉහළට යන ප්‍රවේශය තුළ සඳහන් වන්නේ ප්‍රජාවේ අවශ්‍යතා, අදහස් සහ සහාය මත පදනම් ව ව්‍යාපෘති සැලසුම් කළ යුතු බව යි. එහි දී ප්‍රජාව ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී ඍජුව ම සම්බන්ධ විය යුතු වේ. නමුත් එම ප්‍රවේශය තුළ සඳහන් එම කරුණු අධ්‍යයන ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති තුළ ප්‍රායෝගික ව දැකගත නො හැකි විය. ප්‍රජාවේ අදහස්, අවශ්‍යතා හා සහයෝගය නොමැති වීම නිසා, ඔවුන්ට නිවැරදි තීරණ ගැනීමට සහ ව්‍යාපෘති කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීමට බාධා ඇති වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරින්ට නිවැරදි තීරණ ගැනීමේ හැකියාවට ප්‍රජා සහාය බෙහෙවින් බලපායි. නමුත් ජනතාව ව්‍යාපෘති සම්බන්ධව උනන්දුවක් නො දැක්වීම හා ජනතාවගේ සහයෝගය නිලධාරින්ට නො ලැබෙන නිසා නිලධාරින්ට තම පරිපාලන තීරණ ක්‍රියාවට නැංවීමට නො හැකි වීමෙන් ඔවුන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක් වූ බව පැහැදිලි වේ.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**ජනතා දැනුවත්භාවය**

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුන්වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ පාරිසරික වශයෙන් සමගාමී සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන බහු අංශගත වැඩසටහන් එකට ගෙන ඒමකි. එවැනි ව්‍යාපෘතියක් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා ජනතා දැනුවත්භාවය ඉතාමත් වැදගත් කාරකයක් වේ. ජනතා දැනුවත්භාවය යනුවෙන් හඳුන්වන්නේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රජාවට තිබෙන අවබෝධය, දැනුම හා ක්‍රියාශීලි සම්බන්ධතාව යි. එහි දී එහි අරමුණ සහ ප්‍රතිඵල පිළිබඳ අවබෝධයක්, ක්‍රියාන්විතය පිළිබඳ නිවැරදි දැනුමක්, ව්‍යාපෘතියට සහභාගී විය හැකි ආකාරය පිළිබඳ පැහැදිලිත්වයක් යනාදි කරුණු පිළිබඳ දැනුවත් විය යුතු ය. මේ ආකාරයට ප්‍රජාව ව්‍යාපෘතිය පිළිබඳ නිවැරදි ව දැන සිටීම අත්‍යවශ්‍ය සාධයක් වේ. ව්‍යාපෘතිය පිළිබඳ ව ජනතාව දැනුවත් වීම ව්‍යාපෘති සැලසුම්කරුවන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ ප්‍රජාව අතර විශ්වාසය සහ සබඳතාවක් ගොඩනඟන මාර්ගයකි. එම නිසා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක දී ජනතාවගේ දැනුවත්භාවය මූලික පදනමකි. මේ අනුව අධ්‍යයනය සඳහා තෝරාගත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල ජනතාවගේ දැනුවත්භාවය පිළිබඳ ප්‍රශ්නාවලිය ඔස්සේ දැක්වූ ප්‍රතිචාර මෙලෙස දැක්විය හැකි ය.


ප්‍රස්තාර අංක 14: ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රජාවගේ දැනුවත්භාවය ප්‍රතිශතය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව පැහැදිලි වන්නේ ව්‍යාපෘතියට ජනතා දැනුවත්භාවය තුළ දී 38%ක් දැනුවත් වූ අතර 62%ක් දැනුවත් වී නොමැති බව යි. එහි දී ජනතාවගෙන් වැඩි සංඛ්‍යාවක් ව්‍යාපෘති පිළිබඳ දැනුවත් වී නොමැති බව මෙයින් තහවුරු වේ. නමුත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාවට නංවන නිලධාරීන්ට ව්‍යාපෘතිය සාර්ථක ව ක්‍රියාවට නැංවීමට බලපාන ප්‍රධාන සාධකයක් ලෙස ජනතාවගේ දැනුවත්භාවය පැවතීම පෙන්වා දිය හැකි ය. ඒ තුළින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ජනතාවගේ විරෝධතාවක් නොමැති ව එය කළ හැකිවන අතර ඇතිවන ගැටලුවල දී ජනතා අදහස් ද විමසා ක්‍රියාවට නැංවීමට හැකියාව ලැබේ. නමුත් මෙහි දී ඉහත ප්‍රස්තාරයට අනුව පැහැදිලි වන්නේ ව්‍යාපෘති පිළිබඳ ප්‍රදේශයේ ජනතාව දැනුවත් වී ඇත්තේ පුද්ගලයන් සුළු ප්‍රමාණයක් බව යි. මෙලෙස ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් වූ පුද්ගලයන් ඒ පිළිබඳ දැනුවත් වූ ආකාරය ප්‍රශ්නාවලිය ඔස්සේ හඳුනාගත හැක්කේ මෙසේ ය.

රූප සටහන 2: ප්‍රජාව ව්‍යාපෘති පිළිබඳ දැනුවත් වූ ආකාරය






© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ප්‍රස්තාර අංක 15: ප්‍රජාව ව්‍යාපෘති පිළිබඳ දැනුවත් වූ ආකාරය




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

මේ අනුව "ගම් සභා ප්‍රජා සාකච්ඡා පැවැත්වීම " මගින් ජනතාව ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් වූ බව ප්‍රශ්නාවලිය මගින් හඳුනාගත හැකිවිය. ග්‍රාමීය ජනතාව එකතු කරමින් ග්‍රාමීය සමිති සිදු කරන අතර මෙම ඒකරාශි කිරීම තුළ ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබේ. මේ අනුව මෙම ජනතාවට ඉදිරිපත් කළ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලිය තුළ දී මේ සඳහා ප්‍රතිචාර දක්වා ඇති පුද්ගලයින් 08දෙනෙකු හඳුනා ගන්නා ලදි. ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් වූ පුද්ගලයන් ඒ සඳහා දැනුවත් වූ තවත් ආකාරයක් ලෙස "ග්‍රාම නිලධාරිවරයා හරහා දැනුවත් වීම" සිදු වූ බව ඉහත ප්‍රස්තාරය මගින් පැහැදිලි වේ. මෙහි දී ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයා හරහා ව්‍යාපෘති සම්බන්ධ දැනුවත් කිරීම් සිදු කර ඇති බව තහවුරු වේ. ප්‍රශ්නාවලිය ඔස්සේ මේ සඳහා ප්‍රතිචාර දැක්වූ පුද්ගලයන් 05දෙනෙකු හඳුනාගත හැකි ය. "ප්‍රාදේශීය පාලන නිලධාරීන්ගේ දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා දැනුවත් වීම" හරහා ද ව්‍යාපෘතිය පිළිබඳ ජනතාව දැනුවත් වූ බව පැහැදිලි වේ. මෙකී ප්‍රාදේශීය පාලන නිලධාරීන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඇති බව ජනතාව දැක්වූ ප්‍රතිචාර මගින් පැහැදිලි විය. නමුත් මේ සඳහා ප්‍රතිචාර දක්වා ඇත්තේ පුද්ගලයන් 04දෙනෙකු පමණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් වූ තවත් ආකාරයක් ලෙස "ප්‍රචාරණ මාධ්‍යයෙන් දැනුවත් වීම" සිදු වූ බව ඉහත රූප සටහන මගින් පැහැදිලි වේ. ජනතාවට ඉදිරිපත් කළ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි ඔස්සේ මේ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා ඇත්තේ පුද්ගලයන් දෙදෙනෙකු බව පැහැදිලි වේ. මේ ආකාරයට මෙම කරුණු මගින් ව්‍යාපෘති සම්බන්ධ ව ප්‍රජාව දැනුවත් වූ ආකාරය හඳුනා ගත හැකි ය.

ඉහත දැක්වූ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් වූ ආකාරය පිළිබඳ දැක්වූ ප්‍රතිශතය පිළිබඳ දත්ත සටහනට අනුව 62%ක් පමණ පුද්ගලයන් සංඛ්‍යාවක් ව්‍යාපෘති පිළිබඳ දැනුවත් වී නොමැති බව පැහැදිලි වේ. සිද්ධි අධ්‍යයන තුළින් ග්‍රාමීය සමිතිවල සහභාගීත්වය සම්බන්ධයෙන් නන්දන පුෂ්පකුමාර (වයස 50, වෙළෙන්දෙක්) දැක්වූයේ මෙවැනි අදහසකි.

"මං රැකියාවක් කරන නිසා සමහර වේලාවට ගමේ සංවර්ධන කටයුතුවලට හා ග්‍රාමීය සමිතිවලට යන්න බැරි වෙනවා" (නියැදි සමීක්ෂණය, 2025)

මේ අනුව පැහැදිලි වන්නේ මෙම ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ජනතාවගේ දැනුවත්භාවය අවම මට්ටමක පවතින බව යි. මෙලෙස ව්‍යාපෘති සම්බන්ධ ජනතාව දැනුවත්භාවය අවම වීම නිසා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී නිලධාරීන් අභියෝගවලට මුහුණ දෙයි. ප්‍රජාවේ අත්‍යවශ්‍ය සහාය ලබා ගැනීමට නොහැකි වන හෙයින් එහි දී නිලධාරීන්ගේ පරිපාලන හැකියාව සීමා වේ. එමෙන්ම ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රදේශයේ ජනතාවගේ සහාය අත්‍යවශ්‍ය වන නමුත් මෙහි දී ව්‍යාපෘති පිළිබඳ ජනතාගේ දැනුවත්භාවය නොමැති වීමෙන් නිලධාරීන්ට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට හා ක්‍රියාවට නැංවීමට අපහසු වේ. තව ද ව්‍යාපෘතිය සම්බන්ධ ව ජනතා දැනුවත්වීම අවම වීම නිසා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ප්‍රදේශයේ ජනතාවගෙන් ඇතැම් අවස්ථාවල දී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මතභේදයන් ඇති විය හැකි ය. මෙය නිලධාරීන්ට වැඩි පීඩනයක් ඇති කරන අතර, ව්‍යාපෘති ක්‍රියාවලිය ප්‍රමාද වීමට ද බලපායි. මෙයින් පැහැදිලි වන්නේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාවගේ දැනුවත්භාවය අවම වීම හේතුවෙන් නිලධාරීන්ට ව්‍යාපෘතිය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමට ගැටලු මතුවීමෙන් ඔවුන්ගේ අභිමතානුසාරී බලය සීමාවට ලක්වන අතර පරිපාලන හැකියාව ද සීමා වන බව යි.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


**වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක්වීම සඳහා බලපාන අභියෝග සඳහා විසඳුම් ක්‍රියාමාර්ග**

ඒ අනුව වීදි මට්ටමේ නිලධාරීන්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක්වීම සඳහා බලපාන ලද අභියෝග සඳහා විසඳුම් ක්‍රියාමාර්ග පහත සාකච්ඡා කර ඇත.

**සම්පත් ලබා ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම**

මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය සම්පත්හි ඇතිවන අභියෝග මඟහරවා ගැනීමට විවිධ යෝජනා ඉදිරිපත් විය. ප්‍රශ්නාවලිය ඔස්සේ ජනතාව ඉදිරිපත් කළ යෝජනා කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

ප්‍රස්තාර අංක 16: සම්පත් ලබා ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීමට ජනතාව දැක්වූ ප්‍රතිචාර




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)


ඉහත සඳහන් ප්‍රස්තාරයට අනුව ප්‍රජාවගේ ප්‍රතිචාරවලින් පැහැදිලි වන්නේ ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය සම්පත් ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කළ යුතු බව යි. එහි දී මූලික වශයෙන් මානව සම්පත්, භෞතික සම්පත් හා මූල්‍ය සම්පත් පිළිබඳ සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය කරුණක් වන අතර එහි දී නිලධාරීන්ට ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රමාණවත් හා ගුණාත්මක අමුද්‍රව්‍ය ලබා දීම, ව්‍යාපෘති සම්බන්ධ ව පුහුණු වැඩමුළු සංවිධානය කිරීම, ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳ නිසි අධ්‍යාපනය ලබා දීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව තීරණ ගැනීමට නිදහස ලබා දීම ආදි කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමෙන් නිලධාරීන් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී මුහුණ දෙන පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවීම් වැනි ගැටලු මඟ හරවා ගැනීමට හැකියාව ලැබේ.

**නිලධාරීන්ගේ පුහුණුව හා කාර්ය සාධන වැඩපිළිවෙළ සංවර්ධනය කිරීම**

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේ දී ව්‍යාපෘති සාර්ථකත්වයට මෙන් ම ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරීන්ට බාධාවකින් තොර ව ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට නිලධාරීන්ගේ පුහුණුව හා කාර්යසාධන වැඩපිළිවෙළ පැවතිය යුතු ය. නිලධාරීන්ට නව හැකියාවන් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් පිළිබඳ පුහුණුව ලබා දීම මගින් ඔවුන්ගේ කාර්යසාධනය වැඩිදියුණු කළ හැකි ය. නිලධාරීන්ගේ පුහුණුව හා කාර්යසාධන වැඩපිළිවෙළ සංවර්ධනය කිරීමට ප්‍රදේශයේ ජනතාව දැක්වූ යෝජනා පහත පරිදි වේ.

ප්‍රස්ථාර අංක 17: නිලධාරීන්ගේ පුහුණුව හා කාර්යසාධනය සංවර්ධනය කිරීමට ජනතතාගේ ප්‍රතිචාර


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය





(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරයට අනුව ජනතාවගේ යෝජනා මගින් පැහැදිලි වන්නේ නිලධාරීන්ගේ මනා පුහුණුව ව්‍යාපෘතියක් සාර්ථක ව ක්‍රියාවට නැංවීමට මෙන් ම නිලධාරීන්ට ගැටලුවකින් තොර ව ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට උපකාරී වන බව යි. නිලධාරීන්ට ව්‍යාපෘතිය සම්බන්ධ ව මනා දැනුමක් පුහුණුවක් පැවතීම තුළින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ඇතිවන ගැටලුවලට නිසි විසඳුම් ක්‍රියාත්මක කරමින්, තාක්ෂණික දැනුම උපයෝගී කරගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි ය. මෙහි දී නිලධාරීන්ට තාක්ෂණික පුහුණුව ලබා දීම තුළින් ව්‍යාපෘති කළමනාකරණය හා සන්නිවේදනය වඩාත් පහසු වේ. එහි දී තාක්ෂණික ක්‍රම භාවිතය වැඩි වීමෙන් කාර්යසාධනය වඩාත් වේගයෙන් හා කාර්යක්ෂම ව කර ගැනීමට හැකියාව ලැබේ. මනා පුහුණුවකින් යුතු නිලධාරීන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාවලිය නියමිත කාලය තුළ ක්‍රියාත්මක කළ හැකි වේ. එමෙන්ම නිපුණතා සහ දැනුම ඇති නිලධාරීන් සිටීම මගින් ව්‍යාපෘතිවල ඇති වන ගැටලු අවම කර ගුණාත්මකභාවය තහවුරු කළ හැකි ය. එම නිසා නිලධාරීන්ගේ පුහුණුව හා කාර්යසාධනය සංවර්ධනය කිරීමට ඉහත දක්වා ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් නිලධාරීන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පෙර මුහුණ දුන් ගැටලු මඟහරවා ගත හැකි ය.

**ආයතනික සහයෝගීතාව වර්ධනය කිරීම**

ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථකත්වය සඳහා මෙන්ම නිලධාරීන්ට පහසුවෙන් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ආයතනික සහයෝගීතාව ඉතා වැදගත් වේ. ආයතනික සහයෝගීතාව තුළ පවතින ගැටලු නිරාකරණය කර ගැනීමට ජනතාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

ප්‍රස්තාර අංක 18: ආයතනික සහයෝගීතාව තුළ ඇති ගැටලු නිරාකරණය කිරීම සම්බන්ධ ව ජනතාව දැක්වූ අදහස්




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මේ ආකාරයට ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ආයතනික සහයෝගීතාව වැදගත් වුව ද එහි දී ගැටලු මතුවන අවස්ථා දැක ගත හැකි අතර ඉහත ප්‍රස්තාරයේ දක්වා ඇති ජනතාවගේ යෝජනා මගින් එම ගැටලු නිරාකරණය කර ගැනිමට හැකියාව ලැබේ. මේ සම්බන්ධයෙන් නිලධාරින් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවේ දී නියෝජිත නිලධාරින් අතර සහයෝගීතාව වර්ධනය කර ගැනීමට ඔවුන් දැක්වූ යෝජනා පහත පරිදි වේ.


"ව්‍යාපෘතිය සම්බන්ධ සියලු අංශ නියෝජනය කරන නිලධාරින් සතියකට වරක් රැස් වී තොරතුරු හුවමාරු කර ගැනීම කළ යුතු ය" (ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

මෙහි දී පැහැදිලි වන්නේ ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී එය ක්‍රියාත්මක කරන නිලධාරින් නිශ්චිත සැලසුමකට අනුව එම ව්‍යාපෘතිය සිදු කළ යුතු බව යි. එහි දී නිලධාරින් අතර සන්නිවේදනය දුර්වල වීම හා සහයෝගීතාව අවම වීම මගින් ව්‍යාපෘති කිරීමේ දී අසාර්ථක වන අතර ම නිලධාරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ගැටලුවලට මුහුණ දෙනු ලබයි. එම නිසා ව්‍යාපෘතියක් සිදු කිරීමේ දී නිලධාරින් අතර සන්නිවේදනය ශක්තිමත් කිරීම සිදු කළ යුතු වීම අත්‍යවශ්‍ය කරුණක් වේ. මෙහි දී ප්‍රාදේශීය ග්‍රාමීය සමිති නායකයින් හා ව්‍යාපෘති ක්‍රියාවට නංවන ආයතනවල නිලධාරින් අතර ව්‍යාපෘති සම්බන්ධ ව මනා සන්නිවේදයකින් එය සිදු විය යුතු අතර ඒ තුළින් නිලධාරින් මුහුණ දෙන ගැටලු අවම කරගත හැකි ය.

### ජනතා සහභාගීත්වය වර්ධනය

ප්‍රශ්නාවලිය ඇසුරින් ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීමට ප්‍රතිචාරකයින් ඉදිරිපත් කළ යෝජනා පහත පරිදි වේ.

ප්‍රස්ථාර අංක 19: ජනතා සහභාගීත්වය වර්ධනය කිරීමට ජනතාවගේ ප්‍රතිචාර




(මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, 2025)

ඉහත ප්‍රස්තාරය තුළින් ජනතාව විසින් ඉදිරිපත් කළ යෝජනාවලට අනුව පැහැදිලි වන්නේ ග්‍රාමීය ප්‍රජාව වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති සිදු කරන අතර එහි දී ප්‍රජාව ද සම්බන්ධ කර යුතු බව යි. මේ සම්බන්ධ ජනතාවගේ යෝජනා ලෙස ව්‍යාපෘතියක් සිදු කිරීමේ දී ජනතාවගේ අදහස් ලබා ගැනීම, ව්‍යාපෘතිය සැලසුම්කරණය, අයවැය සම්බන්ධ ව ජනතාව සම්බන්ධ කර ගැනීම, ජනතාව හා නිලධාරින් අතර සාකච්ඡා ගොඩනැගීමට වැඩපිළිවෙළක් සැකසීම, ව්‍යාපෘති සම්බන්ධ තීරණ ගන්නා විට දී ජනතාව සම්බන්ධ කර ගැනීම, ජනතාවගේ විශ්වාසය දිනා ගැනීම සඳහා විවෘත කළමනාකරණ ක්‍රම භාවිත කිරීම තුළින් ප්‍රජා සහභාගීත්වය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබෙන බව දක්වා ඇත.

### නිගමනය

මෙම අධ්‍යයනය මගින් බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක වූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති දෙකක් පදනම් කර ගනිමින් එම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලධාරින්ගේ පරිපාලන හැකියාව හා අභිමතානුසාරී බලය සීමාවට ලක්වීම සඳහා බලපා ඇති ගැටලු සහ අභියෝග හඳුනා ගන්නා ලදි. එහි දී සිදු කරන ලද සොයා ගැනීම් අනුව විමසා බැලීමේ දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී වීදි මට්ටමේ නිලබලකරුවන් මුහුණ දෙන අභියෝග ලෙස සම්පත් සීමිත වීම, ආයතනික සහයෝගීතාව තුළ ඇතිවන අභියෝග, ප්‍රජා සහභාගීත්වය අවම වීම ආදී අභියෝග හඳුනාගෙන ඇත. සම්පත් ලබා ගැනීමේ හැකියාව සම්බන්ධ ඇති වූ අභියෝග ලෙස මානව සම්පත්, භෞතික සම්පත්, මූල්‍ය සම්පත් සම්බන්ධ අභියෝග හඳුනාගෙන තිබේ. එහිදි නිලධාරින්ගේ පුරප්පාඩු නිසා ව්‍යාපෘතියේ කාර්යයන් බෙදා ගැනීමට ප්‍රමාණවත් පරිදි නිලධාරින් නො සිටි බැවින් ව්‍යාපෘතිය සිදු කිරීමේ දී සැලසුම් කිරීම, නඩත්තු කිරීම ආදිය සිදු කිරීමේ දී නිලධාරින් ගැටලුවලට මුහුණ දීමට සිදු විය. තව ද ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, අත්‍යවශ්‍ය උපකරණ යන භෞතික සම්පත් අවමවීමෙන්


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිලධාරින් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ දී සහ තීරණ ගැනීමේ දී අපහසුතාවලට ලක් වී තිබේ. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රමාණයට මුදල් නොමැති වීමෙන් ව්‍යාපෘති ක්‍රියාවට නංවන නිලධාරින්ට අවශ්‍ය තීරණ ගැනීමට මෙන් ම ව්‍යාපෘතියේ වැඩ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නො හැකි වන අතර එහි දී ඔවුන්ගේ අභිමතානුසාරී හැකියාව සීමාවට ලක්වීම සිදුවන බව හඳුනා ගන්නා ලදි. ආයතනික සහයෝගීතාව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමේ දී අත්‍යවශ්‍ය සාධකයක් වේ. ආයතනික සහයෝගීතාව තුළ නියෝජිත නිලධාරින් අතර සබඳතාව හා සන්නිවේදනය, ව්‍යාපෘති ක්‍රියාත්මක කරන නිලධාරින්ට උසස් නිලධාරින්ගෙන් සහයෝගය ලැබීම අත්‍යවශ්‍ය කරුණක් වේ. එහි දී නියෝජිත නිලධාරින් අතර සබඳතාව අවමවීමෙන් නිලධාරින් අතර සන්නිවේදනය අවම වීම, එහි දී ඇතැම් අවස්ථාවල දී ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු නිවැරදි ලෙස සන්නිවේදන නො වීම, තොරතුරු හුවමාරු කිරීමේ ප්‍රමාදවීම් ඇතිවීම මගින් ව්‍යාපෘති සම්බන්ධ තීරණ ගැනීමේ දී නිලධාරින් ගැටලුවලට මුහුණ දෙන ලදි. ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය ජනතාව මූලික කරගෙන ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කරලීමට කටයුතු කරන නමුත් එහි දී ජනතාව එම ව්‍යාපෘතිවලට සහභාගීත්වය අවම වීමෙන් ඔවුන්ගේ අවශ්‍යතා දැන ගැනීමට නිලධාරින්ට නො හැකි වේ. එහි දී ද නිලධාරින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ දී ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී, තීරණ ගැනීමේ දී ගැටලුවලට මුහුණ දෙන අතර ඒ තුළින් ද නිලධාරින්ට පරිපාලන හැකියාව සහ අභිමතානුසාරී බලය සීමාවීම සිදු වන බව නිගමනය කර තිබේ. මෙලෙස වීදි මට්ටමේ නිලධාරින් මුහුණ දෙන අභියෝග මඟහරවා ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට ප්‍රමාණවත් පරිදි සම්පත් ලබා දීම, නිලධාරින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආයතනික සහයෝගීතාව වර්ධනය කිරීම, ප්‍රජා සහභාගීත්වය වැඩි දියුණු කිරීම යන යෝජනාවන් හඳුනාගෙන ඇත.

## පරිශ්‍රීලිත මූලාශ්‍රය


ඉන්ද්‍රජිත් එස්. (2000). 21 වන සියවස ශ්‍රී ලංකාව හා සංවර්ධනය. සෙවන් ග්‍රැෆෝස් ප්‍රකාශනය.

කුලසූරිය එම්. (2003). ග්‍රාමීය සංවර්ධනය සඳහා පරිපාලනය. කතෘ ප්‍රකාශන.

පුංචිහේවා පී. ජී. (1979). ගම සහ විපරිනාමය, ග්‍රාම සංවර්ධනය පිළිබඳ අදහස්. මාර්ග ආයතන ප්‍රකාශන.

සරත්චන්ද්‍ර උ. (2021). ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය. සරසවි ප්‍රකාශන.

වික්‍රමසිංහ බී. (2003). ග්‍රාම සංවර්ධනය සැලසුම්කරණය. නෙරාඩි ප්‍රකාශන.

Andrews, M., Pritchett, L., & Woolcock, M. (2017). Building state capability: Evidence, analysis, action. Oxford University Press.
Bardach, E., & Kagan, R. A. (1982). Going by the book: The problem of regulatory unreasonableness. Temple University Press.

Chambers, R. (1997). Whose reality counts? Putting the first last. Intermediate Technology Publications.

Evans, R. H. (1996). An analysis of criterion variable reliability in conjoint analysis. Perceptual and Motor Skills, 84(3), 988–990. https://doi.org/10.2466/pms.1996.82.3.988

Fernando, D. (2024). Assessing the effectiveness of citizen engagement mechanisms in Sri Lanka's local governance. International Journal of Novel Research and Development (IJNRD).

Food and Agriculture Organization of the United Nations. (1978). The state of food and agricultu re, 1978. FAO. Retrieved from https://openknowledge.fao.org/handle/20.500.14283/ap658e.

Grindle, M. (1997). Getting good government: Capacity building in the public sectors of developing countries. Harvard University Press.

Herath, P. (2017). Public service delivery and bureaucratic discretion in Sri Lanka. Asian Journal of Comparative Politics, 3(2), 107–118. https://doi.org/10.1177/2057891117715820.

Hulme, D., & Shepherd, A. (2003). Conceptualizing chronic poverty. World Development, 31(3), 403–423.

Hupe, P. (2014). What happens on the ground: Persistent issues in implementation research. Public Policy and Administration, 29(2), 164–182. https://doi.org/10.1177/0952076713518339

Hupe, P., & Hill, M. (2007). Street-level bureaucracy and public accountability. Public Administration, 85(2), 279–299. https://doi.org/10.1111/j.1467-9299.2007.00650.x

Jayasundara, R. (2016). Local governance and service delivery in Sri Lanka. Institute of Policy Studies.



© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Lipsky, M. (1980). Street-level bureaucracy: Dilemmas of the individual in public services. Russell Sage Foundation.

Maynard-Moody, S., & Musheno, M. (2003). Cops, teachers, counselors: Stories from the front lines of public service. University of Michigan Press.

Mayuri Kularathne. (2023). Shaping the disposition of street–level bureaucrats in the implementation of social welfare policy. Retrieved from http://www.hss.ruh.ac.lk/JSSHR/Articles/Vol9Iss4/Paper_1/Vol9Iss4P1.pdf

Meerasahibu, A., & Thaharadeen, F. (2015). The role of bureaucracy in building rural development: A study of Addalachenai Divisional Secretariat, Sri Lanka. Retrieved from https://www.researchgate.net/publication/28741368_The_Role_of_Bureaucracy_in_Building_Rural_Development_A_Study_of_Addalaichenai_Divisional_Secretariat_Sri_Lanka

Ministry of Health, Sri Lanka. (2021–2030). National nutrition policy of Sri Lanka. Nutrition Division.

Ministry of Local Government & Provincial Councils. (2009). National policy on local government. PreventionWeb.

National Nutrition Secretariat. (n.d.). Multi-Sector Action Plan for Nutrition 2018–2025. Government of Sri Lanka. Retrieved September 7, 2025, from https://suncsasrilanka.lk/wp-content/uploads/2024/03/MSAPN-ENG-FN.pdf

Nicholas, P., & Tendai, M. Nzuma. (2024). The implementation of agroforestry in Namibia: street–level bureaucracy perspective. Retrieved from https://www.sciencedirect.com/science/article/pii/S1389934124001539

Novia, K. (2017). Street – Level bureaucracy: Bureaucratic reform strategies initiated from bottom level Retrived from https://www.researchgate.net/publication/321353797 _Street Level Bureaucracy Bureaucratic_Refrom_Strategies_Initiated_from _Bottom_ Level

Peter, H., & Miche, H. (2007). Street level bureaucracy and public accountability. Retrieved from https://research.brighton.ac.uk/en/publications/street-level-bureaucracy-and-public-accountability
Project Management Institute (PMI). (2021). PMBOK® guide – Seventh edition (Public FAQs). Project Management Institute.

Silva, K. T. (2015). Decentralization and development in Sri Lanka: Issues and challenges. University of Peradeniya.

Singh, R. P. (Ed.). (1986). Energy in food processing. Elsevier.Sri Lanka Institute of Development Administration. (2025). SLIDA Research Symposium 2024/2025. SLIDA. Retrieved September 7, 2025, from https://www.slida.lk/research

United Nations Development Programme (UNDP). (2009). Capacity development: A UNDP primer. UNDP.

Uyangoda, J. (2010). Politics of reform and local governance in Sri Lanka. Social Scientists' Association.

World Bank. (1980). World development report 1980: Poverty and human development (Vol.1) Oxford University Press. Retrieved from https://openknowledge.worldbank.org/handle/10986/5963

World Health Organization (WHO). (2019). Approaches to establishing country-level multisectoral coordination mechanisms for the prevention and control of noncommunicable diseases. World Health Organization.

World Health Organization (WHO). (2025). Evaluation of the WHO Global Coordination Mechanism on NCDs (A78/INF/2). World Health Organization.


© 2025 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
# පහළොස්වන කලාපය - 2025 දෙසැම්බර්


ආනාපානසති භාවනා ක්‍රමවේදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 1-5
**වෙලම්පැලේ රතනසාර හිමි**

පශ්චාත් කොවිඩ් 19 සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝගඃ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් 6-21
**කේ. එච්. පී. ටී. දිල්ශානි සහ ප්‍රදීප් උළුවඩුගේ**

අනුරාධපුර රාජ්‍ය අවධියේ මෙරට ආර්ථිකය හා බැඳි නෛතික විධිවිධාන සහ ඒවායේ තිරසාර භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 22-29
**ආර්. කේ. එම්. ට්‍රිලීෂියා ඉන්ද්‍රාණි**

බුත්සරණේ වාක්‍ය විචාරාත්මක ලක්ෂණ 30-38
**නිල්මිණි දයානන්ද**

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයෙහි වීදි මට්ටමේ නිලබලකරුවන්ගේ පරිපාලන ශක්‍යතාව හා අභිමතානුසාරී බලය : බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් 39-59
**ජේ. එම්. මධුෂානි සහ ජී. සී. එල්. පතිරණ**



ISSN 1800-1459
eISSN 2673-1177